// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශේෂ

**අංක 2126/20 - 2019 ජූනි මස 04 වැනි අඟහරුවාදා - 2019.06.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස : පළාත් සභා

## පළාත් සභා නිවේදන

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

වත්තල මාබෝල නගර සභාව

**1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වගන්තිය සමඟ කියවිය යුතු නගර සභා ආඥා පනතේ 154 වන වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි**

255 අධිකාරය වන නගර සභා ආඥා පනතේ 157 වගන්තිය සමග කියවිය යුතු 153 වන වගන්තිය යටතේ වත්තල මාබෝල නගර සභාව විසින් සාධන ලද, මෙහි පහත උපලේඛනයෙහි විස්තර කරනු ලබන අතුරු ව්‍යවස්ථා, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු නගර සභා ආඥා පනතේ 154 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කරන්නට යෙදුණු බව මෙයින් නිවේදනය කරමි.

**ඉසුර දේවප්‍රිය,**
ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා,
නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන,
ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු,
ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක පිළිබඳ අමාත්‍ය,
(බස්නාහිර පළාත)

2019 අප්‍රේල් මස 18 වැනි දින,
අංක 204,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල,
පළාත් සභා ගොඩනැගිල්ලේ දී ය.



මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# අතුරු ව්‍යවස්ථා

# වත්තල මාබෝල නගර සභාව

## වත්තල මාබෝල නගර සභාවේ ආහාර නිෂ්පාදනය හා බෙදාහරින ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. මෙම අතුරු ව්‍යවස්ථාව වත්තල මාබෝල නගර සභා බල ප්‍රදේශය තුළ ආහාර නිෂ්පාදනය කර බෙදාහරින ස්ථාන විධිමත් කිරීම හා අධීක්ෂණය කිරීම පාලනය කිරීම සඳහා ද ඊට ගාස්තුවක් නියම කර පනවනු ලැබේ.

2. මෙම අතුරුව්‍යවස්ථාව වත්තල මාබෝල නගර සභාවේ ආහාර නිෂ්පාදනය හා බෙදාහරින ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

3. සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තකු විසින් (මෙහි මින්මතු බල ප්‍රදේශය යනුවෙන් හඳුන්වනු) වත්තල මාබෝල නගර සභා ප්‍රදේශය තුළ (මෙහි මින්මතු ඇතැම් තැනක පරිශ්‍රය යනුවෙන් හඳුන්වන) ආහාර නිෂ්පාදනය කර බෙදාහරින ස්ථානයක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

4. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනෙන් අවසන් විය යුතු ය.

5. මෙම අතුරු ව්‍යවස්ථාවේ පහත සඳහන් කොන්දේසි ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස සභාපතිවරයා විසින් කවර හෝ ආහාර නිෂ්පාදනය කර බෙදාහරින ස්ථානයකට බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

(i) පරිශ්‍රය සඳහා වන සියලු ස්ථිර ඉදිකිරීම් ඊට අදාළ ලිඛිත නීතියකට අනුව අනුමත කර ඇති සැළැස්මකට අනුකූලව ඉදිකර තිබිය යුතු ය.

(ii) පරිශ්‍රය මනා අළුත්වැඩියා තත්ත්වයකින් පවත්වාගෙන තිබිය යුතු ය.

(iii) පරිශ්‍රයේ සෑම කාමරයකම බිත්ති මීටර් 2.5කට නොඅඩු උසකින් යුක්ත විය යුතු අතර, එකී බිත්ති ස්ථිර ලෙස තනා තිබිය යුතු අතර, දෙපැත්තම කපරාරු කර තීන්ත ආලේප කර තිබිය යුතු ය.

(iv) පරිශ්‍රයෙහි අභ්‍යන්තරයේ සෑම කාමරයකම සීලිමක් බැගින් සවිකර තිබිය යුතු අතර, එකී සීලිම පෙළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.5කට නොඅඩු උසකින් තිබිය යුතු ය.

(v) පරිශ්‍රයෙහි සෑම කාමරයකටම විවෘත කළ හැකි ජනේල සවිකර තිබිය යුතු අතර, ඒ එක් එක් කාමරයේ ජනේල විවෘත කළ විට ඒ ජනේලවල කවුළුවල වර්ගඵලය ඒ කාමරයේ බිම වර්ගඵලයෙන් පහළවෙන් එකකට නොඅඩු විය යුතු ය.එසේ වුවද කිසියම් කාමරයක් වායු සමනය කර ඇති අවස්ථාවකදී මෙකී විධිවිධාන එලෙසින්ම අදාළ නොවිය හැක.

(vi) පරිශ්‍රයෙහි ඉදිකිරීම් යටතේ වහලය කිසියම් ස්ථිර ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු ය.

(vii) පරිශ්‍රයෙහි ගොඩනැගිලිවල බිම සිමෙන්ති දමා කපරාරු කර සිමෙන්තියෙන් මැද හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.

(viii) පරිශ්‍රය තුළ ජනනය වන කසළ රැස්කිරීම සඳහා කසළ භාජන තබා තිබිය යුතු අතර, එකී කසළ භාජන මැස්සන් හෝ වෙනත් කෘමි සතුන්ට ඇතුල්විය නොහැකි වන ආකාරයෙන් වසා තැබිය හැකි පියන් සහිත විය යුතු ය.

(xi) පරිශ්‍රය තුළ ජනනය වන කසළ අපහරණය කිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ මතු දන්වන නියමයන් ක්‍රියා කළහැකි ආකාරයට අවශ්‍ය විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

(x) පරිශ්‍රය තුළ පාවිච්චි කරන ගෘහ උපකරණ මනා නිමවුමක් සහිත විය යුතු අතර, මේස හා පුටු ආදිය ලීයෙන් හෝ ලෝහයෙන් තනා ඔප දමා හෝ මේස වීදුරු තහඩුවක් යොදා තිබිය යුතු ය.

(xi) පාවිච්චියට ගනු ලැබූ භාජන සේදීම සඳහා වෙනම කොටසක් ස්ථානයේ පවත්වාගෙන යා යුතු ය.

(xii) ගණුදෙනුකරුවන්ගේ සහ සේවකයන්ගේ පාවිච්චිය සඳහා ප්‍රමාණවත් වනසේ ස්ත්‍රී හා පුරුෂ දෙපක්ෂයට වෙන් වෙන් වශයෙන් වැසිකිළි හා කැසිකිළි තනා තිබිය යුතු ය.

(xiii) පරිශ්‍රයේ කවර හෝ කොටසක පාවිච්චියෙන් පසු බැහැර කරන අප ජලය අවහිරයකින් තොරව ගලායාමට සුදුසු කාණු පද්ධතියක් ඇති කර තිබිය යුතු ය. කිසි විටකත් කාණු පොදු ප්‍රවේශයකට මුදා නොහැරිය යුතු ය.

(ix) පරිශ්‍රයෙහි ප්‍රමාණවත් ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු ය.

6. බලපත්‍රලත් ස්ථානය අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් ඇමදීම කළ යුතු අතර, අප ජලය බැස යන කාණු අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් පිරිසිදු කර ජලයෙන් සෝදා හැරීම කළ යුතු ය.

7. පරිශ්‍රය තුළ සුරතලය සඳහා බල්ලන් හෝ පූසන් වැනි සතුන් ඇති නොකළ යුතු ය.

8. පරිශ්‍රයෙහි ඇති වැසිකිළි සහ කැසිකිළි අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් පිරිසිදු කර විෂබීජ නාශක යෙදීම කළ යුතු අතර, දුර්ගන්ධනය වාහනය වීමෙන් තොරව පවත්වාගත යුතු ය.

9. පරිශ්‍රයෙහි ආහාර රඳවනයන් හා ආහාර ඇල්ලීම සඳහා නිශ්චිත මෙවලම් පාවිච්චි කළ යුතු අතර, ඒ සියල්ල මනා ලෙස පිරිසිදු කර තබා ගත යුතු ය.

10. (අ) පරිශ්‍රය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය,

i ජෛවභායන අපද්‍රව්‍ය
ii. වීදුරු
iii. කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත අපද්‍රව්‍ය
iv. පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය
v. යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය යකඩ හා වෙනත් ලෝහ කොටස් වශයෙන් වෙන් වෙන්ව එක් රැස් කළ යුතුය.

පරිශ්‍රය තුළ ඉහත උපවගන්තියෙහි වූ ක්‍රමවේදයන් යටතේ එක් රැස්වන කසල බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන කසළ කළමනාකරණ වැඩ සටහනකට අනුකූලව අවසන් බැහැර කිරීම සඳහා කටයුතු කළ යුතුය.

11. පරිශ්‍රය තුළ,

(අ) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තකුට මෑතක දී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාලසීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ පරිශ්‍රයෙහි කවර හෝ කාර්යයක නියුක්ත විට යම් තැනැත්තකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

(ආ) පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තකු විසින් භෝජනාගාරයෙහි කවර හෝ ආකාරයක කාර්යයක නියුත්ක වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

(ඇ) බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කර වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

12. බලපත්‍රලත් ස්ථානයේ ආහාර පාන පිළියෙළ කිරීමේ නියුක්ත සෑම සේවකයෙකු සඳහාම වෙන වෙන ම පිළිවැසුම් සපයා තිබීමත්, එකී සේවකයන් කාර්යයෙහි නියුක්ත වන සෑම අවස්ථාවකම එකී පිළිවැසුම් පැළඳ සිටින බවට සහතික වීමත්, බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

13. සභාපතිවරයා හෝ සභාපතිවරයාගේ බලයලත් නිලධාරියෙකු විසින් පරිශ්‍රයෙහි පිළියෙල කරන හෝ විකිණීමට තබා ඇති යම් කෑම වර්ගයකින් සාම්පලයක්, එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතුවාක් හැර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී මිල ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතුය.

14. සභාපතිවරයා හෝ සභාපතිවරයා තත් කාලය සඳහා බලය දෙනු ලැබූ නිලධරයකු පරිශ්‍රයට ඇතුළු වී එය පරීක්ෂා කිරීම නීත්‍යානුකූල වන අතර, එම ස්ථානයට ඇතුළු වී එය පරීක්ෂා කිරීමට බලපත්‍රධාරියා හෝ එය භාරව සිටින තැනැත්තා හෝ ඉඩ දිය යුතු අතර, හැකි සියලු සහය ලබා දිය යුතුය.

15. මෙම අතුරුව්‍යවස්ථාව යටතේ වන විධිවිධාන උල්ලංඝනය වන පරිදි පරිශ්‍රය පවත්වාගෙන යාමේදී හා එකී උල්ලංඝනය පිළිබඳ සභාපතිවරයා විසින් දැනුම්දීමක් කරනු ලැබූවිටකදී, එම දැනුම්දීම යටතේ නිවැරදි වීම සඳහා ලබා දී ඇති කාල සීමාව තුළ නිවැරදි නොවුනු අවස්ථාවක දී නිකුත් කර ඇති බලපත්‍රය සභාපතිවරයා අවලංගු කිරීම නීත්‍යානුකූල වන්නේය.

16. මේ අතුරු ව්‍යවස්ථාවේ කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඬය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව

හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවාකරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, නගර සභා ආඥා පනතේ 153 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතුය.

17. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවෙහි,

"සභාව"යන්නෙන් වත්තල නගර සභාව අදහස් වේ.
"සභාපති" යන්නෙන් වත්තල නගර සභාවේ සභාපතිවරයා අදහස් වේ.
"නගර සභා බල ප්‍රදේශය"යන්නෙන් නගර සභාව සංස්ථාපනය කරන ලද බල ප්‍රදේශය අදහස් වේ.

18. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨය ප්‍රමුඛ වේ.

## වත්තල මාබෝල නගර සභාවේ ඇලුමිනියම් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන ආයතනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. මෙම අතුරු ව්‍යවස්ථාව වත්තල මාබෝල නගර සභා බල ප්‍රදේශය තුළ ඇලුමිනියම් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන ආයතනය පවත්වාගෙන යාම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම හා ගාස්තු අය කිරීම සඳහා විධිවිධාන සලසනු පිණිස පනවනු ලැබේ.

2. මෙම අතුරුව්‍යවස්ථාව වත්තල මාබෝල නගර සභාවේ ඇලුමිනියම් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන ආයතනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

3. සභාවේ සභාපතිවරයා විසින් තත්කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් මත හැර, කිසිම තැනැත්තකු විසින් (මෙහි මින්මතු බල ප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලබන) වත්තල මාබෝල නගර සභා බල ප්‍රදේශය තුළ, ඇලුමිනියම් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන ආයතනය පවත්වාගෙන යාම නොකළ යුතු ය.

4. කලින් අවලංගු නොකළහොත් මිස එවැනි සෑම බලපත්‍රයක්ම එය නිකුත් කරන ලද්දේ යම් වර්ෂයක් සඳහාද එම වර්ෂයේ දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා බල පැවැත්විය යුතුය.

5. (i) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවට අනුකූල වූ සභාවෙන් ලබාගත් ඉල්ලුම්පත්‍රයක් යටතේ ඒ සඳහා ඉල්ලුම් කළ යුතු ය.

(ii) මෙම වගන්තිය යටතේ ඉල්ලුම් පත්‍රයක් සඳහා වන ගාස්තු සභාව විසින් කලින් කළ තීරණය කර ප්‍රකාශයට පත් කරන ගාස්තු විය යුතු ය.

6. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා අයකරනු ලබන ගාස්තු සභාව විසින් කලින් කළ යෝජනා සම්මුතියක් මඟින් තීරණය කර ප්‍රකාශයට පත්කරනු ලබන ගාස්තු විය යුතු ය.

7. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ කාර්යය සඳහා වන පරිශ්‍රයෙහි එම කාර්යය සඳහා භාවිතයට ගනු ලබන යම් ස්ථිර ගොඩනැගිල්ලක් වේ නම් එය සභාපති විසින් අනුමත සැළැස්මකට අනුකූලව ඉදි කරන ලද ගොඩනැගිලි විය යුතු අතරම, එම පරිශ්‍රය පහත සඳහන් කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස, එහි කිසිදු තැනැත්තෙකු මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලබාගැනීමට හිමිකමක් නොමැත්තේය.

(i) පරිශ්‍රය හොඳ ප්‍රතිසංස්කරණ තත්ත්වයකින් සහ මනා වාතාශ්‍රයක් හා ආලෝකයක් ලැබෙන පරිදි සකස් කර තිබිය යුතු අතර, සෑම කාමරයක් විවෘත කළවිට ගෙබිමේ ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට නොඅඩු ප්‍රමාණයේ ජනෙල් සවිකර තිබිය යුතුය.

(ii) සෑම කාමරයකම බිත්තිවල සෑම කොටසක උස මීටර් 2.14 ට නොඅඩු විය යුතු අතර, ගඩොල්, කළුගල්, කබොක් හෝ සිමෙන්ති ගල් වලින් සාදා තිබිය යුතුය. බිත්තිවල ඇතුල් පැති අවම වශයෙන් ගෙබිමේ සිට මීටර් 2 ක් උසට සිමෙන්ති බදාම යොදා කපරාදු කොට තිබිය යුතු අතර, ඉතිරි කොටස හුණු බදාම යොදා කපරාදු කොට වර්ණ ආලේප කර තිබිය යුතුය.

(iii) සෑම පියසි කෙළවරකම ගෙබිමේ සිට මීටර් 2 ට වැඩි උසකින් තිබිය යුතුය.

(iv) වහලය යම් ස්ථිර ද්‍රව්‍යයකින් සාදා තිබිය යුතුය.

(v) දැව කර්මාන්ත සියල්ල තීන්ත අලේප කර තිබිය යුතු ය.

(vi) සම්පූර්ණ ගෙබිම ස්ථිර ද්‍රව්‍යකින් තනවා තිබිය යුතුය.

(vii) පරිශ්‍රය ප්‍රමාණවත් ජලවහනයක් සිදුවන පරිදි ඉදිකර තිබිය යුතුය.

(viii) පරිශ්‍රයෙහි සනීපාරක්ෂක කසළ භාජන සහ ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතුය.

(ix) ප්‍රමාණවත් ගිනි ආරක්ෂණ පහසුකම් සපයා තිබිය යුතු ය.

(x) වාහන නවතා තැබීම සඳහා ප්‍රමාණවත් පහසුකම් තිබිය යුතු ය.

(xi) ප්‍රථමාධාර සඳහා පහසුකම් සපයා තිබිය යුතු ය.

(xii) හදිසි අනතුරු ලේඛනයක් පවත්වාගත යුතු ය.

8. මෙම අතුරුව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් බලපත්‍රධාරියෙකු විසින්ම,

(i) පරිශ්‍රයෙහි එක්රැස්වන අපද්‍රව්‍ය නිසි පරිදි බැහැර කරන තෙක් සංවෘත බහාලුම් යටතේ පීඩාවන් ඇති නොවන පරිදි පවත්වාගත යුතුය.

(ii) පරිශ්‍රයෙහි කර්මාන්තයට අදාළ වන ද්‍රව්‍ය අන්තරායකාරී හෝ හානිකර ස්වභාවයකින් තොරව පවත්වාගත යුතු ය.

(iii) බලපත්‍රලත් පරිශ්‍ර තුල ජනනය වන සියළුම අපද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස,

(අ) ජෛවභායන අපද්‍රව්‍ය
(ආ) වීදුරු
(ආ) කඩදාසි
(ඇ) පොලිතීන් හෝ ප්ලාස්ටික්
(ඉ) යකඩ හෝ වෙනත් ලෝහ
(ඊ) අන්තරායකර අපද්‍රව්‍ය

වශයෙන් වර්ගීකරණය කර වෙන් වෙන්වූ භාජන යටතේ පවත්වාගත යුතු ය.

(iv) ආයතනයෙහි සේවයට යොදවා ඇති සේවකයින් සම්බන්ධයෙන් මුඛ වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා දී තිබිය යුතු අතර, එය සේවයෙහි නියතු අවස්ථාවන්හි පැළඳ සිටිය යුතු ය.

(v) සේවයේ නියතු සියළුම සේවකයින් සම්බන්ධයෙන් සෞඛ්‍ය ආරක්ෂණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු ය.

(vi) පරිශ්‍රයෙන් බැහැර කරන අපද්‍රව්‍ය සභාව විසින් ක්‍රියාත්මක කරන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනට අනුකූලව බැහැර කළ යුතු ය.

(vii) නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදා ගැනෙන උපකරණ නිසි නඩත්තුවකින් යුතු ව ආරක්ෂිතව පවත්වාගත යුතු ය.

(viii) සෑම මාස හයකටම වරක් පරිශ්‍රයෙහි ගිනි ආරක්ෂණ පියවර පිළිබඳ පිළිගත හැකි ආයතනයකින් යෝජනා වාර්තා ලබා ගත යුතු ය.

9. සෑම බලපත්‍රධාරියෙකුම කර්මාන්තය කරගෙන යාම සඳහා අවශ්‍යවන සියළු ද්‍රව්‍ය හා අවශ්‍ය අනෙකුත් දෑ දුගඳ හැමීම හෝ වෙනත් පීඩාවක් ඇතිවීම වැළැක්වෙන පරිදි ගබඩාකර තැබිය යුතුය.

10. සෑම බලපත්‍රධාරියෙකුම, යම්කිසි නිෂ්පාදන ක්‍රියාවලියකදී විමෝචනය වන පීඩාකාරී ශබ්ද, වාෂ්ප හෝ වායු, ඒවා විහිදී යාමේදී හානිකර හෝ පීඩාකාරී ප්‍රතිඵල හට ගැනීමට ඉඩ නොලැබෙන ආකාරයකින් හා උසකින් වායුගෝලයට මුදා හැරීම කළ යුතුය. නැතහොත් ගින්දර හෝ සනීකරණ උපකරණයක් තුළින් පිටවීමට සැළැස්විය යුතුය.

11. සෑම බලපත්‍රධාරියෙකුම, තම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ප්‍රමාණවත් කාණු තනවා මැනවින් නඩත්තු කළ යුතු අතර, ඒවා දිනපතා සේදීම කළ යුතුය.

12. සෑම බලපත්‍රධාරියෙකුම, තම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ගෙබිම, යම් අපාරගම්‍ය ද්‍රව්‍යයකින් ඉදිකරවිය යුතු අතර, හොඳ ප්‍රතිසංස්කරණ තත්ත්වයෙන් නඩත්තු කිරීමත්, දිනපතා ශුද්ධ පවිත්‍ර කිරීමත් කළ යුතුය.

13. සෑම බලපත්‍රධාරියෙකුම, ව්‍යාපාර කරගෙන යනු ලබන කාලයේදී, වාර්ෂිකව එම පරිශ්‍රයේ වර්ණ ආලේප කළ යුතුය.

14. සෑම බලපත්‍රධාරියෙකුම, ව්‍යාපාරික කටයුතුවලදී භාවිතා කරනු ලබන උපකරණ හා භාජන ඇතුළු සියළු ආම්පන්න පිරිසිදු කර තබා ගත යුතුය.

15. සෑම බලධාරියෙකුම, ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි කසළ, අතුගා එකතු කරනු ලබන බොල්, රොඩු සමඟ අපතේ ගිය ද්‍රව්‍ය හා අතුරු නිෂ්පාදන, ඒවා තවදුරටත් ව්‍යාපාර කටයුතු වලට වහාම නොයොදවන්නේ නම්, ආවරණය කරන ලද භාජනවල බහා සභාපති විසින් නියම කරන ආකාරයට බැහැර කළ යුතු ය.

16. සෑම බලපත්‍රධාරියෙකුම, වෙනත් ද්‍රව්‍යයක් සේදීම හෝ පෙඟවීම සඳහා භාවිතා කරනු ලබන ටැංකි, දුගඳ හැමීම වැළැක්වීම සඳහා අවශ්‍ය වන පරිදි හිස්කර පවිත්‍ර කළ යුතුය.

17. සෑම බලපත්‍රධාරියෙකුම, යම් ගංඟාවක්, දිය පාරක්, ඇළක්, සොරොව්වක්, ළිඳක්, වැවක් හෝ යම් කාණුවක් යම් අපවිත්‍ර, දුගඳ හමන හෝ පීඩාකාරී ජලය හෝ වෙනත් දියරයක් යැවීමෙන් හෝ ඒ තුළට ගලායාමට සැලැස්වීමෙන් හෝ පීඩාකාරී ද්‍රව්‍යයක් සේදීමෙන් හෝ වෙනත් ආකාරයකින් හෝ එවැනි ගංඟාවක්, දිය පාරක්, ඇළක්, සොරොව්වක්, ළිඳක්, වැවක්, හෝ විවෘත ජල ප්‍රදේශයක් කවර හෝ බැහැර කිරීම් යටතේ අපවිත්‍ර කිරීම නොකළ යුතුය.

18. සභාපතිවරයා විසින් හෝ තත්කාර්ය සඳහා ඔහු විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය පවරන ලද නගර සභාවේ යම් නිලධාරියෙකු විසින් අතුරුව්‍යවස්ථාවට අදාළ පරිශ්‍රය අතුරුව්‍යවස්ථාවට අනුකූල ද යන්න පිළිබඳව පරිශ්‍රයට ඇතුළු වී පරීක්ෂාකර බැලීම නීත්‍යානුකූල වන්නේය. තවද බලපත්‍රලාභියා හෝ එහි පාලනය භාර තැනැත්තා එවැනි පරීක්ෂණයක් කිරීම සඳහා ඉඩදිය යුතු වන්නේය.

19. බලපත්‍රලත් පරිශ්‍රයක්, මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් විධිවිධාන වලට අනුකූල නොවන බව පරීක්ෂණයකදී අනාවරණය වූ අවස්ථාවක, යථෝක්ත පරිශ්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූල කරවීම සඳහා කළයුතු කාර්යයන්, නියමිත කාලයක් ඇතුළතදී ඉටුකරන ලෙස, බලපත්‍රධාරියාට ලිඛිතව දැන්වීමට සභාපතිවරයාට බලය ඇත්තේය. තවද, යථෝක්ත දැන්වීමේ විධිවිධාන ප්‍රකාර බලපත්‍රධාරියා විසින් ක්‍රියා කළ යුතුය. එසේ ක්‍රියා නොකරන්නේ නම්, එවැනි අවස්ථාවක බලපත්‍රය අවලංගු කිරීමට සභාපතිවරයාට බලය ඇත්තේය.

20. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් ලබාගැනීම පිණිස යම් තැනැත්තෙකු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයක් තමා වෙත ලැබී දින 30 ක් ඇතුළත, පරිශ්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවලට අනුකූල වන්නේ නම් බලපත්‍රය නිකුත් කිරීම හෝ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන්නේ නම් ඊට හේතු ඉල්ලුම්කරුට දන්වා යැවීම සභාපතිවරයාගේ කාර්යය වන්නේය.

21. සෑම බලපත්‍රලාභියෙකු විසින් ම බලපත්‍රය සහ බලපත්‍රයට අදාළ කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ සේවා නියුක්තිකයන්ගේ නම් සහ ලිපිනයන් සිංහල හා දෙමළ භාෂාවලින් දැක්වෙන ලැයිස්තුවක් බලපත්‍රලාභී ස්ථානයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක එල්ලා තැබීමට සැළැස්විය යුතුය.

22. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ කරනු ලබන සෑම දැන්වීමක්ම අවස්ථෝචිත පරිදි අයිතිකරු හෝ එම ස්ථානයේ භාරකරු වෙත භාර දිය යුතුය. එවැන්නෙකු නොමැති විට බලපත්‍රලත් ස්ථානයේ ප්‍රකටව පෙනෙන පරිදි අලවා තැබිය යුතුය. එවැනි දැන්වීමකට ස්ථානයේ අයිතිකරුගේ හෝ පරිහරණය කරන අයගේ නම සඳහන් කිරීම අවශ්‍ය නොවිය යුතුය.

23. මේ අතුරු ව්‍යවස්ථාවේ කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, 255 වන අධිකාරය වන නගර සභා ආඥා පනතේ 153 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතුය.

24. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,

"සභාව" යන්නෙන් වත්තල මාබෝල නගර සභාව අදහස් වේ.

"සභාපති" යන්නෙන් වත්තල මාබෝල නගරසභාවේ සභාපතිවරයා අදහස් වේ.

"නගර සභා බල ප්‍රදේශය" යන්නෙන් වත්තල මාබෝල නගරසභාව සංස්ථාපනය වූ බල ප්‍රදේශය අදහස් වේ.

"බලය පවරන ලද නගර සභාවේ යම් නිලධාරියෙක්" යන්නෙන් වත්තල මාබෝල නගර සභාවේ සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමට බලය පවරනු ලබන නිලධාරියා හෝ නිලධාරීන් අදහස් වේ.

"බලපත්‍රධාරියා" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් තැනැත්තෙකු අදහස් කරනු ලැබේ.

"තැනැත්තා" යන්නට සංස්ථාගත කරන ලද හෝ නොකරන ලද පුද්ගල මණ්ඩලයක්ද ඇතුළත් වේ.

"පාලනය භාර තැනැත්තා" යන්නට භාරකරුවෙක්, ආරක්ෂකයෙක්, දේපළ ආරක්ෂකයෙක්, කළමණාකරුවෙක් හෝ යම් තැනැත්තෙක් වෙන්වෙන් යම් ව්‍යාපාරයක සංවිධානය, පාලනය හෝ කළමණාකරණය පැවරී ඇති වෙනත් තැනැත්තෙකුද ඇතුළත් වේ.

25. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨය ප්‍රමුඛ වේ.

## වත්තල මාබෝල නගර සභාවේ උත්සව ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. මෙම අතුරු ව්‍යවස්ථාව නගර සභා බල ප්‍රදේශයේ නගර සභාව විසින් පවත්වාගෙන යන උත්සව ශාලා පාලනය කිරීම හා ගාස්තු අය කිරීම සඳහා පනවනු ලැබේ.

2. මෙම අතුරු ව්‍යවස්ථාව නගර සභා බල ප්‍රදේශයේ උත්සව ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

3. (i) (මෙහි මින්මතු උත්සව ශාලාව යනුවෙන් හඳුන්වනු ලබන) සභාව විසින් පවත්වාගෙන යන කිසියම් උත්සව ශාලාවක් පරිහරණය කිරීම සඳහා අවසර පත්‍රයක් ලබා ගැනීමට අදහස් කරන යම් තැනැත්තෙකු මෙම අතුරු ව්‍යවස්ථාවට සාරානුකූලව පිළියෙල කළ සභාවෙන් ලබාගත් ඉල්ලුම්පත්‍රයක් ඒ සඳහා ඉදිරිපත් කළ යුතුය.

   (ii) ඉල්ලුම්පත්‍රයක් සඳහා අයකළ යුතු ගාස්තු සභාව, සභා සම්මුතියක් මගින් කළින් කළ තීරණය කරනු ලබන ගාස්තුවක් විය යුතුය.

4. 3 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් පරිදි ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරන යම් තැනැත්තෙකු වෙත උත්සව ශාලාවක් පරිහරණය කිරීම සඳහා අවසර පත්‍රයක් නිකුත් කිරීමේදී මෙහි පහත දැක්වෙන කොන්දේසි සම්පූර්ණ කර ඇත්තේ නම් මිස සභාපතිවරයා විසින් අවසර පත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතුය.

   (i) උත්සව ශාලා ප්‍රයෝජනයට ගැනීමට අවසර පත්‍රයක් ඉල්ලීම සඳහා වූ සෑම ඉල්ලුම්පත්‍රයක්ම නගර සභා කාර්යාලයට ලැබුණු අනුපිළිවෙල අනුව සළකා බැලිය යුතුය.

   (ii) නගර සභාව විසින් කලින් කළ තීරණය කර ප්‍රකාශයට පත් කරනු ලබන ආකාරයට උත්සව ශාලා වෙන්කිරීමේ ගාස්තුව සහ තැන්පත් මුදල් ගෙවීමෙන් අනතුරුව පමණක් අවසර පත්‍රය නිකුත් කළ යුතුය.

5. පරිහරණය කිරීම සඳහා උත්සව ශාලාවක් වෙන් කර ගැනීමට ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම, එකී වෙන් කිරීම අපේක්ෂා කරන දිනයට අවම වශයෙන් දින තුනකට පෙර සභාපති වෙත ඉදිරිපත් කළ යුතුය.

6. මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන යටතේ වෙන් කර ගන්නා ලද කිසියම් උත්සව ශාලාවක්, එකී වෙන් කර ගැනීම අවලංගු කරවා ගැනීමට යම් ඉල්ලුම්කරුවකුට අවශ්‍ය වන අවස්ථාවක පහත සඳහන් කොන්දේසිවලට යටත්ව ඉඩදීමට සභාපතිවරයාට හැකිය.

   (i) වෙන් කිරීම අවලංගු කිරීමට ඉල්ලීම කරනු ලබන්නේ, අදාළ උත්සව ශාලාව වෙන් කර ගනු ලැබූ දිනට,

      (අ) මාස තුනකට පෙර වන විට, ගෙවනු ලැබූ ගාස්තුවෙන් සියයට පහක්,

      (ආ) මාස දෙකකට පෙර වනවිට, ගෙවනු ලැබූ ගාස්තුවෙන් සියයට දහයක්,

      (ඇ) මාසයකට පෙර වන විට, ගෙවනු ලැබූ ගාස්තුවෙන් සියයට පහළොවක්,

      (ඈ) දින පහළොවකට පෙර වන විට, ගෙවනු ලැබූ ගාස්තුවෙන් සියයට විසිපහක්,

      (ඉ) දින තුනකට පෙර වන විට, ගෙවනු ලැබූ ගාස්තුවෙන් සියයට පනහක්,

      (ඊ) දින තුනකට පසු වන විට, ගෙවනු ලැබූ ගාස්තුවෙන් සියයට හැත්තෑ පහක්,

      නගර සභා අරමුදලේ රඳවා ගැනීමට යටත් විය යුතුය.

   (ii) කිසියම් වෙන් කිරීමක් අවලංගු කරවා ගනු ලැබූ විටකදී එකී වෙන් කර ගැනීම සඳහා ගෙවනු ලැබූ තැන්පතු මුදල සම්පූර්ණයෙන්ම ලබා ගැනීමට ඉල්ලුම්කරුට හිමිකම් තිබිය යුතුය.

7. කිසියම් තැනැත්තෙකු විසින් වෙන් කර ගනු ලැබූ උත්සව ශාලාවක් එහි වේදිකාව වෙන් කර ගත් කාර්යයට හැර වෙනත් කවර හෝ කාර්යයකට යොදා ගැනීම නොකළ යුතු අතර, ඊට සපයා ඇති භාණ්ඩ දේපළ යොදවා ඇති කාර්යය හැර වෙනත් දෙයකට යොදා නොගත යුතු ය.

8. උත්සව ශාලාවක් වෙන් කිරීමට නිකුත් කරන ලද අවසර පත්‍රයක්, කවර හෝ හේතුවක් මත වෙනත් තැනැත්තෙකුට පැවරීම නොකළ යුතුය.

9. කවර හෝ තැනැත්තෙකු විසින් උත්සව ශාලාවක් වෙන් කර ගැනීම සඳහා කෙරෙන ඉල්ලීමකට ඉඩ නොදෙන අවස්ථාවකදී, එසේ ඉඩ නොදීමට හේතුවන කරුණු සඳහන් කරමින් ඒ බව ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ දිනයේදීම එකී ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම්දීම සභාපතිවරයාගේ කාර්යය වන්නේය.

10. කිසියම් කාර්යයක් සඳහා වෙන් කර ගනු ලැබූ උත්සව ශාලාවක්, එසේ වෙන් කරගත් දිනය වෙනස් කර ගැනීමට අවශ්‍ය වන්නේ නම් ඉල්ලුම්කරු විසින් ඒ පිළිබඳව ලිඛිතව සභාපතිවරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකිය. එකී ඉල්ලීම අනුව වෙන් කළ දිනය සංශෝධනය කිරීම 4 වන සහ 5 වන අතුරු ව්‍යවස්ථාවල නියමයන්ට යටත් විය යුතුය.

11. කිසියම් කාර්යයක් සඳහා වෙන් කරනු ලැබූ උත්සව ශාලාවක් අදාළ කාර්යය සඳහා පාවිච්චි කිරීමෙන් අනතුරුව නගර සභාවේ තැන්පත් කරනු ලැබූ තැන්පත් මුදලෙන්,

(i) උත්සව ශාලාව හෝ එහි යම් කොටසකට හෝ සිදුවී ඇති යම් අලාභයක් වේ නම් ඒ අලාභයේ වටිනාකම,

(ii) උත්සව ශාලාව වෙන් කරගනු ලැබූ කාලසීමාවට වඩා වැඩිපුර යොදා ගනු ලැබූ කාලය වෙනුවෙන් අයකර ගත යුතු ගාස්තුව අඩුකර ගැනීමෙන් අනතුරුව ඉතිරිවන යම් මුදලක් පමණක් ඉල්ලුම්කරුට ආපසු ගෙවනු ලැබිය හැකිය.

12. කවර හෝ තැනැත්තෙකු විසින් නගර සභාව සතු කිසියම් උත්සව ශාලාවකට, එහි උපකරණයකට හෝ හානි පැමිණවීම හෝ එසේ හානි වීමට සැලැස්වීම නොකළ යුතු ය.

13. උත්සව ශාලාව පරිහරණය කිරීම උත්සව ශාලාව භාරකරුගේ පරිපාලනයට යටත්ව විය යුතු අතර, උත්සව ශාලාව පරිහරණය කිරීමේදී ඒ තුළ සමාජ විරෝධී ක්‍රියාවක හෝ, උත්සව ශාලාව තුළ හෝ එය පිහිටි භූමියේ දේපලට හානි වන ආකාරයට, කවර හෝ ක්‍රියාවක් සිදුවුවහොත් ඊට අදාළව අවසර පත්‍රලාභියා උත්සව ශාලාව කළමනාකරණයට අදාළව වගකීමට පත්විය යුතු ය.

15. මේ අතුරු ව්‍යවස්ථාවේ කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, නගර සභා ආඥා පනතේ 153 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතුය.

16. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවෙහි,

"සභාව" යන්නෙන් වත්තල නගර සභාව අදහස් වේ.

"සභාපති" යන්නෙන් වත්තල නගර සභාවේ සභාපතිවරයා අදහස් වේ.

"නගර සභා බල ප්‍රදේශය" යන්නෙන් නගර සභාව සංස්ථාපනය කරන ලද බල ප්‍රදේශය අදහස් වේ.

17. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨය ප්‍රමුඛ වේ.

## වත්තල මාබෝල නගර සභාවේ කුකුල් මස් විකුණන ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. මෙම අතුරු ව්‍යවස්ථාව වත්තල මාබෝල නගර සභා බල ප්‍රදේශය තුළ කුකුල් මස් විකිණීම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය පිළිබඳවද ඒ සඳහා ගාස්තු අය කිරීම සඳහා ද පනවනු ලැබේ.

2. මෙම අතුරු ව්‍යවස්ථාව වත්තල මාබෝල නගර සභා බල ප්‍රදේශය තුළ කුකුල් මස් විකුණන ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

3. වත්තල මාබෝල නගර සභා බල ප්‍රදේශය තුළ කවර හෝ තැනැත්තෙකු විසින් වත්තල මාබෝල නගර සභාවේ සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් නොමැතිව කුකුල් මස් විකිණීමේ කාර්යය සඳහා යම් ස්ථානයක් පාවිච්චි නොකළ යුතුය.

4. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රය ලබා ගැනීමට ඉල්ලුම් කරන වෙළඳ ස්ථානය මෙහි පහත දැක්වෙන කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස සභාපතිවරයා විසින් කවර හෝ තැනැත්තෙකුට කුකුල් මස් වෙළඳ ස්ථානයක් පවත්වා ගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් නොකළ යුතුය.

(i) මස් විකිණීම සඳහාම ප්‍රදර්ශනය කරනු ලබන කොටස පිඟන් ගඩොල් කපරාරු කළ සිමෙන්ති හෝ මළ නොබැඳෙන ලෝහ තහඩු හෝ යොදා තිබිය යුතුය.

(ii) මස් විකිණීම සඳහා ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානයේ බිම සහ ගබඩා කිරීමේ ස්ථානයේ බිම සිමෙන්ති බදාමයෙන් මැදීම කර හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතුය.

(iii) අප ජලය ගලායාම පහසු කිරීම සඳහා අවශ්‍ය බෑවුමක් සහිතව සිමෙන්තියෙන් මැදීම කරනු ලැබූ හෝ පිඟන් ගඩොල් ඇල්ලූ කාණු තිබිය යුතුය.

(iv) (iii) ඡේදයේ සඳහන් කාණු තුළින් ගලායන අප ජලය කිසියම් පොදු ජල මාර්ගයකට ගලායාමට වැළැක්වීමට ප්‍රමාණවත් විධිවිධාන සලස්වා තිබිය යුතු අතර, එකී අප ජලය උරා ගන්නා වලකට ගලායාමට ඉඩ සලස්වා තිබිය යුතුය.

(v) අප ජලය ගලා යාමට සලස්වන ලද උරා ගන්නා වල වාතයට නිරාවරණය නොකළ යුතුය.

(vi) මස් වෙළඳ ස්ථානයෙන් බැහැර කරනු ලබන ජෛවහායන අප ද්‍රව්‍ය බහා ලීමට ප්‍රමාණවත් භාජන තබා තිබිය යුතු අතර, දෛනික වෙළඳාම් කටයුතු අවසානයේ එකී අප ද්‍රව්‍ය පොළොව මට්ටමෙන් අවම වශයෙන් මීටර් 0.5 ක් ගැඹුරෙන් වළ දැමීම හෝ නගර සභාව විසින් කලින් කළ තීරණය කර නියම කරනු ලබන නියමයන්ට අනුකූලව බැහැර කිරීම කළ යුතුය.

(vii) ස්ථානයේ සේවය කරන තැනැත්තන්ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රමාණවත් ජල මුද්‍රිත වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතු අතර, වැසිකිළි භාවිතයෙන් අනතුරුව පාවිච්චි කිරීමට සුදුසු සනීපාරක්ෂක ක්‍රම හා ද්‍රව්‍ය සපයා තිබිය යුතුය.

5. බලපත්‍රයලත් ස්ථානයක සතෙකු මරණයට පත් කිරීම නොකළ යුතු අතර, කුකුළන් ප්‍රදර්ශනය වන පරිදි රඳවා ගැනීමත් නොකළ යුතු ය.

6. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රලත් පරිශ්‍රයෙහි වෙනත් කවර හෝ සතෙකුගේ මාංශය අලෙවි කිරීමක් නොකළ යුතු ය.

7. බලපත්‍රලත් කවර හෝ කුකුල් මස් වෙළඳ ස්ථානයක දෛනික කටයුතු අවසානයේ එකී ස්ථානයේ බිම ද, බිත්තිවල පිඟන් ගඩොල් ඇල්ලූ හෝ සිමෙන්ති කපරාරු කළ කොටස් ද, මස් කැපීම සඳහා ගන්නා කොට ද, උපකරණ ද, කුකුල් මස් විකිණීම සඳහා ප්‍රදර්ශනයට තබන ස්ථාන ද, විෂ බීජ නාශක දියර යොදා සෝදා පිරිසිදු කිරීමට සැලැස්විය යුතුය.

8. බලපත්‍රලත් කවර හෝ කුකුල් මස් වෙළඳ ස්ථානයක සහ එහි අවට කාණු ද, මස් ගබඩා කිරීම, සකස් කිරීම හෝ විකිණීම හා සම්බන්ධව පාවිච්චි කරන සියලු භාජන සහ උපකරණ ද මනා අලුත්වැඩියාවෙන් යුතුව සහ දුර්ගන්ධයකින්තොරව තබා ගැනීමට සැලැස්විය යුතුය.

9. බලපත්‍රලත් ස්ථානයේ දෛනික වෙළඳාම් කටයුතු අවසන් වීමෙන් අනතුරුව විකුණා ගැනීමට නොහැකිව ශේෂ වන මස් අධි ශීතකරණයක ගබඩා කරනු ලැබ ඇත්තේ නම් හා එසේ ගබඩා කළ අවස්ථාවේ සිට ඊළඟ දිනයේ මස් වෙළඳ සැල විවෘත කරන අවස්ථාව දක්වා එකී අධිශීතකරණය නිසි ආකාරයෙන් ක්‍රියාත්මකව පැවති තිබුනේ නම් මිස ශේෂවන කවර හෝ මසක් ඊළඟ දිනයේ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ අධි ශීතකරණයේ හෝ බලපත්‍රලත් ස්ථානයේ තබා ගැනීම හෝ නොකළ යුතුය.

10. කවර හෝ ඝාතකාගාරයක් තුළ හෝ වෙනත් කවර හෝ ස්ථානයක කිසියම් දිනයක දී හෝ කාල වකවානුවක මස් පිණිස සතුන් මැරීම තහනම් කරමින් ගෝ ඝාතක ආඥා පනතේ විධිවිධාන ප්‍රකාර නිසි අධිකාරය විසින් නියමයක් *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කර ඇති අවස්ථාවක, කවර හෝ මස් කඩයක වෙළඳාම් පිණිස මස් තබා ගැනීම හෝ වෙළඳාම පිණිස මස් ප්‍රදර්ශනය කිරීම හෝ ගබඩා කිරීම නොකළ යුතුය.

11. බලපත්‍රලත් කවර හෝ කුකුල් මස් වෙළඳ ස්ථානයක බල්ලන්, බළලුන්, මීයන්, කෘමීන් හෝ වෙනත් කවර හෝ සතුන්ගෙන් තොරව තබා ගත යුතුය.

12. බලපත්‍රලත් ස්ථානයෙහි මස් දමා තැබීමට හෝ සකස් කිරීමට හෝ විකිණීමට පාවිච්චි කරන උපකරණ හෝ භාජන හැර කිසිම භාණ්ඩයක් හෝ ඇඳුමක් හෝ නිදාගන්න පැදුරක් හෝ වෙනත් කවර හෝ දෙයක් තබා ගැනීම නොකළ යුතුය.

13. බලපත්‍රයලත් ස්ථානයේ සේවය කරන තැනැත්තන්ගේ පාවිච්චියට ගැනීම සඳහා බීමට සුදුසු ජලය ප්‍රමාණවත් ප්‍රමාණයක් තබා ගැනීම කළ යුතුය.

14. (i) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතක දී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ මස් වෙළඳ ස්ථානයක කවර හෝ ආකාරයක වෙළඳාමෙහි හෝ එසේ වෙළඳාමේ නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

(ii) හොඳින් සෝදා පිරිසුදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් මස් වෙළඳ ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

(iii) මස් වෙළඳ ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියා ගේ කාර්යය විය යුතුය.

15. මස් වෙළඳ ස්ථානයෙහි සේවයේ යෙදෙන සෑම සේවකයෙකු වෙත ම ආරක්ෂිත මුව වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා තිබීමත්, එකී සේවකයන් මස් වෙළඳ ස්ථානයෙහි සේවයේ නියුක්ත වන සෑම අවස්ථාවක ම එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවට සහ සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

16. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත සෑම තැනැත්තෙකු ම විසින් ප්‍රයෝජනයට ගැනීම පිණිස සබන් හෝ සබන් දියර තබා තිබීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

17. සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් මස් වෙළඳ ස්ථානයෙහි විකිණීමට තබා ඇති හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කර ඇති හෝ ඇතුළත ගබඩා කර ඇති යම් මස් වර්ගයකින් සාම්පලයක්, එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතුවාත් හැර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී මිල දී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතුය.

18. (i) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අප ද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අප ද්‍රව්‍ය -

(අ) ජෛවභායන අපද්‍රව්‍ය ;

(ආ) වීදුරු ;

(ඇ) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය ;

(ඈ) පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය ;

(ඉ) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස් ;

(ඊ) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස් ;

(උ) අන්තරායකර අපද්‍රව්‍ය ;

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර ඒ එක් එක් වර්ගයේ අප ද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(ii) ඉහත (i) ඡේදයේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය නගර සභාවේ අප ද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස සභාපතිවරයා විසින් ඒ සඳහා නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැර ලීම කළ යුතුය.

19. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට කුකුල් මස් වෙළඳ ස්ථානයේ මස් වෙළඳාම කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

20. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් කුකුල් මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය 4 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මෙම අතුරු ව්‍යවස්ථාවල හෝ වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූලව තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් සභාපතිවරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතුය.

21. 20 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතුය. පිළිගත හැකි ආකාරයේ කරුණු

ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට සභාපතිවරයාට බලය තිබිය යුතුය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලැබෙන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතුය.

22. 20 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය සභාපතිවරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතුය.

23. මේ අතුරු ව්‍යවස්ථාවේ කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, 255 වන අධිකාරය වන නගර සභා ආඥා පනතේ 153 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතුය.

24. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ-

"සභාව"යන්නෙන් වත්තල මාබෝල නගර සභාව අදහස් වේ.

"සභාපති"යන්නෙන් වත්තල මාබෝල නගර සභාවේ සභාපතිවරයා අදහස් වේ.

"නගර සභා ප්‍රදේශය"යන්නෙන් වත්තල මාබෝල නගර සභාව සංස්ථාපනය කරන ලද බල ප්‍රදේශය අදහස් වේ.

25. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨය ප්‍රමුඛ වේ.

**වත්තල මාබෝල නගර සභාවේ ගෝ ඝාතකාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. මෙම අතුරු ව්‍යවස්ථාව වත්තල මාබෝල නගර සභා බල ප්‍රදේශයේ පිහිටි ගෝ ඝාතකාගාර ස්ථාන විධිමත් කිරීම අධීක්ෂණය කිරීම පරීක්ෂා කිරීම පාලනය කිරීම හා ඒ සඳහා ගාස්තු නියම කිරීම සඳහා පනවනු ලබයි.

2. මෙම අතුරු ව්‍යවස්ථාව වත්තල මාබෝල නගර සභා බල ප්‍රදේශයේ පිහිටුවා ඇති ගෝ ඝාතකාගාර ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලබයි.

3. (මෙහි මින් මතු බල ප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලබන) වත්තල මාබෝල නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන සෑම ගෝ ඝාතනාගාරයක් ම ඝාතනාගාර භාරකරුවකුගේ භාරකාරිත්වය යටතේ පවත්වා ගතයුතුය.

4. නිසි බලධාරියා විසින් කළින් කළ නියම කරනු ලැබිය හැකි වේලාවන් තුළ පමණක් හැර, ගෝ ඝාතනාගාර තුළ කිසිම බලපත්‍රලත් ඝාතකයෙකුට සතුන් ඝාතනය කිරීමට ඉඩදෙනු නොලැබිය යුතු වන්නේය.

5. බලපත්‍රලත් ඝාතකයෙකු විසින් සතුන් ඝාතනය කළ යුත්තේ ඝාතනාගාර භාරකරු විසින් ඒ ඝාතකයාට ඝාතනාගාරය ඇතුළත ඒ සඳහා වෙන් කරදෙනු ලැබූ ස්ථානවලදී පමණක් විය යුතුය.

6. ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් යම් සතෙකු පරීක්ෂා කර එම සතා මරණයට පත්කිරීම සඳහා නිකුත් කරනු ලබන අවසර පත්‍රයක් නිකුත් කර ඇත්නම් මිස කිසිදු සතෙකු ඝාතනය නොකළ යුතුය.

7. ඉහත 6 වන උප වගන්තිය යටතේ නිකුත් කරනු ලබන අවසර පත්‍රය නිකුත් කරන ලද දින සිට දින 7 ක් දක්වා පමණක් වලංගු වන්නේය.

8. ඝාතනය කරන සෑම සතෙකු සම්බන්ධයෙන්ම එම සතාගේ පූර්ව අයිතිය සනාථ කෙරෙන ලියවිල්ලක් තමා භාරයට පත්වී තිබිය යුතු අතරම, එම සතා සම්බන්ධයෙන් ස්වභාවය හා පූර්ව අයිතිය පිළිබඳ තොරතුරු මෙන්ම නගර සභාව විසින් අනුමත කළ ආකෘති පත්‍රයක දැක්වෙන පරිදි වූ වෙනත් සියලු විස්තර ද ඇතුළත් ලේඛනයක් ඝාතනාගාර භාරකරු විසින් තමා භාරයේ පවත්වා ගත යුතුය.

9. ගෝ ඝාතකාගාරයට සතෙකු ඇතුල් කිරීමට පෙරාතුව පහත සඳහන් සනාථ කිරීම් ඝාතනාගාර භාරකරු වෙත ඉදිරිපත් කිරීමට නොහැකිවන යම් අයෙකුට සතෙකු ඇතුල් කිරීමට අවසර නොදිය යුතුය.

(අ) අනන්‍යතා සහතිකය
(ආ) යෝග්‍යතා සහතිකය
(ඇ) අවසර පත්‍රය

10. ඝාතනාගාරයට ගෙන එනු ලබන හෝ එහි රඳවා තබන සතුන් පැනයාම වැළැක්වීම පිණිස කඹවලින් නිසි පරිදි බැඳ තැබිය යුතුය. නැතහොත් වෙනත් ආරක්ෂක පියවර ගෙන තිබිය යුතුය.

11. ඝාතකයකු වශයෙන් තමන්ගේ ව්‍යාපාරය හා සම්බන්ධ ඝාතනාගාරයෙහි සේවයේ නියුක්ත කිරීමට අපේක්ෂා කරන සේවකයන්ගේ නම්, සෑම බලපත්‍රලත් ඝාතකයකු විසින්ම නගර සභා කාර්යාලයෙහි ලේඛණගත කළ යුතු අතර, කිසියම් නමක් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඒ වන විටත් ලියාපදිංචි කර ඇති අය අතුරෙන් කිසිවෙකුගේ නම අවලංගු කිරීම හෝ සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් කරනු ලැබිය හැකිය. එසේ ලියාපදිංචි කරනු නොලැබූ හෝ එසේ නම අවලංගු කරනු ලැබූ කිසිම තැනැත්තකු, එවැනි බලපත්‍රලත් ඝාතකයකු විසින් සේවයේ නියුක්ත කිරීම හෝ සේවයෙහි තබාගැනීම නොකළ යුතුය.

12. සෑම බලපත්‍රලත් ඝාතකයකු විසින්ම ඔහුගේ බලපත්‍රයේ සහතික කළ පිටපතක් සහ ඔහු විසින් ඝාතකාගාරයේ සේවයේ නියුක්ත කරන සෑම සේවකයකුගේම ලියාපදිංචි කිරීමේ සහතිකයේ, සහතික කළ පිටපතක් ඒවා ලබාගත් වහාම, ඝාතනාගාර භාරකරු වෙත භාරදිය යුතුය.

13. ඝාතනය කරන ලද සතුන්ගේ සම් බඩවැල් සහ ඉවත දමන ලද කොටස් ඝාතක විසින් හෝ ඔහුගේ සේවා නියුක්තිකයන් විසින්, ඉවත් කිරීමට පෙර සෝදා පිරිසිදු කිරීම පිණිස ඒ සඳහා වෙන් කර ඇති ස්ථානවල එකතු කළ යුතුය.

14. බලපත්‍රලත් ඝාතකයකු හෝ ඔහුගේ ලියාපදිංචි කළ සේවකයන් විසින් ඝාතනාගාරය පාවිච්චි කරන විට දී, ඔහුගේ ක්‍රියාවන්ගෙන් හෝ ඔහුගේ සේවකයන් කිසිවකුගේ ක්‍රියාවන්ගේ හේතුවෙන් ඝාතනාගාරයට සිදුවන යම් අලාභහානියක් සම්බන්ධයෙන්, බලපත්‍රලත් ඝාතකයා වගකිව යුතු අතර, ඒ සඳහා අලාභය බලපත්‍රලාභියා විසින් ගෙවිය යුතුය. එසේ මුදල ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් සභාපතිවරයා විසින් බලපත්‍රය අවලංගු කිරීම හෝ විකල්පයක් වශයෙන් ඒ අලාභහානියේ මුදල බලපත්‍රලත් ඝාතකගෙන් හෝ ඔහුගේ ඇපකරුවන්ගෙන් අයකිරීම හෝ ඒ දෙකම හෝ කරනු ලැබිය හැකිය.

15. යම් චර්ම රෝගයකින්, ලාදුරු රෝගයකින් හෝ යම් ආසාදන හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන කිසිම තැනැත්තකුට ඝාතනාගාරයට ඝාතනාගාර භාරකරු විසින් ඇතුළුවීමට ඉඩ නොදිය යුතුය.

16. සතුන් සම්බන්ධයෙන් එක් සතකු වෙනුවෙන් මෙහි පහත දැක්වෙන කාර්යය සඳහා අයකළ යුතු ගාස්තු සභාව විසින් කලින් කළ යෝජනා සම්මතයෙන් තීරණය කර අයකිරීම නීත්‍යානුකූල වන්නේය.

(1) ඝාතනාගාර පාවිච්චි කිරීම සඳහා -

(අ) ගවයන් (මීගවයන් හැර)
(ආ) ඌරන් සහ එළුවන්

(2) ගවයන්ට කෑම දීම - (පැය විසිහතරක කාලයක් හෝ ඉන් කොටසක් සඳහා)

(අ) ගවයන් (මී ගවයන් හැර)
(ආ) ඌරන් සහ එළුවන්

(3) මඩුව පාවිච්චි කිරීම සඳහා -

(අ) ගවයන් (මීගවයන් හැර)
(ආ) ඌරන් සහ එළුවන්

17. අයවිය යුතු ගාස්තු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් ඝාතනාගාරයේ රඳවා ගන්නා ලද සතකු, ඒ සම්බන්ධයෙන් දැනුම් දීමකින් අනතුරුව තවදුරටත් අදාළ ගාස්තු නොගෙවන්නේ නම්, දවස් දෙකකට කලින් ප්‍රචාරයක් කිරීමෙන් පසුව සභාපතිවරයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ එම සතා විකිණීමට සැලැස්විය හැකිය. එසේ විකිණීමෙන් ලැබෙන මුදලින් ඒ සතා වෙනුවෙන් අයවිය යුතු යම් ගාස්තුවක් සහ දරන ලද යම් වියදමක මුදල් ප්‍රමාණය තමා වෙත රඳවා තබාගෙන ඉතිරි මුදලක් වේතොත් එය ඒ සතා ඝාතනය කිරීම සඳහා ඝාතනාගාරයට ගෙන ආ තැනැත්තාට ඔහු විසින් ඉල්ලුම් කරනු ලැබීමෙන් අනතුරුව සභාපති විසින් ගෙවනු ලැබිය යුතුය. වෙන්දේසියේ විකිණීමෙන් වර්ෂයක් ඇතුළත දී අදාළ මුදල ලබා ගැනීමට ඝාතනාගාරයට ගෙන ආ තැනැත්තා විසින් ඉල්ලුම් කිරීමට අපොහොසත් වුවහොත් එම මුදල සභා අරමුදලට බැර කළ යුතුය.

18. රෝගීව සිටීම හෝ අන් හේතුවක් නිසා හෝ මනුෂ්‍ය ආහාරය සඳහා ඝාතනය කිරීමට සුදුසු නොවන බවට සොයා ගනු ලැබූ සතකු ඝාතනය කිරීමට ඒ වන විට අවසර පත්‍රයක් නිකුත් කර තිබුණත් නැතත් ඒ සතා ඝාතනය කිරීම ඝාතනාගාර භාරකරු විසින් හෝ ප්‍රාදේශීය සෞඛ්‍ය නිලධාරිවරයා විසින් හෝ තහනම් කිරීම නීත්‍යානුකූල වන්නේය. තව ද එවැනි සතකු කිසිම තැනැත්තකු විසින් ඝාතනය නොකළ යුතුය.

19. ඝාතනය කිරීම සඳහා අවසරපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබූ හෝ ඝාතනය කිරීම් තහනම් කරනු ලැබූ සතකු ඝාතනාගාරයට ගෙන ආ තැනැත්තා එසේ අවසර පත්‍රය නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබ හෝ ඝාතනය තහනම් කරනු ලැබ පැය දොළහක් ඇතුළත එම සතා ඝාතනාගාරයෙන් ඉවත්කර ගැනීම පැහැර හැරියහොත් (17) වන අතුරු ව්‍යවස්ථාවේ දැක්වෙන විධිවිධානයන් අනුව ක්‍රියා කළ යුතුය.

20. සභාව විසින් අනුමත කළ ආකෘතියක් යටතේ සභාපති හෝ ඔහු විසින් ඒ සඳහා බලය පවරන ලද නිලධාරියකු විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් ඇතිව මිස පොදු ඝාතනාගාරයක ඝාතනය කළ කිසිම සතකුගේ මස්, හම, බඩවැල හෝ අවමස් කිසිම තැනැත්තකු විසින් ඉවත් කරගෙන නොයා යුතුය. එවැනි මස්, හම්, බඩවැල් හෝ අවමස් ඉවත්කරගෙන යන යම් තැනැත්තකු නගර සභාවේ යම් නිලධාරියකු විසින් ඉල්ලා සිටි විට ඒ අවසරපත්‍ර පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

21. කිසිම සුනඛයකු ඝාතනාගාරය තුළට ගෙන ඒමට ඉඩ නොදිය යුතු අතර, කිසිදු සුනඛයකුගේ අයිතිකරු හෝ භාරව සිටින තැනැත්තකු විසින් එසේ සුනඛයකු ඝාතනාගාරයට ගෙන ඒම හෝ සුනඛයකුට ඝාතනාගාරයට ඇතුළුවීමට ඉඩ හැරීම හෝ නොකළ යුතුය. ඝාතනාගාරයක සිට හමුවන සියලු සුනඛයින් දඩාවතේ යන සුනඛයන් ලෙස සළකා ක්‍රියා කළ යුතුය.

22. කිසිම බලපත්‍රයක් ලත් ඝාතකයකු හෝ ඝාතකයකුගේ ලියාපදිංචි කළ යම් සේවකයකු හෝ ඝාතනාගාරය තුළට පැමිණීමට ඉඩදෙන ලද වෙනත් යම් තැනැත්තකු හෝ විසින් ඝාතනාගාරය තුළ යම් ශබ්ද නැගීම් කෝලාහල කිරීම හෝ දබර කිරීම අපහාසාත්මක අපවාදාත්මක හෝ අශිෂ්ඨ වචන පාවිච්චි කිරීම නොකළ යුතුය.

23. නිසි බලධාරියාගෙන් විශේෂයෙන් බලපත්‍රයක් ලබාගෙන ඇත්නම් මිස බලපත්‍රලත් ඝාතකයකු නොවන කිසිම තැනැත්තකු විසින් නගර සභා සීමාව ඇතුළත කිසිදු සතකු ඝාතනය කිරීම නීත්‍යානුකූල නොවන අතර, එවැනි විශේෂ බලපත්‍රයක් ලබාගන්නා යම් තැනැත්තකු විසින් ඒ බලපත්‍රයෙහි සඳහන් ස්ථානයේ දී හෝ එහි දැක්වෙන කොන්දේසි යටතේ හැර ඒ ඝාතනය සිදු නොකළ යුතුය.

24. සෑම ඝාතනාගාරයක්ම දිනකට දෙවරක්වත් සෝදා පිරිසිදු කළ යුතු අතර, මනා නඩත්තුවක් යටතේ එය පවත්වාගෙන යාම ඝාතනාගාර භාරකරුගේ කාර්ය විය යුතුය.

25. ඝාතනය සඳහා ඉහත කී පරිදි අනුමත කරන යම් සතකු ඝාතනය කිරීමෙන් පසුව එම සතාගේ මළ කඳ රෝගයකට පාත්‍රවී ඇති බව හෝ මනුෂ්‍ය ආහාරය සඳහා අයෝග්‍ය බව පෙනී ගියහොත් සභාපතිවරයා විසින් හෝ බලය පවරන ලද වෙනත් යම් තැනැත්තකු විසින් මනුෂ්‍ය ආහාරයක් ලෙස ප්‍රයෝජනයට ගැනීම වළක්වනු පිණිස බැහැර කිරීමට සැළැස්විය යුතුය. ඒ සම්බන්ධයෙන් පශු වෛද්‍යවරයා විසින් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් කරනු ලබන තීරණය අවසානාත්මක තීරණය වන්නේය. මෙසේ කිරීමේදී කිසියම් වන්දියක් ඉල්ලීමට කවර පාර්ශවයකට හිමිකමක් නොමැත.

26. සතුන් ඝාතනය කිරීමේ හම ගැසීමේ හෝ මස් කිරීමේ ක්‍රියාවලිය අතරතුර ඝාතකයන් ඔවුන්ගේ සහායකයන් ඝාතනාගාරයට අනුයුක්ත නගර සභා නිලධාරයන් සහ බලයලත් අය හැර වෙනත් කිසිම තැනැත්තකු ඝාතනාගාර ස්ථානය තුළට ඇතුළත් කර නොගත යුතුය.

27. ඝාතකයන් හෝ ඔවුන්ගේ සහායකයන් විසින් ඝාතනාගාරයෙහි දමා යන සියලු අවමස් හෝ වෙනත් කුණු කසළ පීඩාවක් ඇති නොවන ආකාරයෙන් බැහැර කළ යුතුය.

28. කිසිම තැනැත්තකු විසින් කවර හෝ සතකුගේ මස් කිසිවක්, ඒ මස් හිරු එළියෙන්, දූවිල්ලෙන් සහ වැස්සෙන් සාර්ථකව ආරක්ෂා වන ආකාරයට සහ මහජනයාට නොපෙනෙන පරිදි ආවරණ සහිතව බාහිරට රැගෙන යාම කළ යුතුය.

29. මෙම අතුරු ව්‍යවස්ථාවල කවර හෝ විධිවිධානයක් කඩ කරන උල්ලංඝනය කරනු ලබන සෑම තැනැත්තෙක්ම වරදකට වරදකරු විය යුතු අතර, එම වරද සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට බලය ඇති අධිකරණයක් විසින් එසේ වරදට වරදකරුවකු කිරීමෙන් අනතුරුව 255 අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 153 වගන්තියෙහි (2) උපවගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමයකට යටත් විය යුතුය.

30. පද සම්බන්ධයෙන් අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවල,

"සභාපති" යන්නෙන් වත්තල මාබෝල නගර සභාවේ සභාපතිවරයා ද,

"සභාව" යන්නෙන් වත්තල මාබෝල නගර සභාව ද,

"බලයලත් නිලධාරී"යන්නෙන් වත්තල මාබෝල නගර සභාවේ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධාරියකු ද,

"නිසි බලධාරියා"යන්නෙන් වත්තල මාබෝල සභාපතිවරයා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ද,

"ඝාතනාගාර භාරකරු" යනුවෙන් ඝාතනාගාරය භාරව කටයුතු කිරීමට පත්කළඅයකු හෝ ඝාතනාගාරයක් පවත්වාගෙන යන අයෙකු ද,

"සතුන්" යන්නට සෝ ඝාතන ආඥාපනතේ අර්ථ නිරූපණයම අදාළ වේ.

31. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨය ප්‍රමුඛ වේ.

## වත්තල මාබෝල නගර සභාවේ ජල සේවාවන් පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

01. මෙම අතුරු ව්‍යවස්ථාව වත්තල මාබෝල නගර සභාව විසින් පානීය ජල යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම, ඊට අදාළ ගාස්තු නියම කිරීම ඇතුළු ඊට අදාළ ආනුශංගික කරුණු සඳහා විධිවිධාන සැළසීම පිණිස වූ අතුරු ව්‍යවස්ථාවකි.

02. මෙම අතුරු ව්‍යවස්ථාව වත්තල මාබෝල නගර සභාවෙහි ජල සේවාවන් පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

03. වත්තල මාබෝල නගර සභාව විසින් (මෙහි මින් මතු බල ප්‍රදේශය වශයෙන් හඳුන්වනු ලබන) වත්තල මාබෝල නගර සභා බල ප්‍රදේශයේ පරිභෝජන ජල අවශ්‍යතා වෙනුවෙන් සභාව තීරණය කරන ආකාරයට හඳුනාගත් ප්‍රදේශ යටතේ පානීය ජල සම්පාදන සේවාවක් පවත්වාගෙන යාම නීත්‍යානුකූල වන්නේය.

04. සභාව ඉහත වගන්තිය යටතේ පවත්වාගෙන යන සේවාවන් සඳහා අයකළ යුතු ගාස්තු කලින් කල යෝජනා සම්මුතියකින් තීරණය කර ප්‍රකාශයට පත්කළ යුතුය.

05. (මෙහි මින් මතු සේවාව වශයෙන් හඳුන්වනු ලබන) වත්තල මාබෝල නගර සභාව ක්‍රියාත්මක කරන ජල සේවාව යටතේ ජල පහසුකම් ලබා ගැනීමට අපේක්ෂා කරන සෑම තැනැත්තෙක්ම සභාව වෙතින් ලබාගත් නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයක් යටතේ සභාපති වෙතින් ඉල්ලුම් කළ යුතුය.

06. පෞද්ගලික ජල සම්බන්ධතාවයක් ලබාදීමේදී හෝ ලබාදී ඇති ජල සම්බන්ධතාවයක් වෙනස් කිරීමේ දී ඒ සඳහා සභාව විසින් ඇස්තමේන්තු කරන ලද වියදම් ඉල්ලුම්කරු විසින් දැරිය යුතුය. ඉල්ලුම්කරුගේ දරිද්‍රතාවය මත ජල සම්බන්ධතාවයන් ලබාදීමේ දී වන වියදම් සභාව විසින් සභා සම්මුතියක් මගින් නිදහස් කළ හැක.

07. සියලු පෞද්ගලික ජල සේවා සම්බන්ධයක් සඳහාම සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් එම කාර්ය සඳහා බලය දෙන නිලධාරියා විසින් අනුමත කරනු ලබන, වර්ගයක කර්මන්‍ය විරාම කරාමයක් සපයනු ලැබිය යුතු අතර, එය එකී ජල සේවය සපයනු ලබන ස්ථානයට හැකිතාක් ආසන්නව සවිකරනු ලැබිය යුතුය. එවැනි කරාමයක් වෙත සැමවිටම ළඟාවිය හැකි පරිදි ඊට මැදිරියක් හා පියනක් ද සපයනු ලැබිය යුතුය.

08. අළුතින් ඉදිකරනු ලබන පෞද්ගලික ජල සේවා සම්බන්ධයක කොටසක් වන කිසිම නලයක්, වැල්වයක් හෝ වෙනත් සවිකිරීමක් පළාත් පාලන ආයතන සභාපතිවරයා විසින් හෝ ඔහුගේ බලය දෙන ලද නිලධාරියකු විසින් පරීක්ෂා කර, ලියවිල්ලකින් අනුමත කරන තුරු වසනු නොලැබිය යුතුය.

09. (i) යම් කසල කාණුවකට, අගලකට හෝ අසූචිවලට හෝ මනු වලකට හෝ කිසියම් භෂ්ම වලකට හෝ පෝර වලකට හෝ එවැන්නක් මැදින් වැටෙන පරිදි හෝ ස්පර්ශවන පරිදි හෝ කිසිම සේවා නලයක් නොයෙදිය යුතු අතර, නොවැළැක්විය හැකි අවස්ථාවල හැර එවැනි නලයක් යම් අපවිත්‍ර පසක් මැදින් හෝ එම නල අනිසිකල දිරායාමට හේතු විය හැකි යම් හානිකර ද්‍රව්‍යයක් යෙදීම හෝ ඊට ඒවා ස්පර්ශවී තිබෙන්නට සැලැස්වීම කරනු නොලැබිය යුතුය.

(ii) අපවිත්‍ර පසක් හෝ වෙනත් හානිකර ද්‍රව්‍යයක් එවැනි යම් නලයක් යෙදීම වැළැක්විය නොහැකි අවස්ථාවලදී පිටින් මල බැඳීම වැළක්වන බටයක් උඩින් හෝ පළාත් පාලන ආයතන ප්‍රධානියා විසින් හෝ ඔහුගේ බලය දෙන ලද නිලධාරියකු විසින් හෝ අනුමත කරනු ලබන වෙනත් සුදුසු උපක්‍රමයක් මඟින් එවැනි ද්‍රව්‍යයක් සමඟ නලය ස්පර්ශවීම සුදුසු ලෙස වළක්වාගත යුතුය.

10. (i) පෞද්ගලික ජල සේවා සම්බන්ධතාවන් ඉදිකිරීම සඳහා පාවිච්චි කරනු ලබන සියලුම නල පොලිවිනිල් ක්ලෝරයිඩ් හෝ පොලිතීන් හෝ ගැල්වනයිස් සිද්ධ යකඩවලින් හෝ බිටුමින් සම්මිශ්‍රණයක් ආලේප කරන ලද වාස්තු යකඩවලින් හෝ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අනුමැතියට යටත්ව වෙනත්

ද්‍රව්‍යයකින් විය යුතු අතර, මෙහි පහත දැක්වෙන ඡේදයෙහි දක්වා ඇති සනත්වයෙන්, ගුණාත්මක බවින් හා ශක්තියෙන් යුක්ත බවට, සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියකු විසින් අනුමත කරනු ලැබිය යුතුය.

(ii) සියළුම පොලිවිනිල්ක්ලෝරයිඩ් නල (පී.වී.සී.) ශ්‍රී ලංකා තත්ත්ව පාලන සම්මුතියේ අංක 147:1993ට හෝ එකී කලින් කල කෙරෙන සංශෝධනයන්ට අනුකූල විය යුතුය. ශ්‍රී ලංකාවේ නිපදවන ජලනල වල SLS සලකුණ සටහන්ව තිබිය යුතුය. පී.වී.සී. ජලනල වල සියළුම පිරිවැද්දුම් සහ සවිකිරීම් (joints and fittings) ශ්‍රී ලංකා ප්‍රමිති 1993 අංක 659ට හෝ බ්‍රිතාන්‍ය තත්ත්ව පාලන 1970 හා අංක 4346, I වැනි සහ II වැනි කොටසට හා ඒ සඳහා කලින් කල කෙරෙන සංශෝධනයන්ට යටත් විය යුතුය.

(iii) පෞද්ගලික ජල සේවා සම්බන්ධතාවන් ඉදිකිරීම සඳහා පාවිච්චි කරනු ලබන සියළුම පොලි එතිලීන් ජලනල 1985 අංක 6572 බ්‍රිතාන්‍ය ජාතික ප්‍රමිතියට හා ඊට කලින් කල කෙරෙන සංශෝධනයන්ට හෝ වෙනත් ජාතික ප්‍රමිතියකට අනුකූල විය යුතුය. පොළොව මතුපිට පාවිච්චි කරන ජලනල ඒ සඳහා වූ 1986 අංක 6730 හා ඊට කලින් කල කෙරෙන සංශෝධනයන්ට හෝ වෙනත් ජාතික ප්‍රමිතියකට අනුකූල විය යුතුය.

(iv) පෞද්ගලික ජල සේවා සම්බන්ධතාවන් ඉදිකිරීම සඳහා පාවිච්චි කරනු ලබන සියළුම ගැල්වනයිස් සිද්ධ යකඩ ජලනල 1985 අංක 1387 දරන බ්‍රිතාන්‍යප්‍රමිතියට හා ඊට කලින් කල කෙරෙන සංශෝධනයන්ට අනුකූල විය යුතුය.

(v) වෙනත් වර්ගයක ජල නල හෝ ඒ ඒ අවස්ථාවේ දී පාවිච්චි කෙරෙන වෙනත් ජලනල වර්ග ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පානීය ජල සැපයීමට සුදුසු බවට අනුමැතිය ලැබූ ඒවා විය යුතු අතර, පිළිගත් ජාතික හෝ අන්තර්ජාතික ප්‍රමිතියකට අනුකූල විය යුතුය.

11. ජල සේවා යටතේ යම් ස්ථානයකට සපයනු ලබන ජලය ප්‍රමාණය මැනීම සඳහා යොදනු ලබන මාපකය සහ සවිකිරීම සහ නඩත්තු කිරීම සඳහා වන වියදම් ඉල්ලුම්කරු දැරිය යුතුය.

12. යම් මාපකයක් ආරම්භයේ දී හෝ අවසානයේ දී පිළිවෙලින් සටහන් කරන ප්‍රථම මාපක කියවීම් හා අවසාන මාපක කියවීම අතර වෙනස සැළකිල්ලට ගෙන ඒ මාසය තුළ පරිභෝජනය කරන ලද ප්‍රමාණය මෙහි පහත සඳහන් පරිදි ගණන් බැලිය යුතුය.

(අ) අළුතින්සවිකරන ලද මාපකයක් සම්බන්ධයෙන් වූ විට ප්‍රථම කියවීම එම මාපකය සවිකරන ලද අවස්ථාව යටතේ සඳහන් කරන ලද කියවීම වන අතර, වෙනයම් අවස්ථාවක පෙරාතුවම වූ මාසය සඳහා වූ අවසාන කියවීම ප්‍රථම කියවීම වන්නේය. යම් මාසයක් සඳහා වූ අවසාන කියවීම ඒ මාසයේ අවසාන වීමෙන් දින 10කට ප්‍රථම හෝ පසුව යෙදෙන දිනයක් නොවන යම් දිනක කරන ලද කියවීම වන්නේය. එසේ වුවද, අළුත්වැඩියා කිරීමක් සඳහා මාපකය ඉවතට ගෙනයන ලදුව එකී කාලය තුළදී අවසාන කියවීම සටහන් කරනු නොලැබිය හැකි අවස්ථාවක එම මාපකය ඉවතට ගෙනයාමට ප්‍රථම අවසාන කියවීම කරනු ලැබිය යුතුය.

(ආ) යම් මාසයක් තුළ යම් ස්ථානයකදී මාපක දෙකක් හෝ වැඩි ගණනක් පාවිච්චි කරන ලද නම්, එම මාපකවල සඳහන් ප්‍රමාණවල එකතුව මාසය තුළ පාරිභෝජනය කරන ලද ජල ප්‍රමාණය කරන ලද ප්‍රමාණය වන්නේය.

13. සභාව විසින් මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන ප්‍රකාර සිය ජල පාරිභෝගිකයින් වෙනුවෙන් සැම ලිත් මාසයක් අවසානයේම ඔවුන් පරිභෝජනය කරන ලද ජල පරිමාව පදනම්කොට සභාව විසින් තීරණය කර ප්‍රකාශයට පත්කර ඇති ගාස්තු පදනම් කොට ගෙන බිල්පතක් බැගින් පැහැදිළිව සකස් කොට සැම නිවසකම, පාරිභෝගික ස්ථානයකම අයිතිකරු හෝ පදිංචිකරු වෙත භාරදී මුදල් අයකර ගැනීම නිත්‍යානුකූල වන්නේය.

14. යම් ස්ථානයක පදිංචිකරුවකු විසින් තම ස්ථානය වෙත ලබාගත් ජල සේවාව සඳහා යොදා ඇති මාපකයෙහි නිරවද්‍යතාවය කෙරෙහි ප්‍රශ්න කෙරේනම්, එකී පදිංචිකරුගේ ඉල්ලීම පිට හා ඔහු විසින් අදාළ සභාව විසින් නියම කරනු ලබන පරීක්ෂණ ගාස්තුවක් කලින් ගෙවන ලද කල්හි එකී පදිංචිකරු ඉදිරියේ හෝ ඔහු විසින් බලය දෙන නියෝජිතයෙකු ඉදිරියේ සභාව විසින් බලය දෙන නිලධාරියෙකු විසින් හෝ එම මාපකය පරීක්ෂා කරනු ලැබීමට සැලැස්විය යුතුය.මෙම පරීක්ෂකයා ජාතික ජල සම්පාදන මණ්ඩලයේ අනුමැතිය ලැබූ පිළිගත් තාක්ෂණ හැකියාවක් සහිත අයෙකු විය යුතුය. එම පරීක්ෂණයෙහි ප්‍රතිඵලය පදිංචිකරු කෙරෙහි අනුගම්‍ය විය යුතු අතර, එකී පරීක්ෂණ ප්‍රතිඵල අනුව මාපකය නිවැරදි කරනු ලැබිය යුතුය.

15. (i) පෞද්ගලික ජල සේවා සම්බන්ධයක් අපේක්ෂා කරන්නෙකු විසින් ජල සේවාව අපේක්ෂිත කාර්යය පැහැදිළිව සඳහන් කර, මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් වීමෙන් පසු, එකී ඉල්ලීම ඉටුකළ හැකි බව සභාවට සම්මුතියකින් තීරණය කිරීමෙන් පසු අදාළ පෞද්ගලික ජල සේවා සැපයීම සිදුකළ යුතුය.

(ii) සභාව වෙත පෞද්ගලික ජල සේවා සම්බන්ධයක් ලබාගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමෙහි ඇතුළත් කාර්යය ඉටුකිරීමේ දී සභාව විසින් සමස්ථ ජල සේවාවන් සැපයීමේ කාර්යය අඛණ්ඩව හා විධිමත්ව පවත්වාගෙන යාමට බාධාවන බවට තාක්ෂණික වාර්තා මත සභාවෙහි තීරණය සම්මත කරන්නේ නම්, එකී

ඉල්ලීම ඉටුකිරීම සභාව විසින් ප්‍රතික්ෂේප කළ හැකි අතර, එසේ ප්‍රතික්ෂේප කරන්නේ නම්, එකී ප්‍රතික්ෂේප කිරීමට හේතු වූ කරුණු සඳහන් කර, තීරණය ගනු ලැබූ දින සිට දින 30ක් ඇතුළත ඉල්ලුම්කරු වෙත පිළිතුරු යැවිය යුතුය.

(iii) (අ) පෞද්ගලික ජල සේවාලාභියෙකු විසින් සිය ජල සේවාවට අදාළ ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් කර ඇති කාර්යයන් හැර වෙනත් කිසිදු කාර්යක් සඳහා පෞද්ගලික ජල සේවා සම්බන්ධය මඟින් ජලය යොදා නොගත යුතුය.

(ආ) කිසියම් පෞද්ගලික ජල සේවාවක් සම්බන්ධයෙන් මෙම වගන්ති iii (අ) උල්ලංඝනය වන බවට වාර්ථාවීමෙන් පසු ඊට අදාලව දැන්වීමක් භාරදී තිබියදී තවදුරටත් උල්ලංඝනය වේ නම් අදාල ජල සේවාව පූර්ව දැනුම්දීමකින් පසු විසන්ධි කරනු ලැබිය හැක.

(iv) සභාවේ නිසි අවසරයකින් තොරව ලබා ගන්නා සියළුම ජල සේවා සම්බන්ධයන් අනවසර ජල සේවා සම්බන්ධයන් වන අතර, ඒ සම්බන්ධයෙන් පැමිණිලි ලැබුන විට, ඒවා පරීක්ෂා කර ලබා එම ජල සේවාව විසන්ධි කිරීම අදාළ සභාපතිවරයා හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ පළාත් පාලන ආයතනයේ නිලධාරියකු විසින් සිදුකළ හැකිය.

16. පෞද්ගලික ජල සේවා සම්බන්ධයක කොටසක් වන යම් කරාමයකින්, නලයකින්, මාපකයකින් හෝ වෙනයම් සවිකිරීමකින් හෝ ජලය අපතේ යන බව දැනගත් කවර විටක වුවද සභාපතිවරයා විසින් නිලධාරියෙකු විසින් එකී ජල සේවා සම්බන්ධයෙන් වහාම විසන්ධි කළ හැකි අතර, එලෙස අපතේ යාමට හේතු වූ වරද එකී ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් හෝ නිවැරදි කරනු ලබන තුරු එම සේවය නැවත සම්බන්ධ කරනු නොලැබිය යුතුය.

17. පෞද්ගලික ජල සේවා සම්බන්ධයෙන් ලබාදීමෙන් අනතුරුව එකී සේවාව පවත්වාගෙන යාමේදී සේවාලාභියා විසින් ජල සේවයේ කොටසක් වන යම් කරාමයකින්, නලයකින්, මාපකයකින් හෝ වෙනයම් සවිකිරීමකින් ජලය අපතේ යන බවට හෝ එමඟින් පරිසර හානියක් හෝ සෞඛ්‍යයට හානියක් සිදුවන බවට එකී සේවාලාභියා හෝ කවරෙකු හෝ අදාළ පළාත් පාලන ආයතනය වෙත පැමිණිල්ලක් කෙරෙන්නේ නම්, එකී පැමිණිල්ල සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේ බලය අදාළ පළාත් පාලන ආයතනයේ ප්‍රධානියා හා ඔහුගේ බලයලත් නිලධාරියෙකු සතු වන්නේය.

18. පළාත් පාලන ආයතනය විසින් ජල යෝජනා ක්‍රම සඳහා උපයෝගී කොට ගනු ලබන ජල මූලාශ්‍රයන්ගේ පවිත්‍රතාවය, නිසි පැවැත්ම හා ආරක්ෂාව පිළිබඳ නිරන්තර අවධානය යොමු කළ යුතු අතර, යටත් පිරිසෙයින් මාස තුනකට වරක් හෝ ආරක්ෂිත පානීය ජලය සැපයීම සඳහා එකී මූලාශ්‍ර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නියමකරනු ලැබිය හැකි ප්‍රමිතීන්ට හා උපදෙස්වලට අනුව පවිත්‍ර කළ යුතුය.

19. සභාව විසින් ජල සම්පාදන යෝජනා ක්‍රම ඉදිකිරීමේදී, පවත්වගෙනයාමේ දී, නඩත්තු කිරීමේදී, සේවා ව්‍යාප්ත කිරීමේ දී, ගාස්තු අය කිරීම යන සෑම අවස්ථාවකදීම එකී ජල යෝජනා ක්‍රමයෙන් සේවය ලැබිය යුතු සෑම පුද්ගලයෙකුගේම, ජනකොටසගේම අවම ජල අවශ්‍යතා සපුරාලන අයුරු සාධාරණත්වයේ මූලධර්මය මත පිහිටා සේවා සැපයීමට බැඳී සිටිය යුතු වන්නේය.

20. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ ජලය සපයනු ලබන ගොඩනැගිල්ලක හෝ ස්ථානයක පදිංචිකරුවකු වෙත එක් පැයකට නොඅඩු කාලයකින් දැනුම්දීමකට පසු පළාත් පාලන ආයතනයේ ප්‍රධානියාට හෝ ඔහු විසින් ඒ සඳහා බලය දෙන ලද යම් තැනැත්තෙකුට ජල නලවල ජල කර්මාන්තයේ සවිකිරීම්වල තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා ද, ජලය අපතේ යාමෙන් හෝ ජලය අනිසි ලෙස පාවිච්චි කිරීමක් වන්නේදැයි නිසකවම දැනගැනීම සඳහා ද, ඒ ගොඩනැගිල්ලට හෝ ස්ථානයට පෙ.ව.08.00 සිට ප.ව.05.00 දක්වා කාලය තුළ ඕනෑම වේලාවක ඇතුල්විය හැකිය. යම් වේලාවක දී ඒ ස්ථානයට ඇතුල්වීමට පළාත් පාලන ආයතනයේ ප්‍රධානියාට හෝ අනෙකුත් තැනැත්තාට සෑහෙන හේතුවක් නොමැතිව අවසර දෙනු නොලැබුවහොත් හෝ එවැනි පරීක්ෂණයක් පවත්වනු ලැබීමෙන් සෑහෙන හේතු නොමැතිව ඔහු වළක්වනු ලැබුවහොත් ඒ ගොඩනැගිල්ලට ස්ථානයට දී තිබෙන ජල සම්පාදනය පළාත් පාලන ආයතනයෙහි ප්‍රධානියා විසින් නතර කරනු ලැබිය හැකිය.

21. මෙම අතුරුව්‍යවස්ථාවන්හි සඳහන් කවර හෝ විධිවිධානයන් සම්බන්ධයෙන් වන උල්ලංඝනය කිරීමක් වරදක් වන අතර,මේ අතුරු ව්‍යවස්ථාවේ කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඬය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, 255 වන අධිකාරය වන නගර සභා ආඥා පනතේ 153 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතුය.

22. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,

"සභාව"යන්නෙන් වත්තල මාබෝල නගර සභාව අදහස් වේ.

"සභාපති"යන්නෙන් වත්තල මාබෝල නගර සභාවේ සභාපතිවරයා අදහස් වේ.

"නගර සභා බල ප්‍රදේශය"යන්නෙන් වත්තල මාබෝල නගර සභාව සංස්ථාපනය වූ බල ප්‍රදේශය අදහස් වේ.

"බලය පවරන ලද නගර සභාවේ යම් නිලධාරියෙක්"යන්නෙන් වත්තල මාබෝල නගර සභාවේ සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමට බලය පවරනු ලබන නිලධාරියා හෝ නිලධාරීන් අදහස් වේ.

"බලපත්‍රධාරියා"යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් තැනැත්තෙකු අදහස් කරනු ලැබේ.

"තැනැත්තා" යන්නට සංස්ථාගත කරන ලද හෝ නොකරන ලද පුද්ගල මණ්ඩලයක්ද ඇතුළත් වේ.

"පාලනය භාර තැනැත්තා" යන්නට භාරකරුවෙක්, ආරක්ෂකයෙක්, දේපළ ආරක්ෂකයෙක්, කළමණාකරුවෙක් හෝ යම් තැනැත්තෙක් වෙන්වෙන් යම් ව්‍යාපාරයක සංවිධානය, පාලනය හෝ කළමණාකරණය පැවරී ඇති වෙනත් තැනැත්තෙකුද ඇතුළත් වේ.

23. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨය ප්‍රමුඛ වේ.

## වත්තල මාබෝල නගර සභාවේ ජලනල එලීම හා භූගත රැහැන් ඇදීම පාලනය කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. මෙම අතුරු ව්‍යවස්ථාව වත්තල මාබෝල නගර සභා බල ප්‍රදේශය තුළ නගර සභාව මගින් පාලනය වන මංමාවත්වල විවිධ රාජ්‍ය, අර්ධ රාජ්‍ය, සංස්ථා,මණ්ඩල, සමාගම් හා පුද්ගලයින් විසින් ජලනල එලීම හා භූගත රැහැන් ඇදීම හා කැනීම් කිරීම පාලනය කිරීම හා ගාස්තු අය කිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලබයි.

2. මෙම අතුරු ව්‍යවස්ථාව වත්තල මාබෝල නගර සභාවෙහි ජලනල එලීම හා භූගත රැහැන් ඇදීම පාලනය කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වත්තල මාබෝල නගර සභාව විසින් තීරණය කරනු ලබන ගාස්තු ගෙවා ලබාගන්නා ලද අවසරපත්‍රයක් නොමැතිව කවර හෝ පුද්ගලයෙකු හෝ ආයතනයක් විසින් වත්තල මාබෝල නගර සභා පාලනය යටතේ පවතින කිසිදු මංමාවතක කිසිදු කැනීම් කටයුත්තක් නොකළයුතුය.

4. වත්තල මාබෝල නගර සභාවේ අධිකාරි බලයට අයත් වන මංමාවතක් සම්බන්ධ කරමින් යම් ආයතනයක් හෝ තැනැත්තෙක් විසින් ජලනල එලීමක් හෝ භූගත රැහැන් ඇදීමක් සිදුකිරීමේ දී හෝ වෙනත් කැනීම් කිරීමකදී එය සිදුකිරීමට පෙර මෙම අතුරු ව්‍යවස්ථාව සාරාණුකූලව ඉදිරිපත් කරන ඉල්ලුම්පත්‍රයක් සභාපති වෙත ඉදිරිපත් කර ඊට අදාළ අවසර පත්‍රයක් ලබාගත යුතුය.

5. අවසරපත්‍රලාභියා විසින් අවසරපත්‍රයේ සඳහන් කාර්යය ඉටුකිරීමේදී සභාව සතු දේපලවලට සිදුවූ හානිය යථා තත්ත්වයට පත්කිරීම සඳහා වැයවන මුදල තැන්පත් මුදලින් අයකර ගැනීමෙන් අනතුරුව තැන්පත් කරන ලද තැන්පත් මුදලින් යම් මුදලක් ඉතිරි වී ඇත්නම් එසේ ඉතිරි වන තැන්පත් මුදල ඉල්ලුම්කරු වෙත මුදාහැරියයුතුය.

6. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ජලනල හෝ භූගත රැහැන් ඇදීම සඳහා භූගත කැනීම් සිදුකරන අවස්ථාවකදී මංමාවතට අදාළ කාණුවකට, කාණුවේ බැම්මකට, පැති බැම්මකට, බෝක්කුවකට, සපත්තු පාලමකට, වේල්ලකට, පාලමකට, සංඥා කුළුණකට, සැතපුම් කණුවකට, පාරෙහි රැකවරණය සඳහා ඉදිකර ඇති කිසියම් ආධාරකයකට හෝ මහජන ආරක්ෂාව හා ප්‍රයෝජනය පිණිස සකස් කර ඇති යම් දෙයකට හානි වන පරිදි කටයුතු නොකළ යුතුය.

7. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ භූගත නල හෝ භූගත රැහැන් අළුත්වැඩියා කටයුතු කිරීම සඳහා භූමිය තුළ නැවත කැනීම් කටයුතු සිදුකරන්නේ නම් අදාළ ආයතනය හෝ තැනැත්තා විසින් ගෙවා අවසර පත්‍රයක් ලබාගත යුතුය.ඒ සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සඳහන් විධිවිධාන අනුව නැවත අවසර පත්‍රයක් ගත යුතුය.

8. භූගතව නල සහ රැහැන් සවිකිරීම කළ නොහැකි ස්ථානයක දී වීථියකට හෝ වීථිවලට අවහිර නොවන ආකාරයට හා මහජනතාවට පීඩාවක් නොවන පරිදි පොළවට සමීපව පොළව මත මාර්ගයේ සුදුසුම ස්ථානයක සභාපති විසින් බලය පවරන ලද නිලධාරියෙකුගේ උපදෙස් හා අධීක්ෂණය මත එම නල එලීමක් කළ හැකිය.

9. අවසර පත්‍රයලත් කිසිදු තැනැත්තෙකු විසින් මංමාවත පිහිටි කාණුවක ජලය පහසුවෙන් බැස යාමට අවහිර වන පරිදි භූගත නල හෝ රැහැන් එලීම නොකළ යුතුය.

10. අවසරපත් ලාභියා විසින් හෝ ආයතනය විසින් කැනීම් කටයුතු අවසන් වූ වහාම හෝ සති දෙකක් ඇතුළත කැනීම් ප්‍රදේශය ශක්තිමත්ව යථා තත්ත්වයට පත් කළ යුතුය.

11. මෙහි වගන්තියෙහි සඳහන් කාලසීමාව තුළ කැනීම් ප්‍රදේශය යථා තත්ත්වයට පත්කරන තුරු මහජනයාට සිදුවිය හැකි ගමනාගමන හා ප්‍රවාහන බාධාවන් හා අනතුරු අවම කිරීම සඳහා හා පහත සඳහන් ක්‍රියාමාර්ග අතරින් සුදුසු ක්‍රියාමාර්ග අවසරපත් ලාභියා විසින් සිදුකලයුතුය.

(i) කපන ලද පස් ඉවත් කිරීම,
(ii) රතු කොඩියක් හෝ අනතුරු හඟවන වෙනත් සංඥාවක් යෙදීම,
(iii) රාත්‍රී කාලයේ රතු වර්ණ සහිත ආලෝක යෙදීම,
(iv) විකල්ප මාර්ග නම් කිරීම,
(v) මුරකරුවන් යෙදීම,
(vi) අනතුරු පිළිබඳව දැනුවත් කරන පුවරු සවිකිරීම,
(vii) වෙනත් සුදුසු ක්‍රියාමාර්ග.

12.පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍යවන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,

"සභාව" යන්නෙන් වත්තල මාබෝල නගර සභාව අදහස් වේ.
"සභාපති" යන්නෙන් වත්තල මාබෝල නගර සභාවේ සභාපතිවරයා අදහස් වේ.
"නගර සභා බල ප්‍රදේශය" යන්නෙන් වත්තල මාබෝල නගර සභාව සංස්ථාපනය වූ බල ප්‍රදේශය අදහස් වේ.
"බලය පවරන ලද නගර සභාවේ යම් නිලධාරියෙක්" යන්නෙන් වත්තල මාබෝල නගර සභාවේ සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමට බලය පවරනු ලබන නිලධාරියා හෝ නිලධාරීන් අදහස් වේ
"බලපත්‍රධාරියා" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් තැනැත්තෙකු අදහස් කරනු ලැබේ.
"තැනැත්තා" යන්නට සංස්ථාගත කරන ලද හෝ නොකරන ලද පුද්ගල මණ්ඩලයක්ද ඇතුළත් වේ.
"පාලනය භාර තැනැත්තා" යන්නට භාරකරුවෙක්, ආරක්ෂකයෙක්, දේපළ ආරක්ෂකයෙක්, කළමණාකරුවෙක් හෝ යම් තැනැත්තෙක් වෙන්වෙන් යම් ව්‍යාපාරයක සංවිධානය, පාලනය හෝ කළමණාකරණය පැවරී ඇති වෙනත් තැනැත්තෙකුද ඇතුළත් වේ.

13. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨය ප්‍රමුඛ වේ.

## වත්තල මාබෝල නගර සභාවේ ටයර් ටියුබ් වොල්කනයිස් කරන ස්ථාන හා බැටරි ගබඩා කිරීම හා අළුත්වැඩියා කරන ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1 මෙම අතුරු ව්‍යවස්ථාව වත්තල මාබෝල නගර සභා බල ප්‍රදේශය තුළ ටයර් ටියුබ් වොල්කනයිස් කරන ස්ථාන හා බැටරි ගබඩා කිරීම හා අළුත්වැඩියා කරන ස්ථානපවත්වාගෙන යාම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම හා ගාස්තු අය කිරීම සඳහා විධිවිධාන සලසනු පිණිස පනවනු ලැබේ.

2 මෙම අතුරු ව්‍යවස්ථාව වත්තල මාබෝල නගර සභාවේ ටයර් ටියුබ් වොල්කනයිස් කරන ස්ථාන හා බැටරි ගබඩා කිරීම හා අළුත්වැඩියා කරන ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

3. සභාවේ සභාපතිවරයා විසින් තත්කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් මත හැර, කිසිම තැනැත්තකු විසින් (මෙහි මින්මතු බල ප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලබන) වත්තල මාබෝල නගර සභා බල ප්‍රදේශය තුළ, ටයර් ටියුබ් වොල්කනයිස් කරන ස්ථාන හා බැටරි ගබඩා කිරීම හා අළුත්වැඩියා කරන ස්ථාන පවත්වාගෙන යාම නොකළ යුතු ය.

4. කලින් අවලංගු නොකළහොත් මිස එවැනි සෑම බලපත්‍රයක්ම එය නිකුත් කරන ලද්දේ යම් වර්ෂයක් සඳහාද එම වර්ෂයේ දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා බල පැවැත්විය යුතුය.

5 (i) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවට අනුකූල වූ සභාවෙන් ලබාගත් ඉල්ලුම්පත්‍රයක් යටතේ ඒ සඳහා ඉල්ලුම් කළ යුතු ය.

(ii) මෙම වගන්තිය යටතේ ඉල්ලුම් පත්‍රයක් සඳහා වන ගාස්තු සභාව විසින් කලින් කළ තීරණය කර ප්‍රකාශයට පත් කරන ගාස්තු විය යුතු ය.

6. මෙම අතුරුව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා අයකරනු ලබන ගාස්තු සභාව විසින් කලින් කළ යෝජනා සම්මුතියක් මඟින් තීරණය කර ප්‍රකාශයට පත්කරනු ලබන ගාස්තු විය යුතු ය.

7. මෙම අතුරුව්‍යවස්ථාව යටතේ කාර්යය සඳහා වන පරිශ්‍රයෙහි එම කාර්යය සඳහා භාවිතයට ගනු ලබන යම් ස්ථිර ගොඩනැගිල්ලක් වේ නම් එය සභාපති විසින් අනුමත සැළැස්මකට අනුකූලව ඉදි කරන ලද ගොඩනැගිලි විය යුතු අතරම, එම පරිශ්‍රය පහත සඳහන් කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස, එහි කිසිදු තැනැත්තෙකු මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලබාගැනීමට හිමිකමක් නොමැත්තේය.

(i) පරිශ්‍රය හොඳ ප්‍රතිසංස්කරණ තත්ත්වයකින් සහ මනා වාතාශ්‍රයක් හා ආලෝකයක් ලැබෙන පරිදි සකස් කර තිබිය යුතු අතර, සෑම කාමරයක් විවෘත කළවිට ගෙබිමේ ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට නොඅඩු ප්‍රමාණයේ ජනෙල් සවිකර තිබිය යුතුය.

(ii) සෑම කාමරයකම බිත්තිවල සෑම කොටසක උස මීටර් 2.14 ට නොඅඩු විය යුතුය අතර, ගඩොල්, කළුගල්, කබොක් හෝ සිමෙන්ති ගල්වලින් සාදා තිබිය යුතුය. බිත්තිවල ඇතුල් පැති අවම වශයෙන් ගෙබිමේ සිට මීටර් 2 ක් උසට සිමෙන්ති බදාම යොදා කපරාදු කොට තිබිය යුතු අතර, ඉතිරි කොටස හුණු බදාම යොදා කපරාදු කොට වර්ණ ආලේප කර තිබිය යුතුය.

(iii) සෑම පියසි කෙළවරකම ගෙබිමේ සිට මීටර් 2 ට වැඩි උසකින් තිබිය යුතුය.

(iv) වහලය යම් ස්ථිර ද්‍රව්‍යයකින් සාදා තිබිය යුතුය.

(v) දැව කර්මාන්ත සියල්ල තීන්ත අලේප කර තිබිය යුතු ය.

(vi) සම්පූර්ණ ගෙබිම ස්ථිර ද්‍රව්‍යකින් තනවා තිබිය යුතුය.

(vii) පරිශ්‍රය ප්‍රමාණවත් ජලවහනයක් සිදුවන පරිදි ඉදිකර තිබිය යුතුය.

(viii) පරිශ්‍රයෙහි සනීපාරක්ෂක කසළ භාජන සහ ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතුය.

(ix) ප්‍රමාණවත් ගිනි ආරක්ෂණ පහසුකම් සපයා තිබිය යුතු ය.

(x) වාහන නවතා තැබීම සඳහා ප්‍රමාණවත් පහසුකම් තිබිය යුතු ය.

(xi) ප්‍රථමාධාර සඳහා පහසුකම් සපයා තිබිය යුතු ය.

(xii) හදිසි අනතුරු ලේඛනයක් පවත්වාගත යුතු ය.

8. මෙම අතුරුව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක්ලත් බලපත්‍රධාරියෙකු විසින්ම,

(ix) පරිශ්‍රයෙහි එක්රැස්වන අපද්‍රව්‍ය නිසි පරිදි බැහැර කරන තෙක් සංවෘත බහාලුම් යටතේ පීඩාවන් ඇති නොවන පරිදි පවත්වාගත යුතුය.

(x) පරිශ්‍රයෙහි කර්මාන්තයට අදාළ වන ද්‍රව්‍ය අන්තරායකාරී හෝ හානිකර ස්වභාවයකින් තොරව පවත්වාගත යුතු ය.

(xi) බලපත්‍රලත් පරිශ්‍ර තුළ ජනනය වන සියළුම අපද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස,

(අ) ජෛවහායන අපද්‍රව්‍ය
(ආ) වීදුරු
(ඇ) කඩදාසි
(ඈ) පොලිතීන් හෝ ප්ලාස්ටික්
(ඉ) යකඩ හෝ වෙනත් ලෝහ
(ඊ) අන්තරායකර අපද්‍රව්‍ය
වශයෙන් වර්ගීකරණය කර වෙන් වෙන් වූ භාජන යටතේ පවත්වාගත යුතු ය.

(xii) ආයතනයෙහි සේවයට යොදවා ඇති සේවකයින් සම්බන්ධයෙන් මුඛ වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා දී තිබිය යුතු අතර, එය සේවයෙහි නියුතු අවස්ථාවන්හි පැළඳ සිටිය යුතු ය.

(xiii) සේවයේ නියුතු සියළුම සේවකයින් සම්බන්ධයෙන් සෞඛ්‍ය ආරක්ෂණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු ය.

(xiv) පරිශ්‍රයෙන් බැහැර කරන අපද්‍රව්‍ය සභාව විසින් ක්‍රියාත්මක කරන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනට අනුකූලව බැහැර කළ යුතු ය.

(xv) නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදා ගැනෙන උපකරණ නිසි නඩත්තුවකින් යුතු ව ආරක්ෂිතව පවත්වාගත යුතු ය.

(xvi) සෑම මාස හයකටම වරක් පරිශ්‍රයෙහි ගිනි ආරක්ෂණ පියවර පිළිබඳ පිළිගත හැකි ආයතනයකින් යෝජනා වාර්තා ලබා ගත යුතු ය.

9 සෑම බලපත්‍රධාරියෙකුම කර්මාන්තය කරගෙන යාම සඳහා අවශ්‍යවන සියළු ද්‍රව්‍ය හා අවශ්‍ය අනෙකුත් දෑ දුගඳ හැමීම හෝ වෙනත් පීඩාවක් ඇතිවීම වැළැක්වෙන පරිදි ගබඩාකර තැබිය යුතුය.

10. සෑම බලපත්‍රධාරියෙකුම, යම්කිසි නිෂ්පාදන ක්‍රියාවලියකදී විමෝචනය වන පීඩාකාරී ශබ්ද, වාෂ්ප හෝ වායු, ඒවා විහිදී යාමේදී හානිකර හෝ පීඩාකාරී ප්‍රතිඵල හට ගැනීමට ඉඩ නොලැබෙන ආකාරයකින් හා උසකින් වායුගෝලයට මුදා හැරීම කළ යුතුය. නැතහොත් ගින්දර හෝ සනීකරණ උපකරණයක් තුළින් පිටවීමට සැළැස්විය යුතුය.

11. සෑම බලපත්‍රධාරියෙකුම, තම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ප්‍රමාණවත් කාණු තනවා මැනවින් නඩත්තු කළ යුතු අතර, ඒවා දිනපතා සේදීම කළ යුතුය.

12. සෑම බලපත්‍රධාරියෙකුම, තම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ගෙබිම, යම් අපාරගම්‍ය ද්‍රව්‍යයකින් ඉදිකරවිය යුතු අතර, හොඳ ප්‍රතිසංස්කරණ තත්ත්වයෙන් නඩත්තු කිරීමත්, දිනපතා ශුද්ධ පවිත්‍ර කිරීමත් කළ යුතුය.

13. සෑම බලපත්‍රධාරියෙකුම, ව්‍යාපාර කරගෙන යනු ලබන කාලයේදී, වාර්ෂිකව එම පරිශ්‍රයේ වර්ණ ආලේප කළ යුතුය.

14. සෑම බලපත්‍රධාරියෙකුම, ව්‍යාපාරික කටයුතුවලදී භාවිතා කරනු ලබන උපකරණ හා භාජන ඇතුළු සියළු ආම්පන්න පිරිසිදු කර තබා ගත යුතුය.

15. සෑම බලධාරියෙකුම, ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි කසළ, අතුගා එකතු කරනු ලබන බොල්, රොඩු සමඟ අපතේ ගිය ද්‍රව්‍ය හා අතුරු නිෂ්පාදන, ඒවා තවදුරටත් ව්‍යාපාර කටයුතුවලට වහාම නොයොදවන්නේ නම්, ආවරණය කරන ලද භාජනවල බහා සභාපති විසින් නියම කරන ආකාරයට බැහැර කළ යුතු ය.

16. සෑම බලපත්‍රධාරියෙකුම, වෙනත් ද්‍රව්‍යයක් සේදීම හෝ පෙඟවීම සඳහා භාවිතා කරනු ලබන ටැංකි, දුගඳ හැමීම වැළැක්වීම සඳහා අවශ්‍ය වන පරිදි හිස්කර පවිත්‍ර කළ යුතුය.

17. සෑම බලපත්‍රධාරියෙකුම, යම් ගංඟාවක්, දිය පාරක්, ඇළක්, සොරොව්වක්, ළිඳක්, වැවක් හෝ යම් කාණුවක් යම් අපවිත්‍ර, දුගඳ හමන හෝ පීඩාකාරී ජලය හෝ වෙනත් දියරයක් යැවීමෙන් හෝ ඒ තුළට ගලායාමට සැළැස්වීමෙන් හෝ පීඩාකාරී ද්‍රව්‍යයක් සේදීමෙන් හෝ වෙනත් ආකාරයකින් හෝ එවැනි ගංඟාවක්, දිය පාරක්, ඇළක්, සොරොව්වක්, ළිඳක්, වැවක්, හෝ විවෘත ජල ප්‍රදේශයක් කවර හෝ බැහැර කිරීම් යටතේ අපවිත්‍ර කිරීම නොකළයුතුය.

18. සභාපතිවරයා විසින් හෝ තත්කාර්ය සඳහා ඔහු විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය පවරන ලද නගර සභාවේ යම් නිලධාරියෙකු විසින් අතුරුව්‍යවස්ථාවට අදාළ පරිශ්‍රය අතුරුව්‍යවස්ථාවට අනුකූල ද යන්න පිළිබඳව පරිශ්‍රයට ඇතුළු වී පරීක්ෂාකර බැලීම නීත්‍යානුකූල වන්නේය. තවද බලපත්‍රලාභියා හෝ එහි පාලනය භාර තැනැත්තා එවැනි පරීක්ෂණයක් කිරීම සඳහා ඉඩදිය යුතු වන්නේය.

19. බලපත්‍රලත් පරිශ්‍රයක්, මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් විධිවිධාන වලට අනුකූල නොවන බව පරීක්ෂණයකදී අනාවරණය වූ අවස්ථාවක, යථෝක්ත පරිශ්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූල කරවීම සඳහා කළයුතු කාර්යයන්, නියමිත කාලයක් ඇතුළත දී ඉටුකරන ලෙස, බලපත්‍රධාරියාට ලිඛිතව දැන්වීමට සභාපතිවරයාට බලය ඇත්තේය. තවද, යථෝක්ත දැන්වීමේ විධිවිධාන ප්‍රකාර බලපත්‍රධාරියා විසින් ක්‍රියා කළ යුතුය. එසේ ක්‍රියා නොකරන්නේ නම්, එවැනි අවස්ථාවක බලපත්‍රය අවලංගු කිරීමට සභාපතිවරයාට බලය ඇත්තේය.

20. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් ලබාගැනීම පිණිස යම් තැනැත්තෙකු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් තමා වෙත ලැබී දින 30 ක් ඇතුළත, පරිශ්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවලට අනුකූල වන්නේ නම් බලපත්‍රය නිකුත් කිරීම හෝ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන්නේ නම් ඊට හේතු ඉල්ලුම්කරුට දන්වා යැවීම සභාපතිවරයාගේ කාර්යය වන්නේය.

21. සෑම බලපත්‍රලාභියෙකු විසින් ම බලපත්‍රය සහ බලපත්‍රයට අදාළ කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ සේවා නියුක්තිකයන්ගේ නම් සහ ලිපිනයන් සිංහල හා දෙමළ භාෂාවලින් දැක්වෙන ලැයිස්තුවක් බලපත්‍රලාභී ස්ථානයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක එල්ලා තැබීමට සැළැස්වියයුතුය.

22. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ කරනු ලබන සෑම දැන්වීමක්ම අවස්ථෝචිත පරිදි අයිතිකරු හෝ එම ස්ථානයේ භාරකරු වෙත භාර දිය යුතුය. එවැන්නෙකු නොමැති විට බලපත්‍රලත් ස්ථානයේ ප්‍රකටව පෙනෙන පරිදි අලවා තැබිය යුතුය. එවැනි දැන්වීමකට ස්ථානයේ අයිතිකරුගේ හෝ පරිහරණය කරන අයගේ නම සඳහන් කිරීම අවශ්‍ය නොවිය යුතුය.

23. මේ අතුරු ව්‍යවස්ථාවේ කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවාකරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, 255 වන අධිකාරය වන නගර සභා ආඥා පනතේ 153 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතුය.

24. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,

"සභාව" යන්නෙන් වත්තල මාබෝල නගර සභාව අදහස් වේ.

"සභාපති" යන්නෙන් වත්තල මාබෝල නගරසභාවේ සභාපතිවරයා අදහස් වේ.

"නගර සභා බල ප්‍රදේශය"යන්නෙන් වත්තල මාබෝල නගර සභාව සංස්ථාපනය වූ බල ප්‍රදේශය අදහස් වේ.

"බලය පවරන ලද නගර සභාවේ යම් නිලධාරියෙක්"යන්නෙන් වත්තල මාබෝල නගර සභාවේ සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමට බලය පවරනු ලබන නිලධාරියා හෝ නිලධාරීන් අදහස් වේ.

"බලපත්‍රධාරියා" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් තැනැත්තෙකු අදහස් කරනු ලැබේ.

"තැනැත්තා" යන්නට සංස්ථාගත කරන ලද හෝ නොකරන ලද පුද්ගල මණ්ඩලයක්ද ඇතුළත් වේ.

"පාලනය භාර තැනැත්තා" යන්නට භාරකරුවෙක්, ආරක්ෂකයෙක්, දේපළ ආරක්ෂකයෙක්, කළමනාකරුවෙක් හෝ යම් තැනැත්තෙක් වෙන්වෙන් යම් ව්‍යාපාරයක සංවිධානය, පාලනය හෝ කළමනාකරණය පැවරී ඇති වෙනත් තැනැත්තෙකු ද ඇතුළත් වේ.

25. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨය ප්‍රමුඛ වේ.

## වත්තල මාබෝල නගර සභාවේ පාවහන් හා බූට්ස් නිෂ්පාදන ආයතනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

01. මෙම අතුරු ව්‍යවස්ථාව වත්තල මාබෝල නගර සභා බල ප්‍රදේශය තුළ පාවහන් හා බූට්ස් නිෂ්පාදන ආයතනය පවත්වාගෙන යාම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම හා ගාස්තු අය කිරීම සඳහා විධිවිධාන සලසනු පිණිස පනවනු ලැබේ.

02. මෙම අතුරු ව්‍යවස්ථාව වත්තල මාබෝල නගර සභාවේ පාවහන් හා බූට්ස් නිෂ්පාදන ආයතනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

03. සභාවේ සභාපතිවරයා විසින් තත්කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් මත හැර, කිසිම තැනැත්තකු විසින් (මෙහි මින්මතු බල ප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලබන) වත්තල මාබෝල නගර සභා බල ප්‍රදේශය තුළ, පාවහන් හා බූට්ස් නිෂ්පාදන ආයතනය පවත්වාගෙන යාම නොකළ යුතු ය.

04. කලින් අවලංගු නොකළහොත් මිස එවැනි සෑම බලපත්‍රයක්ම එය නිකුත් කරන ලද්දේ යම් වර්ෂයක් සඳහාද එම වර්ෂයේ දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා බල පැවැත්විය යුතුය.

05. (i) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවට අනුකූල වූ සභාවෙන් ලබාගත් ඉල්ලුම් පත්‍රයක් යටතේ ඒ සඳහා ඉල්ලුම් කළ යුතු ය.

(ii) මෙම වගන්තිය යටතේ ඉල්ලුම් පත්‍රයක් සඳහා වන ගාස්තු සභාව විසින් කලින් කල තීරණය කර ප්‍රකාශයට පත් කරන ගාස්තු විය යුතු ය.

06. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා අයකරනු ලබන ගාස්තු සභාව විසින් කලින් කල යෝජනා සම්මුතියක් මගින් තීරණය කර ප්‍රකාශයට පත්කරනු ලබන ගාස්තු විය යුතු ය.

07. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ කාර්යය සඳහා වන පරිශ්‍රයෙහි එම කාර්යය සඳහා භාවිතයට ගනු ලබන යම් ස්ථිර ගොඩනැගිල්ලක් වේ නම් එය සභාපති විසින් අනුමත සැළැස්මකට අනුකූලව ඉදි කරන ලද ගොඩනැගිලි විය යුතු අතරම, එම පරිශ්‍රය පහත සඳහන් කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස, එහි කිසිදු තැනැත්තෙකු මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලබාගැනීමට හිමිකමක් නොමැත්තේය.

(i) පරිශ්‍රය හොඳ ප්‍රතිසංස්කරණ තත්ත්වයකින් සහ මනා වාතාශ්‍රයක් හා ආලෝකයක් ලැබෙන පරිදි සකස් කර තිබිය යුතු අතර, සෑම කාමරයක් විවෘත කළවිට ගෙබිමේ ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට නොඅඩු ප්‍රමාණයේ ජනෙල් සවිකර තිබිය යුතුය.

(ii) සෑම කාමරයකම බිත්තිවල සෑම කොටසක උස මීටර් 2.14 ට නොඅඩු විය යුතුය අතර, ගඩොල්, කළුගල්, කබොක් හෝ සිමෙන්ති ගල්වලින් සාදා තිබිය යුතුය. බිත්තිවල ඇතුල් පැති අවම වශයෙන් ගෙබිමේ සිට මීටර් 2 ක් උසට සිමෙන්ති බදාම යොදා කපරාදු කොට තිබිය යුතු අතර, ඉතිරි කොටස හුණු බදාම යොදා කපරාදු කොට වර්ණ ආලේප කර තිබිය යුතුය.

(iii) සෑම පියසි කෙළවරකම ගෙබිමේ සිට මීටර් 2 ට වැඩි උසකින් තිබිය යුතුය.

(iv) වහලය යම් ස්ථිර ද්‍රව්‍යයකින් සාදා තිබිය යුතුය.

(v) දැව කර්මාන්ත සියල්ල තීන්ත අලේප කර තිබිය යුතු ය.

(vi) සම්පූර්ණ ගෙබිම ස්ථිර ද්‍රව්‍යකින් තනවා තිබිය යුතුය.

(vii) පරිශ්‍රය ප්‍රමාණවත් ජලවහනයක් සිදුවන පරිදි ඉදිකර තිබිය යුතුය.

(viii) පරිශ්‍රයෙහි සනීපාරක්ෂක කසළ භාජන සහ ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතුය.

(ix) ප්‍රමාණවත් ගිනි ආරක්ෂණ පහසුකම් සපයා තිබිය යුතු ය.

(x) වාහන නවතා තැබීම සඳහා ප්‍රමාණවත් පහසුකම් තිබිය යුතු ය.

(xi) ප්‍රථමාධාර සඳහා පහසුකම් සපයා තිබිය යුතු ය.

(xii) හදිසි අනතුරු ලේඛනයක් පවත්වාගත යුතු ය.

08. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් බලපත්‍රධාරියෙකු විසින්ම,

09. පරිශ්‍රයෙහි එක්රැස්වන අපද්‍රව්‍ය නිසි පරිදි බැහැර කරන තෙක් සංවෘත බහාලුම් යටතේ පීඩාවන් ඇති නොවන පරිදි පවත්වාගත යුතුය.

10. පරිශ්‍රයෙහි කර්මාන්තයට අදාළ වන ද්‍රව්‍ය අන්තරායකාරී හෝ හානිකර ස්වභාවයකින් තොරව පවත්වාගත යුතු ය.

11. බලපත්‍රලත් පරිශ්‍ර තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස,

(අ) ජෛවභායන අපද්‍රව්‍ය
(ආ) වීදුරු
(ඇ) කඩදාසි
(ඈ) පොලිතීන් හෝ ප්ලාස්ටික්
(ඉ) යකඩ හෝ වෙනත් ලෝහ
(ඊ) අන්තරායකර අපද්‍රව්‍ය

වශයෙන් වර්ගීකරණය කර වෙන් වෙන් වූ භාජන යටතේ පවත්වාගත යුතු ය.

12. ආයතනයෙහි සේවයට යොදවා ඇති සේවකයින් සම්බන්ධයෙන් මුඛ වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා දී තිබිය යුතු අතර, එය සේවයෙහි නියතු අවස්ථාවන්හි පැළඳ සිටිය යුතු ය.

13. සේවයේ නියතු සියලුම සේවකයින් සම්බන්ධයෙන් සෞඛ්‍ය ආරක්ෂණ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතු ය.

14. පරිශ්‍රයෙන් බැහැර කරන අපද්‍රව්‍ය සභාව විසින් ක්‍රියාත්මක කරන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනට අනුකූලව බැහැර කළ යුතු ය.

15. නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදා ගැනෙන උපකරණ නිසි නඩත්තුවකින් යුතු ව ආරක්ෂිතව පවත්වාගත යුතු ය.

16. සෑම මාස හයකටම වරක් පරිශ්‍රයෙහි ගිනි ආරක්ෂණ පියවර පිළිබඳ පිළිගත හැකි ආයතනයකින් යෝජනා වාර්තා ලබා ගත යුතු ය.

17. සෑම බලපත්‍රධාරියෙකුම කර්මාන්තය කරගෙන යාම සඳහා අවශ්‍යවන සියලු ද්‍රව්‍ය හා අවශ්‍ය අනෙකුත් දෑ දුගඳ හැමීම හෝ වෙනත් පීඩාවක් ඇතිවීම වැළැක්වෙන පරිදි ගබඩාකර තැබිය යුතුය.

18. සෑම බලපත්‍රධාරියෙකුම, යම්කිසි නිෂ්පාදන ක්‍රියාවලියකදී විමෝචනය වන පීඩාකාරී ශබ්ද, වාෂ්ප හෝ වායු, ඒවා විහිදී යාමේදී හානිකර හෝ පීඩාකාරී ප්‍රතිඵල හටගැනීමට ඉඩ නොලැබෙන ආකාරයකින් හා උසකින් වායුගෝලයට මුදාහැරීම කළ යුතුය. නැතහොත් ගින්දර හෝ සනීකරණ උපකරණයක් තුළින් පිටවීමට සැලැස්විය යුතුය.

19. සෑම බලපත්‍රධාරියෙකුම, තම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ප්‍රමාණවත් කාණු තනවා මැනවින් නඩත්තු කළ යුතු අතර, ඒවා දිනපතා සේදීම කළ යුතුය.

20. සෑම බලපත්‍රධාරියෙකුම, තම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ගෙබිම, යම් අපාරගම්‍ය ද්‍රව්‍යයකින් ඉදිකරවිය යුතු අතර, හොඳ ප්‍රතිසංස්කරණ තත්ත්වයෙන් නඩත්තු කිරීමත්, දිනපතා ශුද්ධ පවිත්‍ර කිරීමත් කළ යුතුය.

21. සෑම බලපත්‍රධාරියෙකුම, ව්‍යාපාර කරගෙන යනු ලබන කාලයේදී, වාර්ෂිකව එම පරිශ්‍රයේ වර්ණ ආලේප කළ යුතු ය.

22. සෑම බලපත්‍රධාරියෙකුම, ව්‍යාපාරික කටයුතුවලදී භාවිතා කරනු ලබන උපකරණ හා භාජන ඇතුළු සියලු ආම්පන්න පිරිසිදු කර තබා ගත යුතුය.

23. සෑම බලධාරියෙකුම, ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි කසළ, අතුගා එකතු කරනු ලබන බොල්, රොඩු සමඟ අපතේ ගිය ද්‍රව්‍ය හා අතුරු නිෂ්පාදන, ඒවා තවදුරටත් ව්‍යාපාර කටයුතුවලට වහාම නොයොදවන්නේ නම්, ආවරණය කරන ලද භාජනවල බහා සභාපති විසින් නියම කරන ආකාරයට බැහැර කළ යුතු ය.

24. සෑම බලපත්‍රධාරියෙකුම, වෙනත් ද්‍රව්‍යයක් සේදීම හෝ පෙඟවීම සඳහා භාවිතා කරනු ලබන ටැංකි, දුගඳ හැමීම වැළැක්වීම සඳහා අවශ්‍ය වන පරිදි හිස්කර පවිත්‍ර කළ යුතුය.

25. සෑම බලපත්‍රධාරියෙකුම, යම් ගංභාවක්, දිය පාරක්, ඇළක්, සොරොව්වක්, ළිඳක්, වැවක් හෝ යම් කාණුවක් යම් අපවිත්‍ර, දුගඳ හමන හෝ පීඩාකාරී ජලය හෝ වෙනත් දියරයක් යැවීමෙන් හෝ ඒ තුළට ගලායාමට සැලැස්වීමෙන් හෝ පීඩාකාරී ද්‍රව්‍යයක් සේදීමෙන් හෝ වෙනත් ආකාරයකින් හෝ එවැනි ගංභාවක්, දිය පාරක්, ඇළක්, සොරොව්වක්, ළිඳක්, වැවක්, හෝ විවෘත ජල ප්‍රදේශයක් කවර හෝ බැහැර කිරීම් යටතේ අපවිත්‍ර කිරීම නොකළ යුතුය.

26. සභාපතිවරයා විසින් හෝ තත්කාර්ය සඳහා ඔහු විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය පවරන ලද නගර සභාවේ යම් නිලධාරියෙකු විසින් අතුරු ව්‍යවස්ථාවට අදාළ පරිශ්‍රය අතුරු ව්‍යවස්ථාවට අනුකූල ද යන්න පිළිබඳව පරිශ්‍රයට ඇතුළු වී පරීක්ෂාකර බැලීම නීත්‍යානුකූල වන්නේය. තවද බලපත්‍රලාභියා හෝ එහි පාලනය භාර තැනැත්තා එවැනි පරීක්ෂණයක් කිරීම සඳහා ඉඩදිය යුතු වන්නේය.

27. බලපත්‍රලත් පරිශ්‍රයක්, මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් විධිවිධානවලට අනුකූල නොවන බව පරීක්ෂණයකදී අනාවරණය වූ අවස්ථාවක, යථෝක්ත පරිශ්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූල කරවීම සඳහා කළයුතු කාර්යයන්, නියමිත කාලයක් ඇතුළත දී ඉටුකරන ලෙස, බලපත්‍රධාරියාට ලිඛිතව දැන්වීමට සභාපතිවරයාට බලය ඇත්තේ ය. තවද, යථෝක්ත දැන්වීමේ විධිවිධාන ප්‍රකාර බලපත්‍රධාරියා විසින් ක්‍රියා කළ යුතුය. එසේ ක්‍රියා නොකරන්නේ නම්, එවැනි අවස්ථාවක බලපත්‍රය අවලංගු කිරීමට සභාපතිවරයාට බලය ඇත්තේය.

28. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් ලබාගැනීම පිණිස යම් තැනැත්තෙකු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයක් තමා වෙත ලැබී දින 30 ක් ඇතුළත, පරිශ්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවලට අනුකූල වන්නේ නම් බලපත්‍රය නිකුත් කිරීම හෝ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන්නේ නම් ඊට හේතු ඉල්ලුම්කරුට දන්වා යැවීම සභාපතිවරයාගේ කාර්යය වන්නේය.

29. සෑම බලපත්‍රලාභියෙකු විසින් ම බලපත්‍රය සහ බලපත්‍රයට අදාළ කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ සේවා නියුක්තිකයන්ගේ නම් සහ ලිපිනයන් සිංහල හා දෙමළ භාෂාවලින් දැක්වෙන ලැයිස්තුවක් බලපත්‍රලාභී ස්ථානයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක එල්ලා තැබීමට සැළැස්විය යුතුය.

30. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ කරනු ලබන සෑම දැන්වීමක්ම අවස්ථෝචිත පරිදි අයිතිකරු හෝ එම ස්ථානයේ භාරකරු වෙත භාර දිය යුතුය. එවැන්නෙකු නොමැති විට බලපත්‍රලත් ස්ථානයේ ප්‍රකටව පෙනෙන පරිදි අලවා තැබිය යුතුය. එවැනි දැන්වීමකට ස්ථානයේ අයිතිකරුගේ හෝ පරිහරණය කරන අයගේ නම සඳහන් කිරීම අවශ්‍ය නොවිය යුතුය.

31. මේ අතුරු ව්‍යවස්ථාවේ කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙළින්, 255 වන අධිකාරය වන නගර සභා ආඥා පනතේ 153 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතුය.

32. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,

"සභාව" යන්නෙන් වත්තල මාබෝල නගර සභාව අදහස් වේ.

"සභාපති" යන්නෙන් වත්තල මාබෝල නගර සභාවේ සභාපතිවරයා අදහස් වේ.

"නගර සභා බල ප්‍රදේශය" යන්නෙන් වත්තල මාබෝල නගර සභාව සංස්ථාපනය වූ බල ප්‍රදේශය අදහස් වේ.

"බලය පවරන ලද නගර සභාවේ යම් නිලධාරියෙක්" යන්නෙන් වත්තල මාබෝල නගර සභාවේ සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමට බලය පවරනු ලබන නිලධාරියා හෝ නිලධාරීන් අදහස් වේ.

"බලපත්‍රධාරියා" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් තැනැත්තෙකු අදහස් කරනු ලැබේ.

"තැනැත්තා" යන්නට සංස්ථාගත කරන ලද හෝ නොකරන ලද පුද්ගල මණ්ඩලයක්ද ඇතුළත් වේ.

"පාලනය භාර තැනැත්තා" යන්නට භාරකරුවෙක්, ආරක්ෂකයෙක්, දේපළ ආරක්ෂකයෙක්, කළමණාකරුවෙක් හෝ යම් තැනැත්තෙක් වෙන්වෙන් යම් ව්‍යාපාරයක සංවිධානය, පාලනය හෝ කළමණාකරණය පැවරී ඇති වෙනත් තැනැත්තෙකුද ඇතුළත් වේ.

33. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨය ප්‍රමුඛ වේ.

## වත්තල මාබෝල නගර සභාවේ
## පොදු වැසිකිළි පාවිච්චිය විධිමත් කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව

1 වත්තල මාබෝල නගර සභා බල ප්‍රදේශයේ මහජනතාව සඳහා වත්තල මාබෝල නගර සභාව විසින් පිරිසිදු හා සනීපාරක්ෂක පහසුකම් සහිත පොදු වැසිකිළි පද්ධතිය විධිමත්ව පවත්වාගෙන යාම සඳහාත්, එය පාලනය කිරීම සඳහාත් විධිවිධාන ගැලපීම පිණිස මෙම අතුරු ව්‍යවස්ථා පනවනු ලබයි.

2. මෙම අතුරු ව්‍යවස්ථාව වත්තල මාබෝල නගර සභාවේ පොදු වැසිකිළි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

3. පොදු වැසිකිළියක් තුළදී මලපහ කිරීමේදී කිසිම තැනැත්තෙකු වැසිකිළි තැටියට හැර, වෙනත් ස්ථානයකට මලපහ නොකළ යුතු අතර, මූත්‍රා කිරීමේදී වැසිකිළියට හෝ ඒ සඳහා සලසා ඇති ස්ථානයට හැර වෙනත් කිසිම ස්ථානයකට මූත්‍රා කිරීම නොකළ යුතුය.

4. පොදු වැසිකිළියට සපයා ඇති ජලය වැසිකිළියේ කටයුතුවලට හැර වෙනත් කිසිම කටයුත්තක් සඳහා කිසිම පුද්ගලයෙකු විසින් භාවිතා නොකළ යුතු ය.

5. කිසිම තැනැත්තෙකු විසින් පොදු වැසිකිළියක හෝ ඊට සම්බන්ධ වැසිකිළි තැටි තුළට හෝ කාණු තුළට හෝ වෙනත් විවර ස්ථාන තුළට ගඩොල්, පස්, ගල්, අළු හෝ එම කාණු අවහිර වන වෙනත් කිසිම ද්‍රව්‍යයක් දැමීම හෝ තැබීම නොකළ යුතුය.

6. පොදු වැසිකිළියක අළුත්වැඩියාවකදී හැර වැසිකිළි තැටියක, නලයක, කපාටයක, ටැංකියක හෝ වෙනත් සවිකිරීමක් සවි කර ඇති ආකාරය, පිහිටීම හෝ පිළිවෙල හෝ කිසිම තැනැත්තෙකු විසින් හානියට පත් කිරීම, ඉවත් කිරීම, අවහිර කිරීම හෝ කිසිඳු ආකාරයකින් වෙනස් කිරීම හෝ එම වැසිකිළියේ යම් බිත්තියක්, බිමක්, වහලයක් හෝ ව්‍යුහයක් යන මේ කොටසක් ඕනෑකමින් විනාශ කිරීම, විරූප කිරීම, හානියට පත් කිරීම හෝ පළුදු කිරීම කරනු නොලැබිය යුතුය.

7. ස්ත්‍රී පක්ෂයේ ප්‍රයෝජනය සඳහා වෙන් කර තිබෙන්නා වූ යම් පොදු වැසිකිළියකට කාන්තාවන් පමණක් ද, පුරුෂයන් සඳහා වෙන් කර ඇති වැසිකිළි සඳහා පිරිමින් පමණක් ද, ඇතුළත් විය යුතු අතර, වැසිකිළි ශුද්ධ පවිත්‍ර කිරීම හෝ අළුත්වැඩියා කිරීම සිදුකරන අවස්ථාවලදී දොරවල් වසා ඒ බව ඇතුල්වන ස්ථානයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් ප්‍රදර්ශනය කර අදාළ කාර්යයන් ඉටු කිරීම පැවරී ඇති අය විසින් කළ යුතුය.

8. නගරය තුළදී කිසිවෙකු විසින් වැසිකිළියක හැර වෙනත් කිසිම ස්ථානයක මළපහ කිරීම හෝ මූත්‍රා කිරීම නොකළ යුතුය.

9. පොදු වැසිකිළියක උපස්ථායකයෙකු, මුරකරුවෙකු, සේවකයෙකු හෝ භාරකරුවෙකු විසින් තම රාජකාරි ඉටු කරන අතරතුරක දී කරනු ලබන යම් නීත්‍යානුකූල නියෝගයක් පැහැර හැරීම, ඊට බාධා කිරීම නොකළ යුතුය.

10. පොදු වැසිකිළියක මලපහ කිරීමට, මූත්‍රා කිරීම සඳහා පමණක් භාවිතා කළ යුතු අතර, එහි දී දුම් පානය, මත්ද්‍රව්‍ය භාවිතය වැනි දේ නොකළ යුතු අතර, නිකරුනේ රැඳී සිටීම නොකළ යුතුය.

11. පොදු වැසිකිළියක නඩත්තු හා භාරකාරත්වය පෞද්ගලික අංශයට පවරා ඇති අවස්ථාවකදී එකී පැවරුම්ලාභියා මඟින් දිනපතා වැසිකිළිය සෝදා පවිත්‍ර කර තබා ගත යුතුය. වැසිකිළිය නඩත්තු කටයුතු සඳහා ගාස්තුවක් අය කරන්නේ නම්, අදාළ මුදල දැන්වීමක් මඟින් ඇතුළත් වීමට පෙර ප්‍රදර්ශනය කර තිබිය යුතුය.

12. වැසිකිළිය පිරිසිදුව හා සනීපාරක්ෂාව නිරන්තරයෙන්ම තබා ගත යුතු වන අතර, දිනපතා විෂබීජනාශක යොදා පිරිසිදු කර, මනා තත්ත්වයකින් යුතුව පවත්වාගෙන යා යුතුය.

13. පොදු වැසිකිළිය පුද්ගලයෙකුට හෝ වෙනත් ආයතනයකට පවරා ඇති විට දී හෝ එය සභාව පවත්වාගෙන යන විට දී ඊට අදාළ වියදම් පියවා ගැනීම සඳහා සභාව විසින් තීරණය කරනු මුදලක් පොදු වැසිකිළිය පාවිච්චි කරන්නන්ගෙන් අයකළ හැකිය. වියදම් සඳහා ඔහු විසින් අය කළ යුතු මුදල් ප්‍රමාණය වරින් වර සභාව විසින් තීරණය කළ හැකිය. එම ගාස්තුව පමණක් එකී පුද්ගලයා විසින් වැසිකිළිය පාවිච්චි කරන්නාගෙන් අය කළ හැකිය.

14. මේ අතුරු ව්‍යවස්ථාවේ කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, නගර සභා ආඥා පනතේ 153 වගන්තියේ 2 වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතුය.

15. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවෙහි,

"සභාව"යන්නෙන් වත්තල මාබෝල නගර සභාව අදහස් වේ.

"සභාපති" යන්නෙන් වත්තල මාබෝල නගර සභාවේ සභාපතිවරයා අදහස් වේ.

"බලය පවරනු ලබන නිලධාරියා" යන්නෙන් වත්තල මාබෝල නගර සභාවේ සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියා ද අදහස් වන්නේය.

16. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨය ප්‍රමුඛ වේ.

## වත්තල මාබෝල නගර සභාවේ පෞද්ගලික රෝහල් හා රසායනාගාර සේවා පවත්වාගෙන යන ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. මෙම අතුරු ව්‍යවස්ථාව වත්තල මාබෝල නගර සභා බල ප්‍රදේශය තුළ පෞද්ගලික රෝහල් හා රසායනාගාර සේවා විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ ගාස්තු අයකිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස පනවනු ලැබේ.

2. මෙම අතුරු ව්‍යවස්ථාව මෙහි මින් මතු සභා බල ප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලබන වත්තල මාබෝල නගර සභා බල ප්‍රදේශය තුළ පෞද්ගලික රෝහල් හා රසායනාගාර සේවා පවත්වාගෙන යන ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

3. සභාපතිවරයා විසින් තත්කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් මත හැර, කිසිම තැනැත්තකු නගර සභා බල ප්‍රදේශයන් තුළ, මෙහි මින් මතු පරිශ්‍රය යනුවෙන් හඳුන්වනු ලබන පෞද්ගලික රෝහල් හා රසායනාගාර සේවා පවත්වාගෙන යන ස්ථානයක් පවත්වාගෙන යාම නොකළ යුතුය.

4. කලින් අවලංගු නොකළහොත් මිස එවැනි සෑම බලපත්‍රයක්ම එය නිකුත් කරන ලද්දේ යම් වර්ෂයක් සඳහාද එම වර්ෂයේ දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා බල පැවැත්විය යුතුය.

5. සේවාව පවත්වාගෙන යන පරිශ්‍රය සහ එම කාර්යය සඳහා භාවිතයට ගනු ලබන යම් ස්ථිර ගොඩනැගිලි වේ නම් එය සභාපති විසින් එම කාර්යය සඳහා අනුමත සැළැස්මකට අනුකූලව ඉදි කරන ලද ගොඩනැගිලි විය යුතු අතර, පහත සඳහන් කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස, කිසිදු තැනැත්තෙක් පෞද්ගලික රෝහල් හා රසායනාගාර සේවා පවත්වාගෙන යන ස්ථාන සඳහා බලපත්‍රයක් ලබාගැනීමට හිමිකමක් නොලබන්නේය.

i තත්කාර්ය සඳහා ම නාගරික සංවර්ධන අධිකාරි පනතේ විධිවිධානයන්ට අනුකූලව ඉදිකරන ලද ගොඩනැගිල්ලක් විය යුතුය.

ii. සායනික හා අන්තරායකාර අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි අනුමත කරන වැඩපිළිවෙලක් සකස් කර තිබිය යුතුය.

iii. ගිනි ආරක්ෂා පහසුකම් සපයා තිබිය යුතු අතර, සපයා ඇති ගිනි ආරක්ෂා උපකරණ සම්බන්ධයෙන් පිලිගත හැකි ආයතනයක අධීක්ෂණ සිදුවන බවට සහතිකයක් තිබිය යුතුය.

iv. වාහන නවතා තැබීම සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් තිබිය යුතුය.

v. පරිශ්‍රයට ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් සපයා තිබිය යුතුය.

vi. බැහැර වන අපජලය අන්තරායකර නොවන පරිදි බාහිරට මුදාහැරිය හැකි වන පරිදි පහසුකම් සපයා තිබිය යුතුය.

vii. පරිශ්‍රය ප්‍රමාණවත් ජල වහනයක් සිදුවන පරිදි ඉදිකිරීම් සිදුකර තිබිය යුතුය.

viii. පරිශ්‍රය තුළ පවත්වාගෙන යන උපාංග හා මෙවලම් මනා තත්වයෙන් විය යුතු අතර නිසි නඩත්තුවකින් පවත්වාගෙන යා යුතුය.

6. සෑම බලපත්‍රධාරියෙකුම ව්‍යාපාරය කරගෙන යාම සඳහා අවශ්‍යවන සියළු ද්‍රව්‍ය දුගඳ හැමීම හෝ වෙනත් පීඩාවක් ඇතිවීම වැළැක්වෙන පරිදි ගබඩාකර තැබිය යුතුය.

7. බලපත්‍රධාරියෙකු විසින් පීඩා ඇති වීමට හෝ දුගඳ හැමීමට ඉඩ ඇති ද්‍රව්‍ය පොදු ස්ථානයක හෝ මංමාවත් ඔස්සේ රැගෙන යාමේදී, කිසිදු පීඩාවක් ඇති නොවන සේ ආවරණය කරන ලද, උරා නොගන්නා භාජනවල දමා රැගෙන යා යුතුය.

8. සෑම බලපත්‍රධාරියෙකුම, යම්කිසි නිෂ්පාදන ක්‍රියාවලියකදී විමෝචනය වන පීඩාකාරී ශබ්ද, වාෂ්ප හෝ වායු, ඒවා විහිදී යාමේදී හානිකර හෝ පීඩාකාරී ප්‍රතිඵල හට ගැනීමට ඉඩ නොලැබෙන ආකාරයකින් හා උසකින් වායුගෝලයට මුදා හැරීම කළ යුතුය. නැතහොත් ගින්දර හෝ සනීකරණ උපකරණයක් තුළින් පිටවීමට සැලැස්විය යුතුය.

9. සෑම බලපත්‍රධාරියෙකුම, යන්ත්‍රෝපකරණ ක්‍රියාත්මක වීම පරීක්ෂා කිරීම පෙරවරු හයේ සිට පස්වරු හය දක්වා කාල සීමාව තුළ විය යුතුය.

10. සෑම බලපත්‍රධාරියෙකුම, තම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ප්‍රමාණවත් කාණු තනවා මැනවින් නඩත්තු කළ යුතු අතර, ඒවා දිනපතා සේදීම කළ යුතුය.

11. සෑම බලපත්‍රධාරියෙකුම, තම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ගෙබිම, යම් අපාරගම්‍ය ද්‍රව්‍යයකින් ඉදිකරවිය යුතු අතර, හොඳ ප්‍රතිසංස්කරණ තත්ත්වයෙන් නඩත්තු කිරීමත්, දිනපතා ශුද්ධ පවිත්‍ර කිරීමත් කළ යුතුය.

12. පරිශ්‍රයෙහි බැහැර වන අපද්‍රව්‍ය සභාව විසින් ක්‍රියාත්මක කසළ කළමනාකරණ වැඩසටහනට අනුව බැහැර කළ යුතුය.

13. සෑම බලපත්‍රධාරියෙකුම, ව්‍යාපාර කරගෙන යනු ලබන කාලයේදී, වාර්ෂිකව එම පරිශ්‍රයේ වර්ණ ආලේප කළ යුතුය.

14. සෑම බලපත්‍රධාරියෙකුම, ව්‍යාපාරික කටයුතුවලදී භාවිතා කරනු ලබන උපකරණ හා භාජන ඇතුළු සියළු ආම්පන්න පිරිසිදු කර තබා ගත යුතුය.

15. සෑම බලධාරියෙකුම, ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි කසළ, අතුගා එකතු කරනු ලබන බොල්, රොඩු සමඟ අපතේ ගිය ද්‍රව්‍ය හා අතුරු නිෂ්පාදන, ඒවා තවදුරටත් ව්‍යාපාර කටයුතු වලට වහාම නොයොදවන්නේ නම්, ආවරණය කරන ලද භාජනවල බහා දිනපතා නගර සභාවේ නියමය පරිදි ඉවත් කළ යුතුය.

16. සෑම බලපත්‍රධාරියෙකුම, යන්ත්‍රෝපකරණ වෙනත් ද්‍රව්‍යයක් සේදීම හෝ පෙඟවීම සඳහා භාවිතා කරනු ලබන වැංකි, දුගඳ හැමීම වැළැක්වීම සඳහා අවශ්‍ය වන පරිදි හිස්කර පවිත්‍ර කළ යුතුය.

17. සභාපතිවරයා විසින් හෝ තත්කාර්ය සඳහා ඔහු විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය පවරන ලද නගර සභාවේ යම් නිලධාරියෙකු විසින් රාජකාරි වේලාවන් තුළදී, පරිශ්‍රයට ඇතුළු වී පරීක්ෂාකර බැලීම නීත්‍යානුකූල වන අතර, තවද බලපත්‍රලාභියා හෝ එහි පාලනය භාර තැනැත්තා එවැනි පරීක්ෂණයක් කිරීම සඳහා ඉඩදිය යුතු වන්නේය.

18. බලපත්‍රලත් පරිශ්‍රයක්, මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් විධිවිධානවලට අනුකූල නොවන බව පරීක්ෂණයකදී අනාවරණය වූ අවස්ථාවක, යථෝක්ත පරිශ්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූල කරවීම සඳහා කළයුතු කාර්යයන්, නියමිත කාලයක් ඇතුළත දී ඉටුකරන ලෙස, බලපත්‍රධාරියාට ලිඛිතව දැන්වීමට සභාපතිවරයාට බලය ඇත්තේය. තවද, යථෝක්ත දැන්වීමේ විධිවිධාන ප්‍රකාර බලපත්‍රධාරියා විසින් ක්‍රියා කළ යුතුය. එසේ ක්‍රියා නොකරන්නේ නම්, එවැනි අවස්ථාවක බලපත්‍රය අවලංගු කිරීමට සභාපතිවරයාට බලය ඇත්තේය.

19. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ කිසියම් ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් ලබාගැනීම පිණිස යම් තැනැත්තෙකු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයක් තමා වෙත ලැබී දින 30 ක් ඇතුළත, පරිශ්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවලට අනුකූල වන්නේ නම් බලපත්‍රය නිකුත් කිරීම හෝ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන්නේ නම් ඊට හේතු ඉල්ලුම්කරුට දන්වා යැවීම සභාපතිවරයාගේ කාර්යය වන්නේය.

20. සෑම බලපත්‍රලාභියෙකු විසින් ම බලපත්‍රය සහ බලපත්‍රයට අදාළ කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ සේවා නියුක්තිකයන්ගේ නම් සහ ලිපිනයන් සිංහල හා දෙමළ භාෂාවලින් දැක්වෙන ලැයිස්තුවක් බලපත්‍රලාභි ස්ථානයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක එල්ලා තැබීමට සැළැස්විය යුතුය.

21. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ කරනු ලබන සෑම දැන්වීමක්ම අවස්ථෝචිත පරිදි අයිතිකරු හෝ එම ස්ථානයේ භාරකරු වෙත භාර දිය යුතුය. එවැන්නෙකු නොමැති විට බලපත්‍රලත් ස්ථානයේ ප්‍රකටව පෙනෙන පරිදි එල්ලා තැබීම ප්‍රමාණවත් විය යුතුය.

## වත්තල මාබෝල නගර සභාවේ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. මෙම අතුරු ව්‍යවස්ථාව වත්තල මාබෝල නගර සභා බල ප්‍රදේශය තුළ යම් මංමාවතකට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කර ඇති ප්‍රචාරක දැන්වීම් විධිමත් කිරීම, පාලනය කිරීම, එසේ ප්‍රචාරණය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු අයකිරීම සඳහා පනවනු ලැබේ.

2. මෙම අතුරු ව්‍යවස්ථාව වත්තල මාබෝල නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

3. කිසිම තැනැත්තෙකු විසින්, (මෙහි මින්මතු බල ප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලබන) වත්තල මාබෝල නගර සභා බල ප්‍රදේශයෙහි යම් මංමාවතකට පෙනෙන කිසිම දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම ඒ සඳහා සභාපති විසින් නිකුත් කරන ලද බලපත්‍රයක බලය යටතේ මිස කරනු නොකළ යුතුය.

4. මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා ප්‍රචාරක දැන්වීම යන්නෙන් ප්‍රධාන මාර්ගයට, අතුරු මාර්ගයට, පළාත් සභා, නගර සභා හෝ පෞද්ගලික මාර්ගයට පෙනෙන සේ යම් විද්‍යුත් පුවරුද, බැනර්ද, කටවුට්ද, ඇලුමිනියම් තහඩුද, යකඩද, පොලිතීන්ද, රෙදි හෝ කොළවල ඇඳීමෙන් ද නොමැති නම් ගැල්වනයිස් යකඩ යොදා සකස් කරන ලද දැන්වීම් පුවරුවක් ද, නිවසක, කඩයක, හෝටලයක, බිත්තියක, තාප්පයක ආදී ස්ථානයක අකුරු හෝ රූප යොදා යම් වෙළඳ ස්ථානයක්, වෙළඳ භාණ්ඩයක්, ව්‍යාපාරයක් සඳහා කෙරෙන ප්‍රචාරක දැන්වීමක් ද, වෙළඳ ප්‍රදර්ශනයක, සැණකෙළියක ආදී උත්සව අවස්ථාවන්හිදී යොදන විශේෂ දැන්වීම් පුවරු ද අදහස් වන්නේය.

5. (i) කවර හෝ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමේ බලපත්‍රයක් සඳහා වන සෑම ඉල්ලුම්පත්‍රයක්ම මෙහි පලවන උපලේඛණයෙහි සඳහන් ආකෘතියට වියයුතු අතර මේ අතුරු ව්‍යවස්ථාවෙහි හයවන වගන්තියට අනුකූලව ඒ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනයට යටත් පිරිසෙන් දින තුනකට කලින් සභාපති වෙත ඉදිරිපත් කළ යුතුය.

   (ii) නගර සභාව විසින් නිකුත් කරන ඉල්ලුම්පත්‍රයක් සඳහා අයකරනු ලබන ගාස්තුව සභාව කලින් කළ යෝජනා සම්මුතියක් මගින් තීරණය කළ හැකිය.

6. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ඉදිරිපත් කරන සෑම ඉල්ලුම්පත්‍රයක් සමග පහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලිය යුතුය .

   (i) දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන නිර්මිතයේ පිහිටීමට සාපේක්ෂ පරිමාවට නොඅඩු පරිමාවකින් අඳින ලද භූමි සැලැස්ම.

   (ii) 1: 1000 පරිමාවට නොඅඩු පරිමාවකට අඳින ලද එම නිර්මිතයේ රූ සටහන.

   (iii) එම සැලැස්මේ, රූප සටහනේ හෝ පිරිවිතරයෙහි, මේ අතුරු ව්‍යවස්ථාවලට අනුකූලවනු පිණිස කරන සංශෝධන වෙතොත් ඒ සංශෝධන.

   (iv) ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීමෙහි යොදා ගන්නා වර්ණ සියල්ලම යොදා කුඩා පරිමාවක අඳින ලද ඒ දැන්වීමේ පිටපතක්.

   (v) යාබද වීථිවලට සහ ප්‍රධාන භූමි සළකුණුවලට සාපේක්ෂව ප්‍රචාරක දැන්වීමෙහි පිහිටීම දැක්වෙන සැලැස්ම.

7. සභාපති විසින් ලියවිල්ලකින් අනුමත කරන ලද සැලසුම් වලට, රූප සටහන්වලට සහ පිරිවිතරයන්ට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු විසින් නගර සභා ප්‍රදේශය ඇතුලත යම් ප්‍රචාරක දැන්වීමක් හෝ ප්‍රචාරක දැන්වීම් හෝ ප්‍රදර්ශනය කිරීමේ කාර්යය සඳහා ප්‍රයෝජනයට ගැනීම පිණිස කිසිම පුවරුවක්, බිල් පුවරුවක්, දැන්වීම් පුවරුවක් හෝ වෙනත් යම් නිර්මිතයක් ඉදිකිරීම හෝ ඉදිකිරීමට සැළැස්වීම නොකළ යුතුය.

8. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක්ම සභාපති විසින් අනුමත කරනු ලැබූ අවස්ථාවක ඒ සඳහා සභාව විසින් කලින් කළ යෝජනා සම්මුතියක් මඟින් තීරණය කර ප්‍රකාශයට පත් කර ඇති නියමිත ගාස්තු ගෙවන තෙක් ඊට අදාළ බලපත්‍රය නිකුත් නොකළ යුතුය.

9. ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා යම් තැනැත්තෙකුට බලපත්‍රයක් නිකුත්කරනු ලැබූ අවස්ථාවක ඔහු විසින් ප්‍රදර්ශනය කරනු ලබන සෑම ප්‍රචාරක දැන්වීමකම බලපත්‍රයේ යොමු අංකය සහ බලපත්‍රධාරියාගේ නම ඇතුලත් කරන ලෙස නගර සභාව විසින් ඒ තැනැත්තාට නියම කළ යුතුය.

10. මේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන පහත දැක්වෙන ප්‍රචාරක දැන්වීම් කිසිවකට ඒ දැන්වීම් ප්‍රදීප්ත ප්‍රචාරක දැන්වීමක් හෝ ගුවන් නාම පුවරුවක් හෝ වන්නේ නම් මිස අදාළ නොවිය යුතුය.

(i) ලබන ශුද්ධ ආදායම් ප්‍රමාණය, පුණ්‍ය කටයුතු සඳහා යොදවන යම් ප්‍රසංගයකට අදාළ දැන්වීමක්.

(ii) කිසියම් ප්‍රසංගයක් පවත්වනු ලබන ස්ථානයේ, ඒ ප්‍රසංගයට අදාළව ප්‍රදර්ශනය කෙරෙන ප්‍රචාරක දැන්වීමක්.

(iii) ආගමික, දේශපාලන මහජන රැස්වීමක් සම්බන්ධයෙන් වන ප්‍රචාරක දැන්වීමක්.

(iv) "කුළියට දීමට තිබේ" යනුවෙන් වූ ප්‍රචාරක දැන්වීමක්.

(v) "විකිණීමට තිබේ" යනුවෙන් වූ ප්‍රචාරක දැන්වීමක්.

(vi) ගෘහ නාම පුවරු.

(vii) වෘත්තීය කටයුතු සඳහා යොදා ගනු ලබන, ප්‍රමාණයෙන් වර්ග මීටර් 0.93 ක් නොඉක්මවන නාම පුවරුවක්.

(viii) වෙළඳ කටයුත්තක් හෝ ව්‍යාපාරයක් සඳහා පාවිච්චි කරන වාහනයක් එම වෙළඳ කටයුත්තේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය දැක්වෙන සහ අයිතිකරුගේ නම සහ ලිපිනය දුරකථන අංකය විද්‍යුත් තැපැල් ලිපිනය ආදිය දැක්වෙන ප්‍රචාරක දැන්වීමක්.

11. කිසිම තැනැත්තෙකු විසින්,

(i) යම් වීථියක, පාරක හෝ අඩි පාරක රිය මගට උඩින් හෝ හරහා හෝ නෙරා සිටින ආකාරයකට ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම.

(ii) පොළොවේ සිට මීටර් 15 ක් ඉක්මවන උසකින් ඇති යම් පුවරුවක් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ,

(iii) කිසියම් වීථියකට හෝ පාරකට මුහුණලා යාව පිහිටි ගොඩනැගිල්ලක මුහුණතෙහි හෝ වෙළඳ ශාලා නාම පුවරුවක හෝ ඒ ගොඩනැගිලි මුහුණතෙහි සීමාව ඉක්මවා යන දිගකින් යුත් ප්‍රචාරක දැන්වීමක් සවි කොට නැතහොත් එල්ලා තැබීම.

(iv) ගුවන් නාම පුවරුවක ස්වරූපයේ ප්‍රචාරක දැන්වීමක් නගර සභාවේ පූර්ව අනුමැතිය ලබා නොගෙන යම් ආකාරයකට තැනීම, ඉදිකිරීම නොකළ යුතුය.

12. කිසිම තැනැත්තෙකු විසින්, පෞද්ගලික හෝ පොදු ගොඩනැගිල්ලක, පොදු පූජනීය ස්ථානයක, පොදු උද්‍යානයක හෝ යම් පාළමක හෝ පාරේ ඇති මාර්ග පාළමක, දුරකථන හෝ විදුලි රැහැන් කණුවක, පැති බැම්මක, වේල්ලක, අමුණක, බෝක්කුවක, පර්වතයක, ඉවුරක හෝ ගසක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය නොකළ යුතුය.

13. සභාවේ යෝජනා සම්මතයක නිශ්චය කොට දැක්වෙන සහ *ගැසට් පත්‍රයේ* යථා පරිදි පළ කරන ලද යම් ප්‍රදේශයක කිසිම ප්‍රචාරක දැන්වීමක්, ඒ දැන්වීම සභාපති විසින් අනුමත කළ ආකාරයට තනා හෝ ඉදිකර ඇති වෙළඳ ශාලා පුවරුවක් වන්නේ නම් මිස, ප්‍රදර්ශනය නොකළ යුතුය.

14. කිසිම තැනැත්තෙකු විසින් නගර සභා ප්‍රදේශය ඇතුලත යම් වීථියක හෝ පාරක,

(i) යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට හෝ හැඳින්වීමේ කාර්යය සඳහා ගුවන් විදුලි යන්ත්‍රයක්, ග්‍රැමෆෝනයක්, සංගීත භාණ්ඩයක්, සීනුවක් හෝ වෙනත් උපකරණයක් නගර සභාවේ සභාපතිවරයාගේ අවසරයකින් තොරව පාවිච්චි කිරීම නීත්‍යානුකූල නොවන්නේ ය.

15. (i) යම් ප්‍රචාරක දැන්වීමක්, අවලස්සන හෝ පිළිකුල් සහගත හා මහජන සදාචාරයට හානිකරන යමක් නිරූපණය කරන අවස්ථාවක නගර සභාවේ සභාපති විසින් ලිඛිත නිවේදනයක් මගින් ඒ නිවේදනයේ නිශ්චය කොට දැක්වෙන යම් කාලයක් ඇතුලත ඒ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම නතර කරන ලෙස ඒ ප්‍රචාරක දැන්වීම සිදු කරන තැනැත්තාට නියම කළ හැකි ය.

(ii) මෙම වගන්තියේ 1 වන ඡේදය යටතේ නිවේදනයක් භාර දෙනු ලැබූ කවර හෝ තැනැත්තෙකු විසින් එහි නිශ්චිත කොට දැක්වෙන කාලය ඇතුලත ඒ නිවේදනය අනුව ක්‍රියා කළ යුතුය.

16. ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය පිණිස ප්‍රයෝජනයට ගන්නා යම් පුවරුවක අයිතිකරු හෝ බදු කරු විසින්,

(i) ඒ පුවරු නිසි අළුත්වැඩියාවෙන් යුතුව සහ තැනැත්තන්ගේ ආරක්ෂාව තහවුරු වන ආකාරයෙන් පවත්වාගෙන යා යුතුය.

(ii) ඒ පුවරු ඉදිරිපස, ප්‍රකටව පෙනෙන තැනක පැහැදිලි හා කියවිය හැකි අකුරෙන් ඔහුගේ නම සහ ලිපිනය ප්‍රදර්ශනය කළ යුතුය.

17. යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා නියමිත බලපත්‍ර ගාස්තුව ගෙවා ඇති බව පෙන්වීමට යම් ප්‍රචාරක දැන්වීමක නගර සභාව විසින් ඇතුලත් කර ඇති යම් ලාංඡනයක්, සළකුණක්, අක්ෂරයක්, වචනයක් හෝ ඉලක්කමක් කිසිම තැනැත්තෙකු විසින් විරූප කිරීම හෝ නොකළ යුතුය.

18. මේ අතුරු ව්‍යවස්ථාවේ කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, නගර සභා ආඥා පනතේ 153 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතුය.

19. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බල පත්‍රයකින් තොරව නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් කිසිදු පූර්ව දැනුම්දීමකින් තොරව සභාව විසින් ඉවත් කිරීම නීත්‍යානුකූල වන්නේය.

20. එලෙස යම් තැනැත්තෙකු හෝ ආයතනයක් දිගින් දිගටම බලපත්‍රයක් ලබා නොගෙන ප්‍රචාරක දැන්වීම් පළ කිරීම හේතු කොට ගෙන හෝ මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සඳහන් කොන්දේසි කඩකිරීම හේතුකොටගෙන වරදකට වැරදිකරුවකු වී ඇති අවස්ථාවක දී එකී තැනැත්තා හෝ ආයතනය එම නගර සභා බල ප්‍රදේශය ප්‍රචාරක කාර්යයන් සඳහා අසාධුලේඛනගත කිරීම පිළිබඳ නගර සභාව තීරණය කිරීම නීත්‍යානුකූල වන්නේය.

21. ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අවසර ලැබීමෙන් පසු අවසර පත්‍රයේ වලංගු කාලය ඉදිරියට ඉතිරිව තිබියදී වුවද, යම් අයුරකින් සවි කරන ලද , බිත්තියක හෝ තාප්පයක අඳින ලද බැනරයක්, කටවුට් එකක් ප්‍රචාරක දැන්වීම් පුවරුවක් කෙසේ හෝ සුළගට ඇලවී, ගැලවී, බිම ඇද වැටී හෝ දුර්වර්ණ වී කැඩී බිඳී, වෙනස් වී නගරයේ අලංකාරයට කුමන අයුරකින් හෝ හේතු වේ නම් එබඳු දැන්වීම් පිළිබඳ ලිඛිත දැන්වීමක් අදාළ අයිතිකරු වෙත භාර දී දින 07 ක් ඇතුලත යථා පරිදි සකස් කිරීමට කටයුතු කළ යුතු අතර, එසේ නොමැති නම් සභාව විසින් එය ඉවත් කිරීම කළ යුත්තේය. සභාව විසින් එසේ දැන්වීමෙන් දින 14 ක් ගතවීමෙන් පසු සභාවේ සේවකයන් යොදවා දැන්වීම ඉවත් කිරීමට සිදුවුවහොත් එහි දැන්වීම පිළිබඳ කිසිම වගකීමක් සභාව විසින් දරනු නොලැබේ.

22. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ ;

"සභාව" යන්නෙන් වත්තල මාබෝල නගර සභාව ද,

"සභාපතිවරයා" යන්නෙන් වත්තල මාබෝල නගර සභාවේ සභාපතිවරයා ද,

"බලයලත් නිලධාරි" යන්නේ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධාරියෙකු අදහස් කෙරේ.

23. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨය ප්‍රමුඛ වේ.

## 01 උප ලේඛනය

## ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම සම්බන්ධ ඉල්ලුම්පත්‍රය

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම:- ..........................................................................................................................

02. ස්ථිර ලිපිනය:- ..........................................................................................................................

03. දන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන වෙළඳ ව්‍යාපාරය, උත්සවය, ප්‍රදර්ශනය, සැණකෙළිය,රැස්වීම හෝ වෙළඳ ද්‍රව්‍ය පිළිබඳ විස්තරය:- ..........................................................................................................................

04. දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට බලාපොරොත්තුවන ස්ථානය/ ස්ථාන :- ..........................................................................................................................

05. අදාළ ආකෘතිය අමුණා තිබේ ද? ..........................................................................................................................

06. ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දැන්වීම් වර්ගය (බැනර්, පුවරු, කටවුට්, බිත්ති, තාප්ප හෝ ස්ථාවර):- .............................

07. යම් අයුරකින් තම ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අවසර ලැබීමෙන් පසුව ද දැන්වීම දූර්වර්ණවීම, ඇල වීම, ගැලවීම, බිමට කඩාවැටීමක් සිදුවුවහොත් යථා පරිදි සකස් කිරීමට එකඟ වන්නේ ද? යන්න. .........................................................

සභාවේ පිළිගත් නියමයන්ට එකඟව දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට එකඟ වන අතර, ඒ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව හෝ එහි යම් වගන්තියක් උල්ලංඝනය කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් බව ද, හොඳාකාරවම මම දනිමි.

දිනය:- .........................................................

( අයදුම්කරුගේ අත්සන )

**පහත සඳහන් ලිපිලේඛන අමුණා ඇත.**

i. ප්‍රචාරක දැන්වීම ස්ථාවර එකක් නම් එය සවිකරනු ලබන ඉඩමේ අයිතිකරුගෙන් ලබා ගන්නා ලද කැමැත්ත ප්‍රකාශ කිරීමේ ලිපිය.

ii. එකී දැන්වීම නිවසක, කඩයක, හෝටලයක, බිත්තියේ, තාප්පයේ හෝ එවැනි තැනක අදිනු ලබන්නක් නම් එකී තාප්පය, බිත්තිය, කඩය, හෝටලය, අයිතිකරුගේ කැමැත්ත පළ කළ ලිපිය.

iii. ප්‍රචාරක දැන්වීම ඇඳීම හෝ ස්ථාවරව සවි කිරීම සඳහා භූමිය (අවකාශය) යොදාගන්නා ආකාරය පිළිබඳ විස්තරය.

iv. ප්‍රචාරක දැන්වීමට අදාළ ආකෘතිය පැහැදිලිව ඉදිරිපත් කළ යුතුය. (අවසර පත්‍රය නිකුත් කිරීමෙන් පසු ආකෘතිය කෙසේවත් වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ).

22. මේ අතුරු ව්‍යවස්ථාවේ කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, 255 වන අධිකාරය වන නගර සභා ආඥා පනතේ 153 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතුය.

23. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,

"සභාව"යන්නෙන් වත්තල මාබෝල නගර සභාව අදහස් වේ.

"සභාපති"යන්නෙන් වත්තල මාබෝල නගරසභාවේ සභාපතිවරයා අදහස් වේ.

"නගර සභා බල ප්‍රදේශය"යන්නෙන් වත්තල මාබෝල නගරසභාව සංස්ථාපනය වූ බල ප්‍රදේශය අදහස් වේ.

"බලය පවරන ලද නගර සභාවේ යම් නිලධාරියෙක්"යන්නෙන් වත්තල මාබෝල සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමට බලය පවරනු ලබන නිලධාරියා හෝ නිලධාරීන් අදහස් වේ.

"බලපත්‍රධාරියා"යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් තැනැත්තෙකු අදහස් කරනු ලැබේ.

"තැනැත්තා" යන්නට සංස්ථාගත කරන ලද හෝ නොකරන ලද පුද්ගල මණ්ඩලයක් ද ඇතුළත් වේ.

"පාලනය භාර තැනැත්තා" යන්නට භාරකරුවෙක්, ආරක්ෂකයෙක්, දේපළ ආරක්ෂකයෙක්, කළමණාකරුවෙක් හෝ යම් තැනැත්තෙක් වෙන්වෙන් යම් ව්‍යාපාරයක සංවිධානය, පාලනය හෝ කළමණාකරණය පැවරි ඇති වෙනත් තැනැත්තෙකු ද ඇතුළත් වේ.

24. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨය ප්‍රමුඛ වේ

## වත්තල මාබෝල නගර සභාවේ
## ප්‍රචාරක සේවාවන් පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

01. මෙම අතුරු ව්‍යවස්ථාව වත්තල මාබෝල නගරසභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක සේවාවන් පවත්වාගෙන යාම, ඊට අදාළ ගාස්තු නියම කිරීම හා ඊට ආනුශංගික කරුණු සඳහා විධිවිධාන සැළසීම පිණිස පනවනු ලැබේ.

02. මෙම අතුරු ව්‍යවස්ථාව වත්තල මාබෝල නගර සභාවේ ප්‍රචාරක සේවා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

03. මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දින සිට (මෙහි මින්මතු සභාව යනුවෙන් හඳුන්වනු ලබන) වත්තල මාබෝල නගර සභාව විසින් (මෙහි මින් මතු බලප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලබන) වත්තල මාබෝල නගර සභා බල ප්‍රදේශය තුළ සභාව සතු හෝ අයිතිවාසිකම් යටතේ වන පරිශ්‍රයක සභාවේ හෝ වෙනත් කවර හෝ තැනැත්තෙකුගේ ප්‍රචාරක අවශ්‍යතාවයක් සඳහා ප්‍රචාරක සේවාවක් පවත්වාගෙන යාම නීත්‍යානුකූල වන්නේය.

04. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ප්‍රචාරක සේවා යන්නට පහත සඳහන් කරුණු අරමුණු කර ගත් ප්‍රචාරක ක්‍රියා අදාළ නොවිය යුතුය.

i. කිසියම් දේශපාලන පක්ෂයක් හෝ දේශපාලන කණ්ඩායමක් වෙනුවෙන් කරනු ලබන ප්‍රචාරයක්,

ii. කිසියම් නීති විරෝධී ක්‍රියාවකට පෙළඹවිය හැකි ආකාරයේ හෝ සංස්කෘතියට හා සදාචාරයට හානිකර විය හැකි ආකාරයේ ප්‍රචාරණයක්,

iii. කිසියම් ආගමකට හෝ සංස්කෘතික අනන්‍යතාවයකට හානිකර හෝ බලපෑමක් ඇති විය හැකි ආකාරයේ ප්‍රචාරණයක්,

iv. මත්පැන් හෝ දුම්වැටි එවැනි ස්වභාවයේ කවර හෝ දේ සම්බන්ධයෙන් වන ප්‍රචාරණයක්

05. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සභාව පවත්වාගෙන යන ප්‍රචාරක සේවා කටයුතු ඩිජිටල් පුවරුවක් යටතේ සිදුකරන ප්‍රචාරක ක්‍රියාවක් හෝ සභාව විසින් තීරණය කර ප්‍රචාරක කටයුත්තක් වෙනුවෙන් ක්‍රියාත්මක කරන කවර ආකාරයේ හෝ ප්‍රචාරක සේවාවක් විය හැකිය.

06. ඩිජිටල් පුවරුවක් හෝ වෙනත් කවර හෝ ස්වභාවයක් යටතේ හෝ පවත්වාගෙන යන ප්‍රචාරක සේවාවක් සඳහා ප්‍රචාරණ කාර්යයක් වෙනුවෙන් ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම ඒ සඳහා සභාවේ ලේකම් වෙතින් ලබාගත් අයදුම්පත්‍රයක් මඟින් ඉල්ලුම් කළ යුතුය.

07. ප්‍රචාරක සේවාවන් සඳහා අය කරගනු ලබන ගාස්තු කලින් කලට සභාව විසින් යෝජනා සම්මතයක් මඟින් තීරණය කර ප්‍රකාශයට පත්කරනු ලබන ගාස්තු විය යුතුය.

08. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රචාරක සේවාව ලබා ගැනීම සඳහා වන ඉල්ලුම් කිරීමකදී ම ඉල්ලුම් කරන ප්‍රචාරක කාලය වෙන්කර දීමේ දී ම ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කරන ප්‍රමුඛතාවය මත පදනම් විය යුතුය.

09. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නියමිත මුදල් ගෙවා වෙන්කරගත් ප්‍රචාරණ කාලයක් තුළ සභාවේ පාලනයෙන් තොර හෝ වෙනත් තාක්ෂණිකමය කරුණක් හේතු කොටගෙන අදාළ ප්‍රචාරණය කිරීමට නොහැකි වුවහොත්, ඊට සාධාරණ ප්‍රචාරක අවස්ථාවක් ඉදිරියේදී ලබාගැනීමට ඉල්ලුම්කරු එකඟවන අවස්ථාවක පමණක් එකී සේවාව සඳහා ගාස්තු අයකිරීම කළ යුතුය.

10. සභාව පවත්වාගෙන යන සෑම ප්‍රචාරක සේවාවන් සඳහා ඒ හා සම්බන්ධයෙන් හෝ අදාළ විය යුතු කොන්දේසි සභාව විසින් කලින් කළ තීරණය කර ප්‍රකාශයට පත් කිරීම නීත්‍යානුකූල විය යුතුය.

11. සභාව විසින් ඉහත 10 වගන්තිය යටතේ නියම කර ප්‍රකාශයට පත්කරනු ලැබ ඇති කොන්දේසි මෙම අතුරු ව්‍යවස්ථාව යටතේම නියම කරන ලද කොන්දේසි ලෙස බල පැවැත්විය යුතුය.

12. මේ අතුරු ව්‍යවස්ථාවේ කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක්වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, නගර සභා ආඥා පනතේ 153 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතුය.

13. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවෙහි,

"සභාපති" යන්නෙන් වත්තල මාබෝල නගර සභාවේ සභාපතිවරයා අදහස් වේ.

"ලේකම්"යන්නෙන් වත්තල මාබෝල නගර සභාවේ ලේකම් අදහස් වේ.

14. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨය ප්‍රමුඛ වේ.

## වත්තල මාබෝල නගර සභාවේ ප්ලාස්ටික් හා පොලිතීන් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන ආයතනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

01. මෙම අතුරු ව්‍යවස්ථාව වත්තල මාබෝල නගරසභා බල ප්‍රදේශය තුළ ප්ලාස්ටික් හා පොලිතීන් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන ආයතනය පවත්වාගෙන යාම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම හා ගාස්තු අය කිරීම සඳහා විධිවිධාන සලසනු පිණිස පනවනු ලැබේ.

02. මෙම අතුරු ව්‍යවස්ථාව වත්තල මාබෝල නගර සභාවේ ප්ලාස්ටික් හා පොලිතීන් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන ආයතනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

03. සභාවේ සභාපතිවරයා විසින් තත්කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් මත හැර, කිසිම තැනැත්තකු විසින් (මෙහි මින්මතු බල ප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලබන) වත්තල මාබෝල නගරසභා බල ප්‍රදේශය තුළ, ප්ලාස්ටික් හා පොලිතීන් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන ආයතනය පවත්වාගෙන යාම නොකළ යුතු ය.

07. මෙම අතුරුව්‍යවස්ථාව යටතේ කාර්යය සඳහා වන පරිශ්‍රයෙහි එම කාර්යය සඳහා භාවිතයට ගනු ලබන යම් ස්ථිර ගොඩනැගිල්ලක් වේ නම් එය සභාපති විසින් අනුමත සැළැස්මකට අනුකූලව ඉදි කරන ලද ගොඩනැගිලි විය යුතු අතරම, එම පරිශ්‍රය පහත සඳහන් කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස, එහි කිසිදු තැනැත්තෙකු මෙම අතුරුව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලබාගැනීමට හිමිකමක් නොමැත්තේය.

(i) පරිශ්‍රය හොඳ ප්‍රතිසංස්කරණ තත්ත්වයකින් සහ මනා වාතාශ්‍රයක් හා ආලෝකයක් ලැබෙන පරිදි සකස් කර තිබිය යුතු අතර, සෑම කාමරයක් විවෘත කළවිට ගෙබිමේ ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට නොඅඩු ප්‍රමාණයේ ජනෙල් සවිකර තිබිය යුතුය.

(ii) සෑම කාමරයකම බිත්තිවල සෑම කොටසක උස මීටර් 2.14 ට නොඅඩු විය යුතුය අතර, ගඩොල්, කළුගල්, කබොක් හෝ සිමෙන්ති ගල් වලින් සාදා තිබිය යුතුය. බිත්තිවල ඇතුල් පැති අවම වශයෙන් ගෙබිමේ සිට මීටර් 2 ක් උසට සිමෙන්ති බදාම යොදා කපරාදු කොට තිබිය යුතු අතර, ඉතිරි කොටස හුණු බදාම යොදා කපරාදු කොට වර්ණ ආලේප කර තිබිය යුතුය.

(iii) සෑම පියසි කෙළවරකම ගෙබිමේ සිට මීටර් 2 ට වැඩි උසකින් තිබිය යුතුය.

(iv) වහලය යම් ස්ථිර ද්‍රව්‍යයකින් සාදා තිබිය යුතුය.

(v) දැව කර්මාන්ත සියල්ල තීන්ත අලේප කර තිබිය යුතු ය.

(vi) සම්පූර්ණ ගෙබිම ස්ථිර ද්‍රව්‍යකින් තනවා තිබිය යුතුය.

(vii) පරිශ්‍රය ප්‍රමාණවත් ජලවහනයක් සිදුවන පරිදි ඉදිකර තිබිය යුතුය.

(viii) පරිශ්‍රයෙහි සනීපාරක්ෂක කසළ භාජන සහ ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතුය.

(ix) ප්‍රමාණවත් ගිනි ආරක්ෂණ පහසුකම් සපයා තිබිය යුතු ය.

(x) වාහන නවතා තැබීම සඳහා ප්‍රමාණවත් පහසුකම් තිබිය යුතු ය.

(xi) ප්‍රථමාධාර සඳහා පහසුකම් සපයා තිබිය යුතු ය.

(xii) හදිසි අනතුරු ලේඛනයක් පවත්වාගත යුතු ය.

08. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් බලපත්‍රධාරියෙකු විසින්ම,

(xlvii) පරිශ්‍රයෙහි එක්රැස්වන අපද්‍රව්‍ය නිසි පරිදි බැහැර කරන තෙක් සංවෘත බහාලුම් යටතේ පීඩාවන් ඇති නොවන පරිදි පවත්වාගත යුතුය.

(xlviii) පරිශ්‍රයෙහි කර්මාන්තයට අදාළ වන ද්‍රව්‍ය අන්තරායකාරී හෝ හානිකර ස්වභාවයකින් තොරව පවත්වාගත යුතු ය.

(xlix) බලපත්‍රලත් පරිශ්‍ර තුල ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස,

(අ) ජෛවහායන අපද්‍රව්‍ය
(ආ) වීදුරු
(ඇ) කඩදාසි
(ඈ) පොලිතීන් හෝ ප්ලාස්ටික්
(ඉ) යකඩ හෝ වෙනත් ලෝහ
(ඊ) අන්තරායකර අපද්‍රව්‍ය

වශයෙන් වර්ගීකරණය කර වෙන් වෙන්වූ භාජන යටතේ පවත්වාගත යුතු ය.

(l) ආයතනයෙහි සේවයට යොදවා ඇති සේවකයින් සම්බන්ධයෙන් මුඛ වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා දී තිබිය යුතු අතර, එය සේවයෙහි නියතු අවස්ථාවන්හි පැළඳ සිටිය යුතු ය.

(li) සේවයේ නියතු සියලුම සේවකයින් සම්බන්ධයෙන් සෞඛ්‍ය ආරක්ෂණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු ය.

(lii) පරිශ්‍රයෙන් බැහැර කරන අපද්‍රව්‍ය සභාව විසින් ක්‍රියාත්මක කරන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනට අනුකූලව බැහැර කළ යුතු ය

(liii) නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදා ගැනෙන උපකරණ නිසි නඩත්තුවකින් යුතු ව ආරක්ෂිතව පවත්වාගත යුතු ය.

(liv) සෑම මාස හයකටම වරක් පරිශ්‍රයෙහි ගිනි ආරක්ෂණ පියවර පිළිබඳ පිළිගත හැකි ආයතනයකින් යෝජනා වාර්තා ලබා ගත යුතු ය.

09. සෑම බලපත්‍රධාරියෙකුම කර්මාන්තය කරගෙන යාම සඳහා අවශ්‍යවන සියලුම ද්‍රව්‍ය හා අවශ්‍ය අනෙකුත් දෑ දුගඳ හැමීම හෝ වෙනත් පීඩාවක් ඇතිවීම වැළැක්වෙන පරිදි ගබඩාකර තැබිය යුතුය.

10. සෑම බලපත්‍රධාරියෙකුම, යම්කිසි නිෂ්පාදන ක්‍රියාවලියකදී විමෝචනය වන පීඩාකාරී ශබ්ද, වාෂ්ප හෝ වායු, ඒවා විහිදී යාමේදී හානිකර හෝ පීඩාකාරී ප්‍රතිඵල හට ගැනීමට ඉඩ නොලැබෙන ආකාරයකින් හා උසකින් වායුගෝලයට මුදා හැරීම කළ යුතුය. නැතහොත් ගින්දර හෝ සනීකරණ උපකරණයක් තුළින් පිටවීමට සැළැස්විය යුතුය.

11. සෑම බලපත්‍රධාරියෙකුම, තම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ප්‍රමාණවත් කාණු තනවා මැනවින් නඩත්තු කළ යුතු අතර, ඒවා දිනපතා සේදීම කළ යුතුය.

12. සෑම බලපත්‍රධාරියෙකුම, තම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ගෙබිම, යම් අපාරගම්‍ය ද්‍රව්‍යයකින් ඉදිකරවිය යුතු අතර, හොඳ ප්‍රතිසංස්කරණ තත්ත්වයෙන් නඩත්තු කිරීමත්, දිනපතා ශුද්ධ පවිත්‍ර කිරීමත් කළ යුතුය.

13. සෑම බලපත්‍රධාරියෙකුම, ව්‍යාපාර කරගෙන යනු ලබන කාලයේදී, වාර්ෂිකව එම පරිශ්‍රයේ වර්ණ ආලේප කළ යුතුය.

14. සෑම බලපත්‍රධාරියෙකුම, ව්‍යාපාරික කටයුතුවලදී භාවිතා කරනු ලබන උපකරණ හා භාජන ඇතුළු සියලු ආම්පන්න පිරිසිදු කර තබා ගත යුතුය.

15. සෑම බලධාරියෙකුම, ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි කසළ, අතුගා එකතු කරනු ලබන බොල්, රොඩු සමඟ අපතේ ගිය ද්‍රව්‍ය හා අතුරු නිෂ්පාදන, ඒවා තවදුරටත් ව්‍යාපාර කටයුතු වලට වහාම නොයොදවන්නේ නම්, ආවරණය කරන ලද භාජනවල බහා සභාපති විසින් නියම කරන ආකාරයට බැහැර කළ යුතු ය.

16. සෑම බලපත්‍රධාරියෙකුම, වෙනත් ද්‍රව්‍යයක් සේදීම හෝ පෙඟවීම සඳහා භාවිතා කරනු ලබන ටැංකි, දුගඳ හැමීම වැළැක්වීම සඳහා අවශ්‍ය වන පරිදි හිස්කර පවිත්‍ර කළ යුතුය.

17. සෑම බලපත්‍රධාරියෙකුම, යම් ගංඟාවක්, දිය පාරක්, ඇළක්, සොරොව්වක්, ළිඳක්, වැවක් හෝ යම් කාණුවක් යම් අපවිත්‍ර, දුගඳ හමන හෝ පීඩාකාරී ජලය හෝ වෙනත් දියරයක් යැවීමෙන් හෝ ඒ තුළට ගලායාමට සැළැස්වීමෙන් හෝ පීඩාකාරී ද්‍රව්‍යයක් සේදීමෙන් හෝ වෙනත් ආකාරයකින් හෝ එවැනි ගංඟාවක්, දිය පාරක්, ඇළක්, සොරොව්වක්, ළිඳක්, වැවක්, හෝ විවෘත ජල ප්‍රදේශයක් කවර හෝ බැහැර කිරීම් යටතේ අපවිත්‍ර කිරීම නොකළ යුතුය.

18. සභාපතිවරයා විසින් හෝ තත්කාර්ය සඳහා ඔහු විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය පවරන ලද නගර සභාවේ යම් නිලධාරියෙකු විසින් අතුරු ව්‍යවස්ථාවට අදාළ පරිශ්‍රය අතුරු ව්‍යවස්ථාවට අනුකූල ද යන්න පිළිබඳව පරිශ්‍රයට ඇතුළු වී පරීක්ෂාකර බැලීම නීත්‍යානුකූල වන්නේය. තවද බලපත්‍රලාභියා හෝ එහි පාලනය භාර තැනැත්තා එවැනි පරීක්ෂණයක් කිරීම සඳහා ඉඩදිය යුතු වන්නේය.

19. බලපත්‍රලත් පරිශ්‍රයක්, මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් විධිවිධාන වලට අනුකූල නොවන බව පරීක්ෂණයකදී අනාවරණය වූ අවස්ථාවක, යථෝක්ත පරිශ්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූල කරවීම සඳහා කළයුතු කාර්යයන්, නියමිත කාලයක් ඇතුළත දී ඉටුකරන ලෙස, බලපත්‍රධාරියාට ලිඛිතව දැන්වීමට සභාපතිවරයාට බලය ඇත්තේය. තවද, යථෝක්ත දැන්වීමේ විධිවිධාන ප්‍රකාර බලපත්‍රධාරියා විසින් ක්‍රියා කළ යුතුය. එසේ ක්‍රියා නොකරන්නේ නම්, එවැනි අවස්ථාවක බලපත්‍රය අවලංගු කිරීමට සභාපතිවරයාට බලය ඇත්තේය.

20. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් ලබාගැනීම පිණිස යම් තැනැත්තෙකු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයක් තමා වෙත ලැබී දින 30 ක් ඇතුළත, පරිශ්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවලට අනුකූල වන්නේ නම් බලපත්‍රය නිකුත් කිරීම හෝ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන්නේ නම් ඊට හේතු ඉල්ලුම්කරුට දන්වා යැවීම සභාපතිවරයාගේ කාර්යය වන්නේය.

21. සෑම බලපත්‍රලාභියෙකු විසින් ම බලපත්‍රය සහ බලපත්‍රයට අදාළ කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ සේවා නියුක්තිකයන්ගේ නම් සහ ලිපිනයන් සිංහල හා දෙමළ භාෂාවලින් දැක්වෙන ලැයිස්තුවක් බලපත්‍රලාභී ස්ථානයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක එල්ලා තැබීමට සැළැස්විය යුතුය.

22. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ කරනු ලබන සෑම දැන්වීමක්ම අවස්ථෝචිත පරිදි අයිතිකරු හෝ එම ස්ථානයේ භාරකරු වෙත භාර දිය යුතුය. එවැන්නෙකු නොමැති විට බලපත්‍රලත් ස්ථානයේ ප්‍රකටව පෙනෙන පරිදි අලවා තැබිය යුතුය. එවැනි දැන්වීමකට ස්ථානයේ අයිතිකරුගේ හෝ පරිහරණය කරන අයගේ නම සඳහන් කිරීම අවශ්‍ය නොවිය යුතුය.

23. මේ අතුරු ව්‍යවස්ථාවේ කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, 255 වන අධිකාරය වන නගර සභා ආඥා පනතේ 153 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතුය.

24. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,

"සභාව"යන්නෙන් වත්තල මාබෝල නගර සභාව අදහස් වේ.

"සභාපති"යන්නෙන් වත්තල මාබෝල නගරසභාවේ සභාපතිවරයා අදහස් වේ.

"නගර සභා බල ප්‍රදේශය"යන්නෙන් වත්තල මාබෝල නගරසභාව සංස්ථාපනය වූ බල ප්‍රදේශය අදහස් වේ.

"බලය පවරන ලද නගර සභාවේ යම් නිලධාරියෙක්"යන්නෙන් වත්තල මාබෝල නගර සභාවේ සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමට බලය පවරනු ලබන නිලධාරියා හෝ නිලධාරීන් අදහස් වේ.

"බලපත්‍රධාරියා"යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් තැනැත්තෙකු අදහස් කරනු ලැබේ.

"තැනැත්තා" යන්නට සංස්ථාගත කරන ලද හෝ නොකරන ලද පුද්ගල මණ්ඩලයක්ද ඇතුළත් වේ.

"පාලනය භාර තැනැත්තා" යන්නට භාරකරුවෙක්, ආරක්ෂකයෙක්, දේපළ ආරක්ෂකයෙක්, කළමණාකරුවෙක් හෝ යම් තැනැත්තෙක් වෙන්වෙන් යම් ව්‍යාපාරයක සංවිධානය, පාලනය හෝ කළමණාකරණය පැවරී ඇති වෙනත් තැනැත්තෙකුද ඇතුළත් වේ.

25. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨය ප්‍රමුඛ වේ.

## වත්තල මාබෝල නගර සභාවේ
## යන්ත්‍රෝපකරණ කුලියට ලබාදීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

01. වත්තල මාබෝල නගර සභාව විසින් යන්ත්‍රෝපකරණ කුලියට ලබාදීමේ සේවාවක් පවත්වාගෙනයාම සඳහාද ඊට අදාළ ගාස්තු නියම කිරීම ඇතුළු ආනුශංගික කරුණු සඳහා විධිවිධාන සැලසීම පිණිස මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලබයි.

02. මෙම අතුරු ව්‍යවස්ථාව වත්තල මාබෝල නගර සභාවේ යන්ත්‍රෝපකරණ කුලියට ලබාදීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

03. වත්තල මාබෝල නගර සභාව මගින් පවත්වන (මෙහි මින් මතු සේවාවක් වශයෙන් හඳුන්වන) යන්ත්‍රෝපකරණ කුලියට දීමේ සේවාවන් අපේක්ෂා කරන කවර හෝ තැනැත්තෙකු සභාවේ හෝ සභාව විසින් ඒ සඳහා නිශ්චිතව බලය පවරන ලද නිලධාරියෙකු වෙතින් ලබාගත් අයදුම් පත්‍රයක් යටතේ ඒ සඳහා ඉල්ලුම් කළ යුතුය.

04. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන සෑම අයදුම් පත්‍රයක් සඳහා ගාස්තු සභාව විසින් කළින් කල තීරණය ප්‍රකාශයට පත් කළ යුතුය.

05. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සේවාවක් අපේක්ෂා කරමින් ඉදිරිපත් වන ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධයෙන් ඉල්ලුම් කරන දින හා වේලාවන් යටතේ අදාළ සේවාවන් සැපයීමට හැකියාව ඇති බවට ලේකම් විසින් සෑහීමකට පත්වීමෙන් පසු ඊට අදාළ නියමිත ගාස්තුව හා අතිරේකව තැන් පත් කළයුතු තැන්පත් මුදල් අදාළ සේවාව සැපයීම නීත්‍යානුකූලය.

06. ඉහත වගන්තිය යටතේ නියමිත ගාස්තු අයකිරීමට පූර්වයෙන් ලේකම් විසින් පහත කරුණු සැලකිල්ලට ගත යුතුය.

i. අදාළ සේවාව නියමිත දින නියමිත වේලාවට ලබාදීමට සභාවේ කාර්යය කර්තව්‍ය ඉටුකිරීමෙහිලා බාධාවක් නොවන බව,

ii. ඉල්ලුම්කර ඇති සේවාව ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් පහසුකම් ඇති බව,

iii. ඉල්ලුම්කර ඇති දින වේලාවන් යටතේ සේවාවන් පිරිනැමීම සඳහා වෙනත් කවර හෝ තැනැත්තෙක් වෙතින් ගාස්තු අයකිරීමක් සිදු කර නොමැති බව,

iv. ඉල්ලුම් කර ඇති ඉල්ලීම යටතේ නියමිත තොරතුරු නියමිත ආකාරයට ඉල්ලුම්කරු විසින් ඉදිපත් කර ඇති බව.

7. ඉහත 5 වගන්තිය යටතේ අයකරනු ලබන නිශ්චිත ගාස්තු සහ එක් සේවාවකට අදාළව අයකළ යුතු මූල්‍ය තැන්පත් වටිනාකම සභාව විසින් කලින් කල යෝජනා සම්මුතියක් මගින් තීරණය කර ප්‍රකාශයට පත් කළ යුතුය.

8. සේවාව අපේක්ෂාවෙන් ඉදිරිපත් කළ අයදුම් පත්‍රයකට අදාළව සේවා ලබාදීම සඳහා එකඟව ගාස්තු අයකර ඇති අවස්ථාවක පොදු මහජනයාට සුහසිද්ධිය සඳහා හේතුවිය විය හැකි කරුණකට අදාළව ප්‍රමුඛත්වය ලබාදීම හේතු කොටගෙන එකඟ වූ පරිදි, සේවාව ලබාදීම නොහැකි වුවහොත්, ඉල්ලුම්කරු එකඟවන පරිදි හැකිතාක් කඩිනමින් ඊට අදාළ සේවාව ලබාදීම සඳහා ක්‍රියාකළ යුතු වෙයි.

9. ඉල්ලුම්කරු එකඟ වූ පරිදි අදාළ සේවාව ලබාගැනීම ඉල්ලුම්කරු විසින් ප්‍රතික්ෂේප කරන විටක දී හා එකී ප්‍රතික්ෂේප කිරීම සේවාව ලබා දීමට එකඟ වූ දිනට දින දෙකකට පූර්වයෙන් වන විටකදී අයකර ඇති මුදලින් සියයට දහයක් රඳවා ගනිමින් ඉතිරි මුදල ඉල්ලුම්කරු වෙත නිදහස් කළ යුතු අතර, එකඟ වූ දිනට දින තුනකට පසු එවැනි ප්‍රතික්ෂේප කිරීමක දී අයකරන ලද මුදලින් සියයට විසි පහක මුදලක් රඳවාගනිමින් ඉතිරි මුදල නිදහස් කළ යුතුය.

10. සේවාව ලබාදීම සඳහා එකඟව කටයුතු කිරීමේ දී ඉල්ලුම්කරු විසින් සපයන තොරතුරු අනුව සේවාව ලබාදීම සඳහා ලඟාවිය හැකි ප්‍රවේශය ප්‍රමාණවත් නොවීම හෝ ඉල්ලුම්කරුගේ පාලනය යටතේ සම්පූර්ණ විය යුතු වෙනත් කවර හෝ හේතුවක් මත අදාළ සේවාව ලබාදීමට නොහැකි වන විටක ඒ සඳහා අයකරන ලද ගාස්තු නිදහස් නොකළ යුතුය.

11. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සේවාවක් ලබාදීමේදී එකඟ වූ කාලය ඉක්මවා සේවාව ලබාදීමට සිදුවීම හෝ ඉල්ලුම්කරුවන් හෝ ඔහුගේ සහයකයින්ගේ පාලනය යටතේ කිසියම් යන්ත්‍රෝපකරණයකට හෝ වෙනත් උපාංගයකට හානි සිදු වන විට දී ඊට අදාළව සභාවට අය විය යුතු මුදලක් වේ නම්, එය ඉල්ලුම්කරු විසින් ගෙවන ලද තැන්පත් මුදලින් අඩුකර ඉතිරි මුදල සේවාව ඉටුකළ දිනෙන් දින තුනක් ඇතුළත ඉල්ලුම්කරු වෙත නිදහස් කළ යුතුය.

12. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සේවාවන් ඉටු කිරීමේ දී ඉල්ලුම්කරුවන් පෙළඹවීම හෝ අනුදැනුම මත වෙනත් පාර්ශ්වයකට සිදු වන කවර හෝ හානියක් සම්බන්ධයෙන් ඉල්ලුම්කරු වගකිව යුතු වෙයි.

13. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සේවා පැය ගණනය කිරීමේ දී ඒ සඳහා සැළකිය යුතු උපමානයන් සභාව විසින් කළින් කල තීරණය කර ප්‍රකාශයට පත් කළ යුතුය.

14. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවෙහි,

"සභාව" යන්නෙන් වත්තල මාබෝල නගර සභාව අදහස් වේ.

"සභාපති" යන්නෙන් වත්තල මාබෝල නගර සභාවේ සභාපතිවරයා අදහස් වේ.

"බලය පවරනු ලබන නිලධාරියා" යන්නෙන් වත්තල මාබෝල නගර සභාවේ සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියා ද අදහස් වේ.

"යන්ත්‍රෝපකරණ යන්නෙන් ගලි බවුසරයක්, මෝටර් ග්‍රේඩරයක් මාර්ග තලනයක් හෝ තාක්ෂණික කාර්යයක් හෝ කර්මාන්තයක් හෝ ඒ හා සමාන කාර්යයක් වෙනුවෙන් යොදා ගැනෙන කවර හෝ මෙවලමක් අදහස් වේ.

15. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨය ප්‍රමුඛ වේ.

## වත්තල මාබෝල නගර සභාවේ යන්ත්‍රෝපකරණ සේවා පවත්වාගෙන යන ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

01. මෙම අතුරු ව්‍යවස්ථාව වත්තල මාබෝල නගරසභා බල ප්‍රදේශය තුළ යන්ත්‍රෝපකරණ සේවා පවත්වාගෙන යන ස්ථාන විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ ගාස්තු අයකිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස පනවනු ලැබේ.

02. මෙම අතුරු ව්‍යවස්ථාව (මෙහි මින් මතු සභා බල ප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලබන) වත්තල මාබෝල නගර සභා බල ප්‍රදේශය තුළ යන්ත්‍රෝපකරණ සේවා පවත්වාගෙන යන ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

03. සභාපතිවරයා විසින් තත්කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් මත හැර, කිසිම තැනැත්තකු නගර සභා බල ප්‍රදේශයන් තුළ, මෙහි මින් මතු පරිශ්‍රය යනුවෙන් හඳුන්වනු ලබන යන්ත්‍රෝපකරණ සේවා පවත්වාගෙන යන ස්ථානයක් පවත්වාගෙන යාම නොකළ යුතුය.

04. (i) බලපත්‍රයක් සඳහා ඉල්ලුම්කරණ සෑම තැනැත්තෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාව ඇතුලුවූ සභාවෙන් ලබාගත් ඉල්ලුම් පත්‍රයක් යටතේ ඒ සඳහා ඉල්ලුම් කළ යුතුය.

(ii) ඉහත i. උප වගන්තිය යටතේ ඉල්ලුම් පත්‍රයක් සඳහා වන ගාස්තු සභාව විසින් කලින් කල තීරණය කර ප්‍රකාශයට පත්කරන ගාස්තු විය යුතුය.

05. බලපත්‍රයක් සඳහා ගාස්තු සභාව විසින් කලින් කල යෝජනා සම්මුතියක් මඟින් තීරණය කර ප්‍රකාශයට පත්කළ යුතුය.

06. කලින් අවලංගු නොකළහොත් මිස එවැනි සෑම බලපත්‍රයක්ම එය නිකුත් කරන ලද්දේ යම් වර්ෂයක් සඳහාද එම වර්ෂයේ දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා බල පැවැත්විය යුතුය.

07. සේවාව පවත්වාගෙන යන පරිශ්‍රයෙහි සහ එම කාර්යය සඳහා භාවිතයට ගනු ලබන යම් ස්ථිර ගොඩනැගිලි වේ නම් එය සභාපති විසින් එම කාර්යය සඳහා අනුමත සැළැස්මකට අනුකූලව ඉදි කරන ලද ගොඩනැගිලි විය යුතු අතර, පරිශ්‍රය පහත සඳහන් කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස, කිසිදු තැනැත්තෙක් මෙම අතුරු ව්‍යවස්ථාව බලපත්‍රයක් ලබාගැනීමට හිමිකමක් නොලබන්නේය.

(ix) පරිශ්‍රයෙහි යන්ත්‍රෝපකරණ රඳවාගැනීමට, ගබඩා කිරීමට, නවතා තැබීමේ ප්‍රමාණයන් වන පරිදි ඉඩ පහසුකම් තිබිය යුතු අතර, ඊට අදාළ ඉඩ ප්‍රමාණයන් නිශ්චිතව වෙන්කර තිබිය යුතුය.

(x) වාහන නවතා තැබීම සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් තිබිය යුතුය.

(xi) පරිශ්‍රය ප්‍රමාණවත් ජලවහනයක් සිදුවන පරිදි ඉදිකර තිබිය යුතුය.

(xii) පරිශ්‍රයෙහි සනීපාරක්ෂක පහසුකම් ප්‍රමාණවත් පරිදි සපයා තිබිය යුතුය.

(xiii) සැළසුම් අනුමත කිරීමේ දී නියම කරන ප්‍රමාණයට ගිණි ආරක්ෂණ පහසුකම් සපයා තිබිය යුතුය.

(xiv) ප්‍රථමාධාර සඳහා පහසුකම් සපයා තිබිය යුතු ය.

(xv) හදිසි අනතුරු ලේඛනයක් පවත්වාගත යුතු ය.

08. (i) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් සෑම බලපත්‍රධාරියෙකු විසින් ව්‍යාපාරය කරගෙන යාම සඳහා අවශ්‍යවන සියළු ද්‍රව්‍ය දුගඳ හැමීම හෝ වෙනත් පීඩාවක් ඇතිවීම වැළැක්වෙන පරිදි ගබඩාකර තැබිය යුතුය.

(ii) පීඩා ඇති වීමට හෝ දුගඳ හැමීමට ඉඩ ඇති ද්‍රව්‍ය පොදු ස්ථානයක හෝ මංමාවත් ඔස්සේ රැගෙන යාමේදී, කිසිදු පීඩාවක් ඇති නොවන සේ ආවරණය කරන ලද, උරා නොගන්නා භාජනවල දමා රැගෙන යා යුතුය.

(iii) පරිශ්‍රය තුළ යම්කිසි ක්‍රියාවලියකදී විමෝචනය වන පීඩාකාරී ශබ්ද, වාෂ්ප හෝ වායු, ඒවා විහිදී යාමේදී හානිකර හෝ පීඩාකාරී ප්‍රතිඵල හට ගැනීමට ඉඩ නොලැබෙන ආකාරයට වූ පාලනයකින් හෝ උසකින් වායුගෝලයට මුදා හැරීම කළ යුතුය. නැතහොත් ගින්දර හෝ සනීකරණ උපකරණයක් තුළින් පිටවීමට සැලැස්විය යුතුය.

(iv) සෑම බලපත්‍රධාරියෙකුම, යන්ත්‍රෝපකරණ ක්‍රියාත්මක වීම පරීක්ෂා කිරීම පෙරවරු හයේ සිට පස්වරු හය දක්වා කාල සීමාව තුළ විය යුතුය.

(v) තම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ප්‍රමාණවත් කාණු තනවා මැනවින් නඩත්තු කළ යුතු අතර, ඒවා දිනපතා සේදීම කළ යුතුය.

(vi) සෑම බලපත්‍රධාරියෙකුම, තම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ගෙබිම, යම් අපාරගම්‍ය ද්‍රව්‍යයකින් ඉදිකරවිය යුතු අතර, හොඳ ප්‍රතිසංස්කරණ තත්ත්වයෙන් නඩත්තු කිරීමත්, දිනපතා ශුද්ධ පවිත්‍ර කිරීමත් කළ යුතුය.

(vii) පරිශ්‍රයෙහි බැහැර වන අපද්‍රව්‍ය සභාව විසින් ක්‍රියාත්මක කසළ කළමනාකරණ වැඩසටහනට අනුව බැහැර කළ යුතුය.

(viii) පරිශ්‍රයෙහි යන්ත්‍රෝපකරණ අළුත්වැඩියාවක් සිදු නොකළ යුතුය.

(xi) සෑම බලපත්‍රධාරියෙකුම, ව්‍යාපාර කරගෙන යනු ලබන කාලයේදී, වාර්ෂිකව එම පරිශ්‍රයේ වර්ණ ආලේප කළ යුතුය.

(x) සෑම බලපත්‍රධාරියෙකුම, ව්‍යාපාරික කටයුතුවලදී භාවිතා කරනු ලබන උපකරණ හා භාජන ඇතුළු සියළු ආම්පන්න පිරිසිදු කර තබා ගත යුතුය.

(xi) සෑම බලධාරියෙකුම, ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි කසළ, අතුගා එකතු කරනු ලබන බොල්, රොඩු සමඟ අපතේ ගිය ද්‍රව්‍ය හා අතුරු නිෂ්පාදන, ඒවා තවදුරටත් ව්‍යාපාර කටයුතු වලට වහාම නොයොදවන්නේ නම්, ආවරණය කරන ලද භාජනවල බහා දිනපතා නගර සභාවේ නියමය පරිදි ඉවත් කළ යුතුය.

(xii) සෑම බලපත්‍රධාරියෙකුම, යන්ත්‍රෝපකරණ වෙනත් ද්‍රව්‍යයක් සේදීම හෝ පෙඟවීම සඳහා භාවිතා කරනු ලබන ටැංකි, දුගඳ හැමීම වැළැක්වීම සඳහා අවශ්‍ය වන පරිදි හිස්කර පවිත්‍ර කළ යුතුය.

09. සභාපතිවරයා විසින් හෝ තත්කාර්ය සඳහා ඔහු විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය පවරන ලද නගර සභාවේ යම් නිලධාරියෙකු විසින් රාජකාරි වේලාවන් තුළදී, පරිශ්‍රයට ඇතුළු වී පරීක්ෂාකර බැලීම නීත්‍යානුකුල වන අතර, තවද බලපත්‍රලාභියා හෝ එහි පාලනය භාර තැනැත්තා එවැනි වූ පරීක්ෂණයක් කිරීම සඳහා ඉඩදිය යුතු වන්නේය.

10. බලපත්‍රලත් පරිශ්‍රයක්, මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් විධිවිධාන වලට අනුකූල නොවන බව පරීක්ෂණයකදී අනාවරණය වූ අවස්ථාවක, යථෝක්ත පරිශ්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූල කරවීම සඳහා කළයුතු කාර්යයන්, නියමිත කාලයක් ඇතුළතදී ඉටුකරන ලෙස, බලපත්‍රධාරියාට ලිඛිතව දැන්වීමට සභාපතිවරයාට බලය ඇත්තේය. තවද, යථෝක්ත දැන්වීමේ විධිවිධාන ප්‍රකාර බලපත්‍රධාරියා විසින් ක්‍රියා කළ යුතු අතර එසේ ක්‍රියා නොකරන්නේ නම්, එවැනි අවස්ථාවක සභාපතිවරයාට විසින් බලපත්‍රය අවලංගු කිරීම නීත්‍යානුකූල වන්නේය.

11. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ කිසියම් ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් ලබාගැනීම පිණිස යම් තැනැත්තෙකු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයක් තමාවෙත ලැබී දින 30 ක් ඇතුළත, පරිශ්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවලට අනුකූල වන්නේ නම් බලපත්‍රය නිකුත් කිරීම හෝ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන්නේ නම් ඊට හේතු ඉල්ලුම්කරුට දන්වා යැවීම සභාපතිවරයාගේ කාර්යය වන්නේය.

12. සෑම බලපත්‍රලාභියෙකු විසින් ම බලපත්‍රය සහ බලපත්‍රයට අදාළ පරිශ්‍රයෙහි සේවා නියුක්තිකයන්ගේ නම් සහ ලිපිනයන් සිංහල හා දෙමළ භාෂාවලින් දැක්වෙන ලැයිස්තුවක් බලපත්‍රලාභී ස්ථානයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක එල්ලා තැබීමට සැළැස්විය යුතුය.

13. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ කරනු ලබන සෑම දැන්වීමක්ම අවස්ථාවෝචිත පරිදි අයිතිකරු හෝ එම ස්ථානයේ භාරකරු වෙත භාර දිය යුතුය. එවැන්නෙකු නොමැති විට බලපත්‍රලත් ස්ථානයේ ප්‍රකටව පෙනෙන පරිදි අලවා තැබීම ප්‍රමාණවත් විය යුතුය.

14. මේ අතුරු ව්‍යවස්ථාවේ කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, 255 වන අධිකාරය වන නගර සභා ආඥා පනතේ 153 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතුය.

15. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,

"සභාව"යන්නෙන් වත්තල මාබෝල නගර සභාව අදහස් වේ.

"සභාපති"යන්නෙන් වත්තල මාබෝල නගරසභාවේ සභාපතිවරයා අදහස් වේ.

"නගර සභා බල ප්‍රදේශය"යන්නෙන් වත්තල මාබෝල නගරසභාව සංස්ථාපනය වූ බල ප්‍රදේශය අදහස් වේ.

"බලය පවරන ලද නගර සභාවේ යම් නිලධාරියෙක්"යන්නෙන් වත්තල මාබෝල සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමට බලය පවරනු ලබන නිලධාරියා හෝ නිලධාරීන් අදහස් වේ.

"බලපත්‍රධාරියා"යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් තැනැත්තෙකු අදහස් කරනු ලැබේ.

"තැනැත්තා" යන්නට සංස්ථාගත කරන ලද හෝ නොකරන ලද පුද්ගල මණ්ඩලයක්ද ඇතුළත් වේ.

"පාලනය භාර තැනැත්තා" යන්නට භාරකරුවෙක්, ආරක්ෂකයෙක්, දේපළ ආරක්ෂකයෙක්, කළමණාකරුවෙක් හෝ යම් තැනැත්තෙක් වෙන්වෙන් යම් ව්‍යාපාරයක සංවිධානය, පාලනය හෝ කළමණාකරණය පැවරී ඇති වෙනත් තැනැත්තෙකුද ඇතුළත් වේ.

16. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල හා දෙමළ පාඨ අතර අනනුකූලතාවයක් හටගතහොත් සිංහල පාඨය ප්‍රමුඛ විය යුතුය.

## වත්තල මාබෝල නගර සභාවේ ලී බඩු නිෂ්පාදන ආයතනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

01. මෙම අතුරු ව්‍යවස්ථාව වත්තල මාබෝල නගර සභා බල ප්‍රදේශය තුළ ලී බඩු නිෂ්පාදන ආයතනය පවත්වාගෙන යාම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම හා ගාස්තු අය කිරීම සඳහා විධිවිධාන සලසනු පිණිස පනවනු ලැබේ.

02. මෙම අතුරු ව්‍යවස්ථාව වත්තල මාබෝල නගර සභාවේ ලී බඩු නිෂ්පාදන ආයතනය පිළිබඳ අතුරුව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

03. සභාවේ සභාපතිවරයා විසින් තත්කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් මත හැර, කිසිම තැනැත්තකු විසින් (මෙහි මින්මතු බල ප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලබන) වත්තල මාබෝල නගරසභා බල ප්‍රදේශය තුළ, ලී බඩු නිෂ්පාදන ආයතනය පවත්වාගෙන යාම නොකළ යුතු ය.

04. කලින් අවලංගු නොකළහොත් මිස එවැනි සෑම බලපත්‍රයක්ම එය නිකුත් කරන ලද්දේ යම් වර්ෂයක් සඳහාද එම වර්ෂයේ දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා බල පැවැත්විය යුතුය.

05. (i) මෙම අතුරුව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම මෙම අතුරුව්‍යවස්ථාවට අනුකූල වූ සභාවෙන් ලබාගත් ඉල්ලුම්පත්‍රයක් යටතේ ඒ සඳහා ඉල්ලුම් කළ යුතු ය.

(ii) මෙම වගන්තිය යටතේ ඉල්ලුම් පත්‍රයක් සඳහා වන ගාස්තු සභාව විසින් කලින් කළ තීරණය කර ප්‍රකාශයට පත් කරන ගාස්තු විය යුතු ය.

06. මෙම අතුරුව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා අයකරනු ලබන ගාස්තු සභාව විසින් කලින් කළ යෝජනා සම්මුතියක් මඟින් තීරණය කර ප්‍රකාශයට පත්කරනු ලබන ගාස්තු විය යුතු ය.

07. මෙම අතුරුව්‍යවස්ථාව යටතේ කාර්යය සඳහා වන පරිශ්‍රයෙහි එම කාර්යය සඳහා භාවිතයට ගනු ලබන යම් ස්ථිර ගොඩනැගිල්ලක් වේ නම් එය සභාපති විසින් අනුමත සැළැස්මකට අනුකූලව ඉදි කරන ලද ගොඩනැගිලි විය යුතු අතරම, එම පරිශ්‍රය පහත සඳහන් කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස, එහි කිසිදු තැනැත්තෙකු මෙම අතුරුව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලබාගැනීමට හිමිකමක් නොමැත්තේය.

(i) පරිශ්‍රය හොඳ ප්‍රතිසංස්කරණ තත්ත්වයකින් සහ මනා වාතාශ්‍රයක් හා ආලෝකයක් ලැබෙන පරිදි සකස් කර තිබිය යුතු අතර, සෑම කාමරයක් විවෘත කළවිට ගෙබිමේ ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට නොඅඩු ප්‍රමාණයේ ජනෙල් සවිකර තිබිය යුතුය.

(ii) සෑම කාමරයකම බිත්තිවල සෑම කොටසක උස මීටර් 2.14 ට නොඅඩු විය යුතුය අතර, ගඩොල්, කළුගල්, කබොක් හෝ සිමෙන්ති ගල් වලින් සාදා තිබිය යුතුය. බිත්තිවල ඇතුල් පැති අවම වශයෙන් ගෙබිමේ සිට මීටර් 2 ක් උසට සිමෙන්ති බදාම යොදා කපරාදු කොට තිබිය යුතු අතර, ඉතිරි කොටස හුණු බදාම යොදා කපරාදු කොට වර්ණ ආලේප කර තිබිය යුතුය.

(iii) සෑම පියසි කෙළවරකම ගෙබිමේ සිට මීටර් 2 ට වැඩි උසකින් තිබිය යුතුය.

(iv) වහලය යම් ස්ථිර ද්‍රව්‍යයකින් සාදා තිබිය යුතුය.

(v) දැව කර්මාන්ත සියල්ල තීන්ත ආලේප කර තිබිය යුතු ය.

(vi) සම්පූර්ණ ගෙබිම ස්ථිර ද්‍රව්‍යකින් තනවා තිබිය යුතුය.

(vii) පරිශ්‍රය ප්‍රමාණවත් ජලවහනයක් සිදුවන පරිදි ඉදිකර තිබිය යුතුය.

(viii) පරිශ්‍රයෙහි සනීපාරක්ෂක කසළ භාජන සහ ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතුය.

(ix) ප්‍රමාණවත් ගිනි ආරක්ෂණ පහසුකම් සපයා තිබිය යුතු ය.

(x) වාහන නවතා තැබීම සඳහා ප්‍රමාණවත් පහසුකම් තිබිය යුතු ය.

(xi) ප්‍රථමාධාර සඳහා පහසුකම් සපයා තිබිය යුතු ය.

(xii) හදිසි අනතුරු ලේඛනයක් පවත්වාගත යුතු ය.

08. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක්ලත් බලපත්‍රධාරියෙකු විසින්ම,

(Iv) පරිශ්‍රයෙහි එක්රැස්වන අපද්‍රව්‍ය නිසි පරිදි බැහැර කරන තෙක් සංවෘත බහාලුම් යටතේ පීඩාවන් ඇති නොවන පරිදි පවත්වාගත යුතුය.

(Ivi) පරිශ්‍රයෙහි කර්මාන්තයට අදාළ වන ද්‍රව්‍ය අන්තරායකාරී හෝ හානිකර ස්වභාවයකින් තොරව පවත්වාගත යුතු ය.

(Ivii) බලපත්‍රලත් පරිශ්‍ර තුල ජනනය වන සියළුම අපද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස,

(අ) ජෛවභායන අපද්‍රව්‍ය
(ආ) විදුරු
(ඇ) කඩදාසි
(ඈ) පොලිතීන් හෝ ප්ලාස්ටික්
(ඉ) යකඩ හෝ වෙනත් ලෝහ
(ඊ) අන්තරායකර අපද්‍රව්‍ය

වශයෙන් වර්ගීකරණය කර වෙන් වෙන්වූ භාජන යටතේ පවත්වාගත යුතු ය.

(Iviii) ආයතනයෙහි සේවයට යොදවා ඇති සේවකයින් සම්බන්ධයෙන් මුඛ වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා දී තිබිය යුතු අතර, එය සේවයෙහි නියතු අවස්ථාවන්හි පැළඳ සිටිය යුතු ය.

(Iix) සේවයේ නියතු සියළුම සේවකයින් සම්බන්ධයෙන් සෞඛ්‍ය ආරක්ෂණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු ය.

(Ix) පරිශ්‍රයෙන් බැහැර කරන අපද්‍රව්‍ය සභාව විසින් ක්‍රියාත්මක කරන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනට අනුකූලව බැහැර කළ යුතු ය.

(Ixi) නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදා ගැනෙන උපකරණ නිසි නඩත්තුවකින් යුතු ව ආරක්ෂිතව පවත්වාගත යුතු ය.

(Ixii) සෑම මාස හයකටම වරක් පරිශ්‍රයෙහි ගිනි ආරක්ෂණ පියවර පිළිබඳ පිළිගත හැකි ආයතනයකින් යෝජනා වාර්තා ලබා ගත යුතු ය.

9. සෑම බලපත්‍රධාරියෙකුම කර්මාන්තය කරගෙන යාම සඳහා අවශ්‍යවන සියළු ද්‍රව්‍ය හා අවශ්‍ය අනෙකුත් දෑ දුගඳ හැමීම හෝ වෙනත් පීඩාවක් ඇතිවීම වැළැක්වෙන පරිදි ගබඩාකර තැබිය යුතුය.

10. සෑම බලපත්‍රධාරියෙකුම, යම්කිසි නිෂ්පාදන ක්‍රියාවලියකදී විමෝචනය වන පීඩාකාරී ශබ්ද, වාෂ්ප හෝ වායු, ඒවා විහිදී යාමේදී හානිකර හෝ හෝ පීඩාකාරී ප්‍රතිඵල හට ගැනීමට ඉඩ නොලැබෙන ආකාරයකින් හා උසකින් වායුගෝලයට මුදා හැරීම කළ යුතුය. නැතහොත් ගින්දර හෝ සනීකරණ උපකරණයක් තුළින් පිටවීමට සැලැස්විය යුතුය.

11. සෑම බලපත්‍රධාරියෙකුම, තම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ප්‍රමාණවත් කාණු තනවා මැනවින් නඩත්තු කළ යුතු අතර, ඒවා දිනපතා සේදීම කළ යුතුය.

12. සෑම බලපත්‍රධාරියෙකුම, තම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ගෙබිම, යම් අපාරගම්‍ය ද්‍රව්‍යයකින් ඉදිකරවිය යුතු අතර, හොඳ ප්‍රතිසංස්කරණ තත්ත්වයෙන් නඩත්තු කිරීමත්, දිනපතා ශුද්ධ පවිත්‍ර කිරීමත් කළ යුතුය.

13. සෑම බලපත්‍රධාරියෙකුම, ව්‍යාපාර කරගෙන යනු ලබන කාලයේදී, වාර්ෂිකව එම පරිශ්‍රයේ වර්ණ ආලේප කළ යුතුය.

14. සෑම බලපත්‍රධාරියෙකුම, ව්‍යාපාරික කටයුතුවලදී භාවිතා කරනු ලබන උපකරණ හා භාජන ඇතුළු සියලු ආම්පන්න පිරිසිදු කර තබා ගත යුතුය.

15. සෑම බලධාරියෙකු ම, ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි කසළ, අතුගා එකතු කරනු ලබන බොල්, රොඩු සමඟ අපතේ ගිය ද්‍රව්‍ය හා අතුරු නිෂ්පාදන, ඒවා තවදුරටත් ව්‍යාපාර කටයුතු වලට වහාම නොයොදවන්නේ නම්, ආවරණය කරන ලද භාජනවල බහා සභාපති විසින් නියම කරන ආකාරයට බැහැර කළ යුතු ය.

16. සෑම බලපත්‍රධාරියෙකු ම, වෙනත් ද්‍රව්‍යයක් සේදීම හෝ පෙඟවීම සඳහා භාවිතා කරනු ලබන ටැංකි, දුගඳ හැමීම වැළැක්වීම සඳහා අවශ්‍ය වන පරිදි හිස්කර පවිත්‍ර කළ යුතුය.

17. සෑම බලපත්‍රධාරියෙකුම, යම් ගංගාවක්, දිය පාරක්, ඇළක්, සොරොව්වක්, ළිඳක්, වැවක් හෝ යම් කාණුවක් යම් අපවිත්‍ර, දුගඳ හමන හෝ පීඩාකාරී ජලය හෝ වෙනත් දියරයක් යැවීමෙන් හෝ ඒ තුළට ගලායාමට සැලැස්වීමෙන් හෝ පීඩාකාරී ද්‍රව්‍යයක් සේදීමෙන් හෝ වෙනත් ආකාරයකින් හෝ එවැනි ගංගාවක්, දිය පාරක්, ඇළක්, සොරොව්වක්, ළිඳක්, වැවක්, හෝ විවෘත ජල ප්‍රදේශයක් කවර හෝ බැහැර කිරීම් යටතේ අපවිත්‍ර කිරීම නොකළයුතුය.

18. සභාපතිවරයා විසින් හෝ තත්කාර්ය සඳහා ඔහු විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය පවරන ලද නගර සභාවේ යම් නිලධාරියෙකු විසින් අතුරු ව්‍යවස්ථාවට අදාළ පරිශ්‍රය අතුරු ව්‍යවස්ථාවට අනුකූල ද යන්න පිළිබඳව පරිශ්‍රයට ඇතුළු වී පරීක්ෂාකර බැලීම නීත්‍යානුකූල වන්නේය. තවද බලපත්‍රලාභියා හෝ එහි පාලනය භාර තැනැත්තා එවැනි පරීක්ෂණයක් කිරීම සඳහා ඉඩදිය යුතු වන්නේය.

19. බලපත්‍රලත්පරිශ්‍රයක්, මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් විධිවිධාන වලට අනුකූල නොවන බව පරීක්ෂණයකදී අනාවරණය වූ අවස්ථාවක, යථෝක්ත පරිශ්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූල කරවීම සඳහා කළයුතු කාර්යයන්, නියමිත කාලයක් ඇතුළතදී ඉටුකරන ලෙස, බලපත්‍රධාරියාට ලිඛිතව දැන්වීමට සභාපතිවරයාට බලය ඇත්තේය. තවද, යථෝක්ත දැන්වීමේ විධිවිධාන ප්‍රකාර බලපත්‍රධාරියා විසින් ක්‍රියා කළ යුතුය. එසේ ක්‍රියා නොකරන්නේ නම්, එවැනි අවස්ථාවක බලපත්‍රය අවලංගු කිරීමට සභාපතිවරයාට බලය ඇත්තේය.

20. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් ලබාගැනීම පිණිස යම් තැනැත්තෙකු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් තමා වෙතලැබී දින 30 ක් ඇතුළත, පරිශ්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවලට අනුකූල වන්නේ නම් බලපත්‍රය නිකුත් කිරීම හෝ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන්නේ නම් ඊට හේතු ඉල්ලුම්කරුට දන්වා යැවීම සභාපතිවරයාගේ කාර්යය වන්නේය.

21. සෑම බලපත්‍රලාභියෙකු විසින් ම බලපත්‍රය සහ බලපත්‍රයට අදාළ කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ සේවා නියුක්තිකයන්ගේ නම් සහ ලිපිනයන් සිංහල හා දෙමළ භාෂාවලින් දැක්වෙන ලැයිස්තුවක් බලපත්‍රලාභී ස්ථානයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක එල්ලා තැබීමට සැළැස්විය යුතුය.

22. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ කරනු ලබන සෑම දැන්වීමක්ම අවස්ථෝචිත පරිදි අයිතිකරු හෝ එම ස්ථානයේ භාරකරු වෙත භාර දිය යුතුය. එවැන්නෙකු නොමැති විට බලපත්‍රලත් ස්ථානයේ ප්‍රකටව පෙනෙන පරිදි අලවා තැබිය යුතුය. එවැනි දැන්වීමකට ස්ථානයේ අයිතිකරුගේ හෝ පරිහරණය කරන අයගේ නම සඳහන් කිරීම අවශ්‍ය නොවිය යුතුය.

23. මේ අතුරු ව්‍යවස්ථාවේ කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, 255 වන අධිකාරය වන නගර සභා ආඥා පනතේ 153 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතුය.

24. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,

"සභාව" යන්නෙන් වත්තල මාබෝල නගර සභාව අදහස් වේ.

"සභාපති" යන්නෙන් වත්තල මාබෝල නගර සභාවේ සභාපතිවරයා අදහස් වේ.

"නගර සභා බල ප්‍රදේශය"යන්නෙන් වත්තල මාබෝල නගර සභාව සංස්ථාපනය වූ බල ප්‍රදේශය අදහස් වේ.

"බලය පවරන ලද නගර සභාවේ යම් නිලධාරියෙක්"යන්නෙන් වත්තල මාබෝල නගර සභාවේ සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමට බලය පවරනු ලබන නිලධාරියා හෝ නිලධාරීන් අදහස් වේ.

"බලපත්‍රධාරියා"යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් තැනැත්තෙකු අදහස් කරනු ලැබේ.

"තැනැත්තා" යන්නට සංස්ථාගත කරන ලද හෝ නොකරන ලද පුද්ගල මණ්ඩලයක්ද ඇතුළත් වේ.

"පාලනය භාර තැනැත්තා" යන්නට භාරකරුවෙක්, ආරක්ෂකයෙක්, දේපළ ආරක්ෂකයෙක්, කළමණාකරුවෙක් හෝ යම් තැනැත්තෙක් වෙන්වෙන් යම් ව්‍යාපාරයක සංවිධානය, පාලනය හෝ කළමණාකරණය පැවරී ඇති වෙනත් තැනැත්තෙකුද ඇතුළත් වේ.

මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨය ප්‍රමුඛ වේ.

## වත්තල මාබෝල නගර සභාවේ ලේත් මැෂින් වැඩපල හා යකඩ ආශ්‍රිත කර්මාන්ත පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

01. මෙම අතුරු ව්‍යවස්ථාව වත්තල මාබෝල නගර සභා බල ප්‍රදේශය තුළ ලේත් මැෂින් වැඩපල හා යකඩ ආශ්‍රිත කර්මාන්ත පවත්වාගෙන යාම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම හා ගාස්තු අය කිරීම සඳහා විධිවිධාන සලසනු පිණිස පනවනු ලැබේ.

02. මෙම අතුරුව්‍යවස්ථාව වත්තල මාබෝල නගර සභාවේ ලේත් මැෂින් වැඩපල හා යකඩ ආශ්‍රිත කර්මාන්ත පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

03. සභාවේ සභාපතිවරයා විසින් තත්කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් මත හැර, කිසිම තැනැත්තකු විසින් (මෙහි මින්මතු බල ප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලබන) වත්තල මාබෝල නගරසභා බල ප්‍රදේශය තුළ, ලේත් මැෂින්වැඩපල හා යකඩ ආශ්‍රිත කර්මාන්ත පවත්වාගෙන යාම නොකළ යුතු ය.

04. කලින් අවලංගු නොකළහොත් මිස එවැනි සෑම බලපත්‍රයක්ම එය නිකුත් කරන ලද්දේ යම් වර්ෂයක් සඳහාද එම වර්ෂයේ දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා බල පැවැත්විය යුතුය.

05. (i) මෙම අතුරුව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක් ම මෙම අතුරු ව්‍යවස්ථාවට අනුකූල වූ සභාවෙන් ලබාගත් ඉල්ලුම්පත්‍රයක් යටතේ ඒ සඳහා ඉල්ලුම් කළ යුතු ය.

(ii) මෙම වගන්තිය යටතේ ඉල්ලුම් පත්‍රයක් සඳහා වන ගාස්තු සභාව විසින් කලින් කළ තීරණය කර ප්‍රකාශයට පත් කරන ගාස්තු විය යුතු ය.

06. මෙම අතුරුව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා අයකරනු ලබන ගාස්තු සභාව විසින් කලින් කළ යෝජනා සම්මුතියක් මඟින් තීරණය කර ප්‍රකාශයට පත්කරනු ලබන ගාස්තු විය යුතු ය.

07. මෙම අතුරුව්‍යවස්ථාව යටතේ කාර්යය සඳහා වන පරිශ්‍රයෙහි එම කාර්යය සඳහා භාවිතයට ගනු ලබන යම් ස්ථිර ගොඩනැගිල්ලක් වේ නම් එය සභාපති විසින් අනුමත සැළැස්මකට අනුකූලව ඉදි කරන ලද ගොඩනැගිලි විය යුතු අතරම, එම පරිශ්‍රය පහත සඳහන් කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස, එහි කිසිදු තැනැත්තෙකු මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලබාගැනීමට හිමිකමක් නොමැත්තේය.

(i) පරිශ්‍රය හොඳ ප්‍රතිසංස්කරණ තත්ත්වයකින් සහ මනා වාතාශ්‍රයක් හා ආලෝකයක් ලැබෙන පරිදි සකස් කර තිබිය යුතු අතර, සෑම කාමරයක් විවෘත කළ විට ගෙබිමේ ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට නොඅඩු ප්‍රමාණයේ ජනෙල් සවිකර තිබිය යුතුය.

(ii) සෑම කාමරයකම බිත්තිවල සෑම කොටසක උස මීටර් 2.14 ට නොඅඩු විය යුතුය අතර, ගඩොල්, කළුගල්, කබොක් හෝ සිමෙන්ති ගල් වලින් සාදා තිබිය යුතුය. බිත්තිවල ඇතුල් පැති අවම වශයෙන් ගෙබිමේ සිට මීටර් 2 ක් උසට සිමෙන්ති බදාම යොදා කපරාදු කොට තිබිය යුතු අතර, ඉතිරි කොටස හුණු බදාම යොදා කපරාදු කොට වර්ණ ආලේප කර තිබිය යුතුය.

(iii) සෑම පියසි කෙළවරකම ගෙබිමේ සිට මීටර් 2 ට වැඩි උසකින් තිබිය යුතුය.

(iv) වහලය යම් ස්ථිර ද්‍රව්‍යයකින් සාදා තිබිය යුතුය.

(v) දැව කර්මාන්ත සියල්ල තීන්ත අලේප කර තිබිය යුතු ය.

(vi) සම්පූර්ණ ගෙබිම ස්ථිර ද්‍රව්‍යකින් තනවා තිබිය යුතුය.

(vii) පරිශ්‍රය ප්‍රමාණවත් ජලවහනයක් සිදුවන පරිදි ඉදිකර තිබිය යුතුය.

(viii) පරිශ්‍රයෙහි සනීපාරක්ෂක කසළ භාජන සහ ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතුය.

(ix) ප්‍රමාණවත් ගිනි ආරක්ෂණ පහසුකම් සපයා තිබිය යුතු ය.

(x) වාහන නවතා තැබීම සඳහා ප්‍රමාණවත් පහසුකම් තිබිය යුතු ය.

(xi) ප්‍රථමාධාර සඳහා පහසුකම් සපයා තිබිය යුතු ය.

(xii) හදිසි අනතුරු ලේඛනයක් පවත්වාගත යුතු ය.

8. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක්ලත් බලපත්‍රධාරියෙකු විසින් ම,

(Ixiii) පරිශ්‍රයෙහි එක්රැස්වන අපද්‍රව්‍ය නිසි පරිදි බැහැර කරන තෙක් සංවෘත බහාලුම් යටතේ පීඩාවන් ඇති නොවන පරිදි පවත්වාගත යුතුය.

(Ixiv) පරිශ්‍රයෙහි කර්මාන්තයට අදාළ වන ද්‍රව්‍ය අන්තරායකාරී හෝ හානිකර ස්වභාවයකින් තොරව පවත්වාගත යුතු ය.

(Ixv) බලපත්‍රලත් පරිශ්‍ර තුළ ජනනය වන සියළුම අපද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස,

(අ) ජෛවභායන අපද්‍රව්‍ය
(ආ) විදුරු
(ඇ) කඩදාසි
(ඈ) පොලිතීන් හෝ ප්ලාස්ටික්
(ඉ) යකඩ හෝ වෙනත් ලෝහ
(ඊ) අන්තරායකර අපද්‍රව්‍ය

වශයෙන් වර්ගීකරණය කර වෙන් වෙන්වූ භාජන යටතේ පවත්වාගත යුතු ය.

(lxvi) ආයතනයෙහි සේවයට යොදවා ඇති සේවකයින් සම්බන්ධයෙන් මුඛ වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා දී තිබිය යුතු අතර, එය සේවයෙහි නියතු අවස්ථාවන්හි පැළඳ සිටිය යුතු ය.

(Ixvii) සේවයේ නියතු සියලුම සේවකයින් සම්බන්ධයෙන් සෞඛ්‍ය ආරක්ෂණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු ය.

(Ixviii) පරිශ්‍රයෙන් බැහැර කරන අපද්‍රව්‍ය සභාව විසින් ක්‍රියාත්මක කරන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනට අනුකූලව බැහැර කළ යුතු ය.

(Ixix) නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදා ගැනෙන උපකරණ නිසි නඩත්තුවකින් යුතු ව ආරක්ෂිතව පවත්වාගත යුතු ය.

(Ixx) සෑම මාස හයකටම වරක් පරිශ්‍රයෙහි ගිනි ආරක්ෂණ පියවර පිළිබඳ පිළිගත හැකි ආයතනයකින් යෝජනා වාර්තා ලබා ගත යුතු ය.

09. සෑම බලපත්‍රධාරියෙකු ම කර්මාන්තය කරගෙන යාම සඳහා අවශ්‍යවන සියලු ද්‍රව්‍ය හා අවශ්‍ය අනෙකුත් දෑ දුගඳ හැමීම හෝ වෙනත් පීඩාවක් ඇතිවීම වැළැක්වෙන පරිදි ගබඩාකර තැබිය යුතුය.

10. සෑම බලපත්‍රධාරියෙකු ම, යම්කිසි නිෂ්පාදන ක්‍රියාවලියකදී විමෝචනය වන පීඩාකාරී ශබ්ද, වාෂ්ප හෝ වායු, ඒවා විහිදී යාමේදී හානිකර හෝ පීඩාකාරී ප්‍රතිඵල හට ගැනීමට ඉඩ නොලැබෙන ආකාරයකින් හා උසකින් වායුගෝලයට මුදා හැරීම කළ යුතුය. නැතහොත් ගින්දර හෝ සනීකරණ උපකරණයක් තුළින් පිටවීමට සැලැස්විය යුතුය.

11. සෑම බලපත්‍රධාරියෙකුම, තම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ප්‍රමාණවත් කාණු තනවා මැනවින් නඩත්තු කළ යුතු අතර, ඒවා දිනපතා සේදීම කළ යුතුය.

12. සෑම බලපත්‍රධාරියෙකුම, තම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ගෙබිම, යම් අපාරගම්‍ය ද්‍රව්‍යයකින් ඉදිකරවිය යුතු අතර, හොඳ ප්‍රතිසංස්කරණ තත්ත්වයෙන් නඩත්තු කිරීමත්, දිනපතා ශුද්ධ පවිත්‍ර කිරීමත් කළ යුතුය.

13. සෑම බලපත්‍රධාරියෙකුම, ව්‍යාපාර කරගෙන යනු ලබන කාලයේදී, වාර්ෂිකව එම පරිශ්‍රයේ වර්ණ ආලේප කළ යුතුය.

14. සෑම බලපත්‍රධාරියෙකුම, ව්‍යාපාරික කටයුතුවලදී භාවිතා කරනු ලබන උපකරණ හා භාජන ඇතුළු සියළු ආම්පන්න පිරිසිදු කර තබා ගත යුතුය.

15. සෑම බලධාරියෙකුම, ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි කසළ, අතුගා එකතු කරනු ලබන බොල්, රොඩු සමග අපතේ ගිය ද්‍රව්‍ය හා අතුරු නිෂ්පාදන, ඒවා තවදුරටත් ව්‍යාපාර කටයුතු වලට වහාම නොයොදවන්නේ නම්, ආවරණය කරන ලද භාජනවල බහා සභාපති විසින් නියම කරන ආකාරයට බැහැර කළ යුතු ය.

16. සෑම බලපත්‍රධාරියෙකුම, වෙනත් ද්‍රව්‍යයක් සේදීම හෝ පෙඟවීම සඳහා භාවිතා කරනු ලබන ටැංකි, දුගඳ හැමීම වැළැක්වීම සඳහා අවශ්‍ය වන පරිදි හිස්කර පවිත්‍ර කළ යුතුය.

17. සෑම බලපත්‍රධාරියෙකුම, යම් ගංඟාවක්, දිය පාරක්, ඇළක්, සොරොව්වක්, ළිඳක්, වැවක් හෝ යම් කාණුවක් යම් අපවිත්‍ර, දුගඳ හමන හෝ පීඩාකාරී ජලය හෝ වෙනත් දියරයක් යැවීමෙන් හෝ ඒ තුළට ගලායාමට සැලැස්වීමෙන් හෝ පීඩාකාරී ද්‍රව්‍යයක් සේදීමෙන් හෝ වෙනත් ආකාරයකින් හෝ එවැනි ගංඟාවක්, දිය පාරක්, ඇළක්, සොරොව්වක්, ළිඳක්, වැවක්, හෝ විවෘත ජල ප්‍රදේශයක් කවර හෝ බැහැර කිරීම් යටතේ අපවිත්‍ර කිරීම නොකළයුතුය.

18. සභාපතිවරයා විසින් හෝ තත්කාර්ය සඳහා ඔහු විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය පවරන ලද නගර සභාවේ යම් නිලධාරියෙකු විසින් අතුරුව්‍යවස්ථාවට අදාළ පරිශ්‍රය අතුරුව්‍යවස්ථාවට අනුකූල ද යන්න පිළිබඳව පරිශ්‍රයට ඇතුළු වී පරික්ෂාකර බැලීම නීත්‍යානුකූලවන්නේය. තවද බලපත්‍රලාභියා හෝ එහි පාලනය භාර තැනැත්තා එවැනි පරීක්ෂණයක් කිරීම සඳහා ඉඩදිය යුතු වන්නේය.

19. බලපත්‍රලත්පරිශ්‍රයක්, මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් විධිවිධාන වලට අනුකූල නොවන බව පරීක්ෂණයකදී අනාවරණය වූ අවස්ථාවක, යථෝක්ත පරිශ්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූල කරවීම සඳහා කළයුතුකාර්යයන්, නියමිත කාලයක් ඇතුළතදී ඉටුකරන ලෙස, බලපත්‍රධාරියාට ලිඛිතව දැන්වීමට සභාපතිවරයාට බලය ඇත්තේය. තවද, යථෝක්ත දැන්වීමේ විධිවිධාන ප්‍රකාර බලපත්‍රධාරියා විසින් ක්‍රියා කළ යුතුය. එසේ ක්‍රියා නොකරන්නේ නම්, එවැනි අවස්ථාවක බලපත්‍රය අවලංගු කිරීමට සභාපතිවරයාට බලය ඇත්තේය.

20. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් ලබාගැනීම පිණිස යම් තැනැත්තෙකු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයක් තමාවෙත ලැබී දින 30 ක් ඇතුළත, පරිශ්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවලට අනුකූල වන්නේ නම් බලපත්‍රය නිකුත් කිරීම හෝ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන්නේ නම් ඊට හේතු ඉල්ලුම්කරුට දන්වා යැවීම සභාපතිවරයාගේ කාර්යය වන්නේය.

21. සෑම බලපත්‍රලාභියෙකු විසින් ම බලපත්‍රය සහ බලපත්‍රයට අදාළ කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ සේවා නියුක්තිකයන්ගේ නම් සහ ලිපිනයන් සිංහල හා දෙමළ භාෂාවලින් දැක්වෙන ලැයිස්තුවක් බලපත්‍රලාභී ස්ථානයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක එල්ලා තැබීමට සැළැස්වියයුතුය.

22. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ කරනු ලබන සෑම දැන්වීමක්ම අවස්ථෝචිත පරිදි අයිතිකරු හෝ එම ස්ථානයේ භාරකරු වෙත භාර දිය යුතුය. එවැන්නෙකු නොමැති විට බලපත්‍රලත් ස්ථානයේ ප්‍රකටව පෙනෙන පරිදි අලවා තැබිය යුතුය. එවැනි දැන්වීමකට ස්ථානයේ අයිතිකරුගේ හෝ පරිහරණය කරන අයගේ නම සඳහන් කිරීම අවශ්‍ය නොවිය යුතුය.

23. මේ අතුරු ව්‍යවස්ථාවේ කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබුවිට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, 255 වන අධිකාරය වන නගර සභා ආඥා පනතේ 153 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතුය.

24. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,

"සභාව" යන්නෙන් වත්තල මාබෝල නගර සභාව අදහස් වේ.

"සභාපති" යන්නෙන් වත්තල මාබෝල නගර සභාවේ සභාපතිවරයා අදහස් වේ.

"නගර සභා බල ප්‍රදේශය" යන්නෙන් වත්තල මාබෝල නගර සභාව සංස්ථාපනය වූ බල ප්‍රදේශය අදහස් වේ.

"බලය පවරන ලද නගර සභාවේ යම් නිලධාරියෙක්" යන්නෙන් වත්තල මාබෝල නගර සභාවේ සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමට බලය පවරනු ලබන නිලධාරියා හෝ නිලධාරීන් අදහස් වේ.

"බලපත්‍රධාරියා" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් තැනැත්තෙකු අදහස් කරනු ලැබේ.

"තැනැත්තා" යන්නට සංස්ථාගත කරන ලද හෝ නොකරන ලද පුද්ගල මණ්ඩලයක්ද ඇතුළත් වේ.

"පාලනය භාර තැනැත්තා" යන්නට භාරකරුවෙක්, ආරක්ෂකයෙක්, දේපළ ආරක්ෂකයෙක්, කළමණාකරුවෙක් හෝ යම් තැනැත්තෙක් වෙන්වෙන්ව යම් ව්‍යාපාරයක සංවිධානය, පාලනය හෝ කළමණාකරණය පැවරී ඇති වෙනත් තැනැත්තෙකුද ඇතුළත් වේ.

25. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨය ප්‍රමුඛ වේ.

## වත්තල මාබෝල නගර සභාවේ වාහන පින්තාරු හා ටින්කරින් කරන ස්ථානය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

01. මෙම අතුරු ව්‍යවස්ථාව වත්තල මාබෝල නගරසභා බල ප්‍රදේශය තුළ වාහන පින්තාරු හා ටින්කරින් කරන ස්ථාන පවත්වාගෙන යාම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම හා ගාස්තු අය කිරීම සඳහා විධිවිධාන සලසනු පිණිස පනවනු ලැබේ.

02. මෙම අතුරු ව්‍යවස්ථාව වත්තල මාබෝල නගර සභාවේ වාහන පින්තාරු හා ටින්කරින් කරන ස්ථාන පිළිබඳ අතුරුව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

03. සභාවේ සභාපතිවරයා විසින් තත්කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් මත හැර, කිසිම තැනැත්තකු විසින් (මෙහි මින්මතු බල ප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලබන) වත්තල මාබෝල නගරසභා බල ප්‍රදේශය තුළ, වාහන පින්තාරු හා ටින්කරින් කරන ස්ථාන පවත්වාගෙන යාම නොකළ යුතු ය.

04. කලින් අවලංගු නොකළහොත් මිස එවැනි සෑම බලපත්‍රයක්ම එය නිකුත් කරන ලද්දේ යම් වර්ෂයක් සඳහාද එම වර්ෂයේ දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා බල පැවැත්විය යුතුය.

05. (i) මෙම අතුරුව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවට අනුකූල වූ සභාවෙන් ලබාගත් ඉල්ලුම්පත්‍රයක් යටතේ ඒ සඳහා ඉල්ලුම් කළ යුතු ය.

(ii) මෙම වගන්තිය යටතේ ඉල්ලුම් පත්‍රයක් සඳහා වන ගාස්තු සභාව විසින් කලින් කළ තීරණය කර ප්‍රකාශයට පත් කරන ගාස්තු විය යුතු ය.

06. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා අයකරනු ලබන ගාස්තු සභාව විසින් කලින් කළ යෝජනා සම්මුතියක් මඟින් තීරණය කර ප්‍රකාශයට පත් කරනු ලබන ගාස්තු විය යුතු ය.

07. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ කාර්යය සඳහා වන පරිශ්‍රයෙහි එම කාර්යය සඳහා භාවිතයට ගනු ලබන යම් ස්ථිර ගොඩනැගිල්ලක් වේ නම් එය සභාපති විසින් අනුමත සැළැස්මකට අනුකූලව ඉදි කරන ලද ගොඩනැගිලි විය යුතු අතරම, එම පරිශ්‍රය පහත සඳහන් කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස, එහි කිසිදු තැනැත්තෙකු මෙම අතුරුව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලබාගැනීමට හිමිකමක් නොමැත්තේය.

(i) පරිශ්‍රය හොඳ ප්‍රතිසංස්කරණ තත්ත්වයකින් සහ මනා වාතාශ්‍රයක් හා ආලෝකයක් ලැබෙන පරිදි සකස් කර තිබිය යුතු අතර, සෑම කාමරයක් විවෘත කළ විට ගෙබිමේ ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට නොඅඩු ප්‍රමාණයේ ජනෙල් සවිකර තිබිය යුතුය.

(ii) සෑම කාමරයක ම බිත්තිවල සෑම කොටසක උස මීටර් 2.14 ට නොඅඩු විය යුතුය අතර, ගඩොල්, කළුගල්, කබොක් හෝ සිමෙන්ති ගල්වලින් සාදා තිබිය යුතුය. බිත්තිවල ඇතුල් පැති අවම වශයෙන් ගෙබිමේ සිට මීටර් 2 ක් උසට සිමෙන්ති බදාම යොදා කපරාදු කොට තිබිය යුතු අතර, ඉතිරි කොටස හුණු බදාම යොදා කපරාදු කොට වර්ණ ආලේප කර තිබිය යුතුය.

(iii) සෑම පියසි කෙළවරකම ගෙබිමේ සිට මීටර් 2 ට වැඩි උසකින් තිබිය යුතුය.

(iv) වහලය යම් ස්ථිර ද්‍රව්‍යයකින් සාදා තිබිය යුතුය.

(v) දැව කර්මාන්ත සියල්ල තීන්ත අලේප කර තිබිය යුතු ය.

(vi) සම්පූර්ණ ගෙබිම ස්ථිර ද්‍රව්‍යකින් තනවා තිබිය යුතුය.

(vii) පරිශ්‍රය ප්‍රමාණවත් ජලවහනයක් සිදුවන පරිදි ඉදිකර තිබිය යුතුය.

(viii) පරිශ්‍රයෙහි සනීපාරක්ෂක කසළ භාජන සහ ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතුය.

(ix) ප්‍රමාණවත් ගිනි ආරක්ෂණ පහසුකම් සපයා තිබිය යුතු ය.

(x) වාහන නවතා තැබීම සඳහා ප්‍රමාණවත් පහසුකම් තිබිය යුතු ය.

(xi) ප්‍රථමාධාර සඳහා පහසුකම් සපයා තිබිය යුතු ය.

(xii) හදිසි අනතුරු ලේඛනයක් පවත්වාගත යුතු ය.

8. මෙම අතුරුව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් බලපත්‍රධාරියෙකු විසින්ම,

(Ixxi) පරිශ්‍රයෙහි එක්රැස්වන අපද්‍රව්‍ය නිසි පරිදි බැහැර කරන තෙක් සංවෘත බහාලුම් යටතේ පීඩාවන් ඇති නොවන පරිදි පවත්වාගත යුතුය.

(Ixxii) පරිශ්‍රයෙහි කර්මාන්තයට අදාළ වන ද්‍රව්‍ය අන්තරායකාරී හෝ හානිකර ස්වභාවයකින් තොරව පවත්වාගත යුතු ය.

(Ixxiii) බලපත්‍රලත් පරිශ්‍ර තුල ජනනය වන සියළුම අපද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස,

(අ) ජෛවභායන අපද්‍රව්‍ය
(ආ) වීදුරු
(ඇ) කඩදාසි
(ඈ) පොලිතීන් හෝ ප්ලාස්ටික්
(ඉ) යකඩ හෝ වෙනත් ලෝහ
(ඊ) අන්තරායකර අපද්‍රව්‍ය

වශයෙන් වර්ගීකරණය කර වෙන් වෙන්වූ භාජන යටතේ පවත්වාගත යුතු ය.

(Ixxiv) ආයතනයෙහි සේවයට යොදවා ඇති සේවකයින් සම්බන්ධයෙන් මුඛ වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා දී තිබිය යුතු අතර, එය සේවයෙහි නියතු අවස්ථාවන්හි පැළඳ සිටිය යුතු ය.

(Ixxv) සේවයේ නියතු සියළුම සේවකයින් සම්බන්ධයෙන් සෞඛ්‍ය ආරක්ෂණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු ය.

(Ixxvi) පරිශ්‍රයෙන් බැහැර කරන අපද්‍රව්‍ය සභාව විසින් ක්‍රියාත්මක කරන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනට අනුකූලව බැහැර කළ යුතු ය.

(Ixxvii) නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදා ගැනෙන උපකරණ නිසි නඩත්තුවකින් යුතු ව ආරක්ෂිතව පවත්වාගත යුතු ය.

(Ixxviii) සෑම මාස හයකටම වරක් පරිශ්‍රයෙහි ගිනි ආරක්ෂණ පියවර පිළිබඳ පිළිගත හැකි ආයතනයකින් යෝජනා වාර්තා ලබා ගත යුතු ය.

09. සෑම බලපත්‍රධාරියෙකුම කර්මාන්තය කරගෙන යාම සඳහා අවශ්‍යවන සියළු ද්‍රව්‍ය හා අවශ්‍ය අනෙකුත් දෑ දුගඳ හැමීම හෝ වෙනත් පීඩාවක් ඇතිවීම වැළැක්වෙන පරිදි ගබඩාකර තැබිය යුතුය.

10. සෑම බලපත්‍රධාරියෙකුම, යම්කිසි නිෂ්පාදන ක්‍රියාවලියකදී විමෝචනය වන පීඩාකාරී ශබ්ද, වාෂ්ප හෝ වායු, ඒවා විහිදී යාමේදී හානිකර හෝ පීඩාකාරී හෝ ප්‍රතිඵල හට ගැනීමට ඉඩ නොලැබෙන ආකාරයකින් හා උසකින් වායුගෝලයට මුදා හැරීම කළ යුතුය. නැතහොත් ගින්දර හෝ සනීකරණ උපකරණයක් තුළින් පිටවීමට සැලැස්විය යුතුය.

11. සෑම බලපත්‍රධාරියෙකුම, තම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ප්‍රමාණවත් කාණු තනවා මැනවින් නඩත්තු කළ යුතු අතර, ඒවා දිනපතා සේදීම කළ යුතුය.

12. සෑම බලපත්‍රධාරියෙකුම, තම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ගෙබිම, යම් අපාරගම්‍ය ද්‍රව්‍යයකින් ඉදිකරවිය යුතු අතර, හොඳ ප්‍රතිසංස්කරණ තත්ත්වයෙන් නඩත්තු කිරීමත්, දිනපතා ශුද්ධ පවිත්‍ර කිරීමත් කළ යුතුය.

13. සෑම බලපත්‍රධාරියෙකුම, ව්‍යාපාර කරගෙන යනු ලබන කාලයේදී, වාර්ෂිකව එම පරිශ්‍රයේ වර්ණ ආලේප කළ යුතුය.

14. සෑම බලපත්‍රධාරියෙකුම, ව්‍යාපාරික කටයුතුවලදී භාවිතා කරනු ලබන උපකරණ හා භාජන ඇතුළු සියළු ආම්පන්න පිරිසිදු කර තබා ගත යුතුය.

15. සෑම බලධාරියෙකුම, ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි කසළ, අතුගා එකතු කරනු ලබන බොල්, රොඩු සමඟ අපතේ ගිය ද්‍රව්‍ය හා අතුරු නිෂ්පාදන, ඒවා තවදුරටත් ව්‍යාපාර කටයුතු වලට වහාම නොයොදවන්නේ නම්, ආවරණය කරන ලද භාජනවල බහා සභාපති විසින් නියම කරන ආකාරයට බැහැර කළ යුතු ය.

16. සෑම බලපත්‍රධාරියෙකුම, වෙනත් ද්‍රව්‍යයක් සේදීම හෝ පෙඟවීම සඳහා භාවිතා කරනු ලබන ටැංකි, දුගඳ හැමීම වැළැක්වීම සඳහා අවශ්‍ය වන පරිදි හිස්කර පවිත්‍ර කළ යුතුය.

17. සෑම බලපත්‍රධාරියෙකුම, යම් ගංඟාවක්, දිය පාරක්, ඇළක්, සොරොව්වක්, ළිඳක්, වැවක් හෝ යම් කාණුවක් යම් අපවිත්‍ර, දුගඳ හමන හෝ පීඩාකාරී ජලය හෝ වෙනත් දියරයක් යැවීමෙන් හෝ ඒ තුළට ගලායාමට සැලැස්වීමෙන් හෝ පීඩාකාරී ද්‍රව්‍යයක් සේදීමෙන් හෝ වෙනත් ආකාරයකින් හෝ එවැනි ගංඟාවක්, දිය පාරක්, ඇළක්, සොරොව්වක්, ළිඳක්, වැවක්, හෝ විවෘත ජල ප්‍රදේශයක් කවර හෝ බැහැර කිරීම් යටතේ අපවිත්‍ර කිරීම නොකළයුතුය.

18. සභාපතිවරයා විසින් හෝ තත්කාර්ය සඳහා ඔහු විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය පවරන ලද නගර සභාවේ යම් නිලධාරියෙකු විසින් අතුරුව්‍යවස්ථාවට අදාළ පරිශ්‍රය අතුරුව්‍යවස්ථාවට අනුකූල ද යන්න පිළිබඳව පරිශ්‍රයට ඇතුළු වී පරීක්ෂාකර බැලීම නීත්‍යානුකූල වන්නේය. තවද බලපත්‍රලාභියා හෝ එහි පාලනය භාර තැනැත්තා එවැනි පරීක්ෂණයක් කිරීම සඳහා ඉඩදිය යුතු වන්නේය.

19. බලපත්‍රලත් පරිශ්‍රයක්, මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් විධිවිධාන වලට අනුකූල නොවන බව පරීක්ෂණයකදී අනාවරණය වූ අවස්ථාවක, යථෝක්ත පරිශ්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූල කරවීම සඳහා කළයුතු කාර්යයන්, නියමිත කාලයක් ඇතුළතදී ඉටුකරන ලෙස, බලපත්‍රධාරියාට ලිඛිතව දැන්වීමට සභාපතිවරයාට බලය ඇත්තේය. තවද, යථෝක්ත දැන්වීමේ විධිවිධාන ප්‍රකාර බලපත්‍රධාරියා විසින් ක්‍රියා කළ යුතුය. එසේ ක්‍රියා නොකරන්නේ නම්, එවැනි අවස්ථාවක බලපත්‍රය අවලංගු කිරීමට සභාපතිවරයාට බලය ඇත්තේය.

20. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් ලබාගැනීම පිණිස යම් තැනැත්තෙකු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයක් තමාවෙත ලැබී දින 30 ක් ඇතුළත, පරිශ්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවලට අනුකූල වන්නේ නම් බලපත්‍රය නිකුත් කිරීම හෝ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන්නේ නම් ඊට හේතු ඉල්ලුම්කරුට දන්වා යැවීම සභාපතිවරයාගේ කාර්යය වන්නේය.

21. සෑම බලපත්‍රලාභියෙකු විසින් ම බලපත්‍රය සහ බලපත්‍රයට අදාළ කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ සේවා නියුක්තිකයන්ගේ නම් සහ ලිපිනයන් සිංහල හා දෙමළ භාෂාවලින් දැක්වෙන ලැයිස්තුවක් බලපත්‍රලාභි ස්ථානයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක එල්ලා තැබීමට සැළැස්විය යුතුය.

22. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ කරනු ලබන සෑම දැන්වීමක්ම අවස්ථෝචිත පරිදි අයිතිකරු හෝ එම ස්ථානයේ භාරකරු වෙත භාර දිය යුතුය. එවැන්නෙකු නොමැති විට බලපත්‍රලත් ස්ථානයේ ප්‍රකටව පෙනෙන පරිදි අලවා තැබිය යුතුය. එවැනි දැන්වීමකට ස්ථානයේ අයිතිකරුගේ හෝ පරිහරණය කරන අයගේ නම සඳහන් කිරීම අවශ්‍ය නොවිය යුතුය.

23. මේ අතුරු ව්‍යවස්ථාවේ කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබුවිට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙළින්, 255 වන අධිකාරය වන නගර සභා ආඥා පනතේ 153 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතුය.

24. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,

"සභාව" යන්නෙන් වත්තල මාබෝල නගර සභාව අදහස් වේ.

"සභාපති" යන්නෙන් වත්තල මාබෝල නගරසභාවේ සභාපතිවරයා අදහස් වේ.

"නගර සභා බල ප්‍රදේශය" යන්නෙන් වත්තල මාබෝල නගර සභාව සංස්ථාපනය වූ බල ප්‍රදේශය අදහස් වේ.

"බලය පවරන ලද නගර සභාවේ යම් නිලධාරියෙක්" යන්නෙන් වත්තල මාබෝල නගර සභාවේ සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමට බලය පවරනු ලබන නිලධාරියා හෝ නිලධාරීන් අදහස් වේ.

"බලපත්‍රධාරියා" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් තැනැත්තෙකු අදහස් කරනු ලැබේ.

"තැනැත්තා" යන්නට සංස්ථාගත කරන ලද හෝ නොකරන ලද පුද්ගල මණ්ඩලයක්ද ඇතුළත් වේ.

"පාලනය භාර තැනැත්තා" යන්නට භාරකරුවෙක්, ආරක්ෂකයෙක්, දේපළ ආරක්ෂකයෙක්, කළමණාකරුවෙක් හෝ යම් තැනැත්තෙක් වෙන්වෙන් යම් ව්‍යාපාරයක සංවිධානය, පාලනය හෝ කළමණාකරණය පැවරී ඇති වෙනත් තැනැත්තෙකුද ඇතුළත් වේ.

25. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨය ප්‍රමුඛ වේ.

06-529

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.